		181-270	3,500 00	4,000 00
		271-450	4,500 00	6,000 00
		451-675	5,500 00	8,000 00
		676-900	6,500 00	10,000 00
		901-1225	7,500 00	12,000 00
		1225 ට වැඩි	7,500 00	12,000 00
			ව.මී. 1226 ඉක්මවීමෙන් පසු සෑම ව.මී. 90 ක් සඳහාම රු. 1,000 බැගින්	ව.මී. 1126 ඉක්මවීමෙන් පසු සෑම ව.මී. 90 ක් සඳහාම රු. 1,250 බැගින්
(iv) මායිම් තාප්ප / ආරක්ෂක බැම් ඉදිකිරීම		iii. නේවාසික දික් මීටර් 1 ක් සඳහා ගාස්තුව		වාණිජ හා වෙනත් වර්ග දික් මීටර් 1 ක් සඳහා
ගොඩනැගිලි සීමාවෙන් පිටත		රු. 300 00		රු. 400 00
ගොඩනැගිලි සීමාව තුළ		රු. 500 00		රු. 600 00
(v) ඉඩම් / කුඹුරු ගොඩකිරීම		iv. ව.මී. 150 ට අඩු රු. 1,500. 00 ක් සහ එයට වැඩි සෑම ව.මී. 150 කට රු. 1,000 බැගින්		
(vi) දුරකථන කුළුණු / ඇන්ටනා කුළුණු ඉදි කිරීම		v. උස මීටර් 5-20 දක්වා රු. 20,000 ක් සහ වැඩි වන සෑම මීටර් එකකටම රු. 100 බැගින්		
(vii) විශේෂ ව්‍යාපෘති සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම		vi. රුපියල් මිලියන 5 කට රු. 5,000 සහ වැඩි වන සෑම රුපියල් මිලියන එකකට රු. 100 බැගින්		

		පෙරසැරි ගාස්තු :
		i. ගෙබිම් ප්‍රමාණය (වර්ග මීටර්) රු. ශත
		45 ට අඩු 500 00
		45-90 1,000 00
		91-180 1,250 00
		181-270 1,500 00
		271-450 1,750 00
		451-675 2,000 00
		676-900 2,250 00
		900 ට වැඩි වර්ග මීටර් 901 ට වැඩිවන එක් එක් වර්ග මීටර් 90 සඳහා රු. 500 බැගින්
3. මූලික සැලසුම් නිරාකරණය අනුමැතිය	"ඇ"	
		පෙරසැරි ගාස්තු :
(i) ඉඩම් අනුබෙදුම් සඳහා		i. වර්ග මීටර් 1000 ට අඩු ඉඩම් සඳහා රු. 2,000
		වර්ග මීටර් 1001-5000 දක්වා රු. 5,000
		වර්ග මීටර් 5001-10000 දක්වා රු. 10,000
		10000 සිට වැඩි වන සෑම වර්ග මීටර් 1000 කටම රු. 1,000 බැගින්
(ii) ගොඩනැගිලි ඉදිකිරීම / අළුතින් එකතු කිරීම / නැවත ඉදිකිරීම	i ii "ඇ"	නේවාසික / වාණිජ හා වෙනත් රු. 2,000 / රු. 5,000 රු. 1,500 / රු. 3,000 ව.මී. 150 ට අඩු ඉඩම් සඳහා රු. 2,500 ව.මී. 151 සිට 300 දක්වා රු. 5,000
(iii) මායිම් තාප්ප/ආරක්ෂක බැමි ඉදිකිරීම	"ඇ"	ව.මී. 301 ට වැඩිවන සෑම ව.මී. 150 කටම රු. 3,000 බැගින්
(iv) ඉඩම්/කුඹුරු ගොඩකිරීම සඳහා	"ඇ"	i. උස මීටර් 5-20 දක්වා රු. 20,000 උස මීටර් 20 ට වැඩි සෑම මීටර් 1 ක් සඳහාම රු. 100 බැගින්
(v) දුරකතන/විදුලි සංදේශ කුළුණු	"ඇ"	
(vi) විශේෂ සංවර්ධන ව්‍යාපෘති	"ඇ"	i. කුඩා පරිමාණ රු. මිලියන 5 ට අඩු වන ව්‍යාපෘති රු. 10,000 මධ්‍යම පරිමාණ රු. මිලියන 5-50 අතර ව්‍යාපෘති රු. 5,000 මහා පරිමාණ රුපියල් මිලියන 50 ට වැඩි ව්‍යාපෘති රු. 150,000
4. අනුකූලතා සහතික නිකුත් කිරීම (සෑම ඉදිකිරීමක් / සංවර්ධනයක් සඳහාම අනුකූලතා සහතිකය ලබා ගත යුතුය)	"ඇ"	අනුකූලතා සහතිකය ප්‍රදානය කිරීමේ ගාස්තු
(i) ඉඩම් අනුබෙදුම්		i. පළමු බිම් කොටසකට රු. 1,000 ක් සහ ඊට වැඩිවන සෑම බිම් කට්ටියකටම රු. 500 බැගින්
(ii) නේවාසික ඉදිකිරීම්		ii. ව.මී. 300 ට අඩු රු. 3,000 සහ ඊට වැඩිවන සෑම ව.මී. 1 කට රු. 10 බැගින්
වාණිජ හා වෙනත් ඉදිකිරීම්		ව.මී. 100 ට අඩු රු. 3,000 ක් සහ ඊට වැඩිවන සෑම ව.මී. 1 කම රු. 20 බැගින්

(iii) මායිම් තාප්ප/ආරක්ෂක බැම් ඉදිකිරීම	iii. පළමු දික් මීටර 100 සඳහා රු. 1,000 ක් සහ ඊට වැඩිවන සෑම මීටර් 1කටම රු. 10 බැගින්
(iv) ඉඩම්/කුඹුරු ගොඩකිරීම	iv. ව.මී. 150 ට අඩු රු. 3,000 ක් සහ ඊට වැඩිවන සෑම ව.මී. 1 කට රු. 20 බැගින්
(v) දුරකථන, විදුලි සංදේශ කුළුණු	v. උස මීටර් 5 සිට 20 දක්වා රු. 2,000 සහ ඊට වැඩිවන සෑම මීටර් 1 කට රු. 100 බැගින්
(vi) විශේෂ ව්‍යාපෘති	vi. කුඩා පරිමාණ සඳහා රු. 5,000 මධ්‍යම පරිමාණ සඳහා රු. 10,000 මහා පරිමාණ සඳහා රු. 20,000
5. මෝටර් රථ වාහන නවතා තැබීමේ ස්ථාන (නා.සං.අධිකාරි නියෝග යටතේ සංවර්ධන ස්ථානය තුළ නියමකර ඇති නමුත් සපයා නැති එක් මෝටර් රථයක් නවතා තබන ස්ථාන සඳහා සේවා ගාස්තු	සේවා ගාස්තු : සියළුම වාහන සඳහා රු. 25,000
(i) කොළඹ මහ නගර සභාව (ii) වෙනත් මහ නගර සභාව (iii) නගර සභා ප්‍රාදේශීය සභාව	ආවරණ අනුමැතිය දීම සඳහා ගාස්තු : එක් එක් බිම් කොටස සඳහා රු. 750 ක ගාස්තුවක්
6. ආවරණ අනුමැතිය ලබාදීම	
(i) නිසි බලපත්‍රයක් නොමැතිව ඉඩම් අනුබෙදුම් කිරීම	

(ii) නිසි සංවර්ධන බලපත්‍රයකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීම / කොටස් එකතු කිරීම / නැවත ඉදිකිරීම	නේවාසික වර්ග මීටර් 1 ක් සඳහා ගාස්තු රු. 200	වාණිජ හා වෙනත් ව.මී. 1 සඳහා ගාස්තු රු. 500
ඉදිකිරීමේ අදියර : * අත්තිකාරම් වැඩ පමණක් (කයිරු මට්ටම) සම්පූර්ණකොට ඇතිවිට * වහල මට්ටම දක්වා (වහලය රහිතව) ඉදිකොට ඇති විට * වහලය ඇතුළුව ඉදිකොට ඇති විට * සම්පූර්ණයෙන් ඉදිකොට ඇති විට	 රු. 300 රු. 400 රු. 500	 රු. 1,000 රු. 1,500 රු. 2,000
(iii) මායිම් තාප්ප/ආරක්ෂිත බැම්ම ඉදිකිරීම		
(iv) ඉඩම් / කුඹුරු ගොඩකිරීම සඳහා	රු. 400	රු. 400
(v) දුරකතන/විදුලි සංදේශ කුළුණු		
(vi) විශේෂ සංවර්ධන ව්‍යාපෘති	සෑම වර්ග මීටර් 150 කට රු. 5,000 බැගින් උස සෑම මීටර් 5 කට රු. 10,000 බැගින්	
(vii) අනුකූලතා සහතිකය නොමැතිව පදිංචිවීම / භාවිතා කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම	සෑම මිලියන 05 කටම රු. 10,000 බැගින් එක් දිනකට රු. 50 බැගින්	

මාතර ප්‍රාදේශීය සභාව

ප්‍රචාරක දැන්වීම් හා දෘෂ්‍ය පරිසර හා වෙනත් බදු පැනවීම - 2020 වර්ෂය

මාතර ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ සැප්තැම්බර් මස 06 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 05:1(xi) යටතේ පහත දැක්වෙන යෝජනාව ඒකමතිකව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. කේ. විමල් ප්‍රියජනක,
සභාපති,
මාතර ප්‍රාදේශීය සභාව.

2019 අගෝස්තු මස 06 වැනි දින,
මාතර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 (xxx) වගන්තිය ප්‍රකාර අමාත්‍යවරයා විසින් 1988.08.23 වැනි දින හා අංක 520/7 දරන *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද 2008.12.05 වැනි දින අංක 1579 *ගැසට් නිවේදන* මගින් මාතර ප්‍රාදේශීය සභාව විසින් වැළඳ ගනු ලැබූ 39 ප්‍රචාරක දැන්වීම් හා දෘෂ්‍ය පරිසර අතුරු ව්‍යවස්ථාවේ 3 (උ) ප්‍රකාරව පහත උපලේඛනය සඳහන් පරිදි ගාස්තු 2020.01.01 වැනි දින සිට අයකළ යුතුයැයි මාතර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

01. වෙළඳ ප්‍රචාරක දැන්වීම් පුවරුවක් සඳහා වසර තුළ වර්ග අඩියකට	රු. 75.00 ක් ද
02. බැනර් ප්‍රදර්ශනය සඳහා දිනකට හෝ උපරිම මාසයක කාල සීමාවකට වර්ග අඩියකට	රු. 50.00 ක් ද
03. වෙනත් ප්‍රචාරක දැන්වීම් පුවරුවක් සඳහා	රු. 25.00 ක් ද

12 - 631/12

මාතර ප්‍රාදේශීය සභාව

2020 වර්ෂයට තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත යටතේ සේවා ගාස්තු අය කිරීම

මාතර ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ සැප්තැම්බර් මස 06 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 05:1(xii) යටතේ පහත දැක්වෙන යෝජනාව ඒකමතිකව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. කේ. විමල් ප්‍රියජනක,
සභාපති,
මාතර ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 06 වැනි දින,
මාතර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත යටතේ 2020 වර්ෂය සඳහා තොරතුරු සැපයීමේදී පහත සඳහන් පරිදි ගාස්තු අයකිරීමට මාතර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

01. A4 ප්‍රමාණයේ ඡායා පිටපත්	තනි පැත්තට	රු. 02 00
	දෙපැත්ත	රු. 04 00
(ඡායා පිටපත් 04 ක් දක්වා ගාස්තු අය නොකෙරේ)		
02. A4 ප්‍රමාණයේ මුද්‍රිත පිටපත්	තනි පැත්තට	රු. 04 00
	දෙපැත්ත	රු. 08 00
(මුද්‍රිත පිටපත් 04 ක් දක්වා ගාස්තු අය නොකෙරේ)		

03. A3 සහ ලීගල් ප්‍රමාණයේ පිටපත් තනි පැත්තට රු. 04 00
දෙපැත්ත රු. 08 00

04. විද්‍යුත් උපාංග පුරවැසියා සපයන විට 1 ක් සඳහා රු. 20 00
ආයතනය විසින් සපයන විට සත්‍ය වියදම් අය කෙරේ.

05. ලියවිල්ලක් හෝ ඉදිකිරීමක් පරීක්ෂාවට ඉල්ලන්නේ නම් පැය 1 ක් සඳහා රු. 50 00
(පැය 1 කට වැඩි කාලයක් නම් පළමු පැය නොමිලේ)

06. සාම්පල් පරීක්ෂාවට සත්‍ය වියදම අය කරනු ලැබේ.

මෙම ගාස්තු ආදායම් ගිණුම්වල විවිධ ලැබීම් ශීර්ෂයන්ට බැර කරන අතර ප්‍රතිපූර්ණ කිරීමේ විවිධ ශීර්ෂයන්ට හර කරනු ලැබේ.

12 - 631/13

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2020 වර්ෂයේ ඔක්තෝබර් මස විසි හතර වන දින පවත්වන ලද සභා රැස්වීමේදී යෝජනා අංක 05-18 යටතේ පහත උප ලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බද්ද මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 දින වලින් අවසන් සෑම කාර්තුවක් තුල දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ගෙවනු ලබේ.

ඕ. ජී. රෝහණ බණ්ඩාර,
සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 29 වැනි දින,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

උපලේඛනය

“1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 146 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයේදී බලාත්මක කරන ලද සත්‍යෝක්ෂණය කිරීම 2020 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී පනතේ 134 වගන්තියේ (3) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වුවද ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද ස්ථිර හෝ නීතිපතා ගොවිතැනක් යටතේ වූ,

(අ) හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන්ම එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක් මත 2020 වර්ෂය සඳහා රු. 10.00 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

(ආ) ඉහත කී පනතේ 134 වන වගන්තියේ (3) වන උප වගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යතුමා විසින් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (21) වන කොටසේ 1989.02.03 වැනි දිනැති *ගැසට් පත්‍රය* ප්‍රකාශයට පත්කර ඇති හෙයින් හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු වූ සෑම ඉඩමක් මත 2020 වර්ෂය සඳහා රු. 50.00 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට සහ,

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උප වගන්තියේ විධිවිධානය යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දින වලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධානය කළ යුතු යැයි පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.''

12 - 713/1

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා වරිපනම් පැනවීම

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස විසි හතර වන දින පවත්වන ලද සභා රැස්වීමේදී යෝජනා අංක 05-18 යටතේ පහත උප ලේඛනයේ දක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 දින වලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2020 ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙක් සියයට දහයක (10%) ක වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාල වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

ඕ. ජී. රෝහණ බණ්ඩාර,
සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 29 වැනි දින,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

උපලේඛනය

''1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත් වල 2011 වර්ෂයේ වාර්ෂික තක්සේරු වටිනාකම 2020 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තියේ ලැබී ඇති බලතල ප්‍රකාරව ඉහත කී වාර්ෂික වටිනාකම්න්

1. බව්වාගම යන කොට්ඨාසවල පිහිටි සෑම නිශ්චල දේපලක් මතම සියයට පහක (5%) වරිපනමක්ද
2. කඩියන්ලෙන යන කොට්ඨාසවල පිහිටි සෑම නිශ්චල දේපලක් මතම සියයට අටක (8%) වරිපනමක්ද

2020 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් සහ

ඒ වරිපනම, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උප වගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දින වලින් අවසන් වන කාර්තු හතර තුළ දී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.''

12 - 713/2

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස විසි හතර වන දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී යෝජනා අංක 05-18 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද, ඒ වර්ෂයේ මාර්තු 31 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

ඕ. ජී. රෝහණ බණ්ඩාර,
සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 29 වැනි දින,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ (1) වන උප වගන්තියේ ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවෙන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2020 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ 1 තීරුවේ නිරූපිත යම් විෂයාංකයකම සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්ද 2020 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තකු එකී ව්‍යාපාර බද්ද 2020 වර්ෂයේ මාර්තු මස 31 වන දිනට පෙර පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු යැයි පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය."

උපලේඛනය

	I වන තීරුව වර්ෂය සඳහා ව්‍යාපාරයේ වෘත්තීය ආදායම	*II* වන තීරුව අය කිරීමට තීරණය කළ බද්ද රු. ශත
01.	රු. 6,000 නොයික්මවන අවස්ථාවක	කිසිවක් නොමැත
02.	රු. 6,000 සිට 12,000 දක්වා	90 0
03.	රු. 12,001 සිට 18,000 දක්වා	180 0
04.	රු. 18,001 සිට 75,000 දක්වා	360 0
05.	රු. 75,001 සිට 150,000 දක්වා	1,200 0
06.	රු. 150,000 වැඩි	3,000 0

12-713/3

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ඇතැම් ඉඩම් විකිණීම මත බදු

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස විසි හතර වන දින පවත්වන ලද මහා සභාවේ යෝජනා අංක 05 - 18 යටතේ සභා සම්මත වූ යෝජනාව අනුව 2020 වර්ෂයට අදාළව ඇතැම් ඉඩම් විකිණීම මත බදු අය කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මෙයින් දක්වමි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය යටතේ පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු, තැරැව්කරුවෙකු හෝ ඔහුගේ අනු නියෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන් ආකාරයෙන් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලෙන් සියයට එකක (1%) සමාන බද්දක් 2020 වර්ෂය සඳහා වහා අය කළ යුතු බවටත් එකී බද්ද විකිණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ ඔහුගේ සේවකයාගේ

අනු නියෝජිතයා විසින් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවට ගෙවියය යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඕ. ජී. රෝහණ බණ්ඩාර,
සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 29 වැනි දින,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12-713/4

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

සුනඛයින් ලියාපදිංචි කිරීම - 2020 වර්ෂය

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ (477 වැනි අධිකාරිය) 4 ඡේදයේ සඳහන් ප්‍රකාරව, 2019.10.24 වැනි දින පැවති මහා සභාවේ යෝජනා අංක 5-18 යටතේ සභා සම්මත වූ යෝජනාව අනුව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ තබාගෙන සිටින සෑම බල්ලෙකු වෙනුවෙන් රු. 10.00 බැගින් ද, බැල්ලියක් සඳහා රු. 7.50 බැගින් ද, ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් 2020 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, එකී ගාස්තුව 2020 වර්ෂයට ගෙවිය යුතු බවත්, මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඕ. ජී. රෝහණ බණ්ඩාර,
සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 29 වැනි දින,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12-713/5

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථා යටතේ 2020 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස විසි හතර වන දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී යෝජනා අංක 05-18 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව, කිසියම් අතුරු ව්‍යාවස්ථාවක් යටතේ පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා 2020 වර්ෂයේ දී පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් මත 2020 මාර්තු 31 වන දිනට ප්‍රථම පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව ද තව දුරටත් දන්වමි.

ඕ. ජී. රෝහණ බණ්ඩාර,
සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 29 වැනි දින,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යාවස්ථාවක් යටතේ හෝ පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති අතුරු ව්‍යවස්ථාවක් යටතේ පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2020 වර්ෂය තුළ දී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු 149 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ II වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත්,

එකී උපලේඛනයේ සඳහන් කර්මාන්තය ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝ එය විසින් අනුමත කර ඇති හෝ පිළිගෙන ඇති හෝටලයක් හෝ ආපන ශාලාවක් හෝ නවාතැන් පොළක්වන විට, එකී හෝටලයෙන් හෝ ආපන ශාලාවෙන් හෝ නවාතැන් පොළෙන් පසුගිය වර්ෂයේ ලත් ලැබීම්වලින් සියයට එකක (1%) කට සමාන ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.''

උපලේඛනය

අනු. අංකය	*බලපත්‍රයේ ස්වභාවය*	*වාර්ෂික වටිනාකම රු. 750 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 750 සිට රු. 1,500 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 1,500 වැඩි රු. ශත*
1.	හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	බත්කඩ, ආපන ශාලා, තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	ලැගුම් හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	සත්ත්ව ගොවිපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6.	කොණ්ඩා සැකසීමේ සැලුන්හල් හෝ බාබර් සාප්පුවක් හෝ බියුටි සෙන්ටර් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	කිරිපිටි හෝ කිරි වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8.	මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9.	ජලය බෝතල් කිරීමේ ස්ථානයක් හෝ සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	ආහාර ද්‍රව්‍ය වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	මස් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	ඌරන් ඇති කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
අප්‍රසන්න හා අන්තරාදයක ව්‍යාපාර :				
1.	තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි කිලෝග්‍රෑම් 750ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම	500 0	750 0	1,000 0
2.	මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
3.	මුද්‍රණාලයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
4.	කුකුළන් 100ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුල් කොටුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
5.	ගඩොල් හෝ උළු ගබඩා කොට තැබීම	500 0	750 0	1,000 0
6.	දර ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
7.	කළුගල් කැනීම හෝ කැඩීම යන්ත්‍රාණුසාරයෙන් හෝ අතින්	500 0	750 0	1,000 0
8.	සිසිල් බීම නිෂ්පාදනය හෝ සිසිල් බීම ලීටර් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
9.	පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
10.	අයිස්ක්‍රීම් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
11.	ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ දුසිම් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
12.	කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
13.	ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
14.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
15.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පැවත්වීම	500 0	750 0	1,000 0
16.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
17.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0

අනු. අංකය	බලපත්‍රයේ ස්වභාවය	වාර්ෂික වටිනාකම රු. 750 දක්වා රු. ශත	වාර්ෂික වටිනාකම රු. 750 සිට රු. 1,500 දක්වා රු. ශත	වාර්ෂික වටිනාකම රු. 1,500 වැඩි රු. ශත
18.	හිස් ගෝනි හෝ හිස් බෝතල් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
19.	පාපැදි හෝ යතුරුපැදි අලුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	පාවිච්චි කරන ලද පත්තර හෝ කඩදාසි ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
21.	විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
22.	ගිනිකෙළි භාණ්ඩ හා රතිඤ්ඤු ගබඩා කිරීම හෝ නිපදවීම	700 0	775 0	1,250 0
23.	පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
24.	ශීතකල මස් හෝ මාළු ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
25.	දූව ගබඩා කිරීම	500 0	750 0	1,000 0
26.	රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරදමුංගු, එනසාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම	500 0	750 0	1,000 0
27.	ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
28.	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
29.	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
30.	හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම, සකස් කිරීම හෝ අලුහුණු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
31.	බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
32.	මෝටර් වාහන සේවා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34.	බෙලෙක් වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35.	ෆෑස් සිලින්ඩර් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36.	ආයුර්වේද ඖෂධ දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීම	500 0	750 0	1,000 0
37.	වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන	500 0	750 0	1,000 0
38.	කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
39.	කිලෝග්‍රෑම් 150ට වැඩියෙන් තේ කුඩු ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
40.	වෑල්ඩිං සඳහා ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
41.	ලියවන පට්ටලයක් භාවිතා කරමින් වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
42.	තෙල් වර්ගයක් ගබඩාකොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
43.	කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරීම			
44.	වායු සමනය යන්ත්‍ර, ශීතකරණ හෝ අධි ශීතකරණ සේවාකරණ හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
45.	විදුලි කර්මාන්ත වැඩපලක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අලුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
46.	කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
47.	සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
48.	සත්ත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර)	500 0	750 0	1,000 0
49.	ඡායාරූප ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
50.	පශු වෛද්‍ය ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
51.	විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හා ආහාර ද්‍රව්‍ය ගබඩා කර තැබීම	500 0	750 0	1,000 0
52.	කරවල, ලුණු මාළු හෝ ජාඩි කිලෝ ග්‍රෑම් 150ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500 0	750 0	1,000 0
53.	පොල් කටු අඟුරු හෝ දූව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩාකර තැබීම	500 0	750 0	1,000 0

අනු. අංකය	බලපත්‍රයේ ස්වභාවය	වාර්ෂික වටිනාකම රු. 750 දක්වා රු. ශත	වාර්ෂික වටිනාකම රු. 750 සිට රු. 1,500 දක්වා රු. ශත	වාර්ෂික වටිනාකම රු. 1,500 වැඩි රු. ශත
54.	දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
55.	සත්ව ආහාර නිපදවීම හෝ සත්ත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
56.	පුන්නක්කු නිපදවීම හෝ කිලෝග්‍රෑම් 200ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
57.	සබන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
58.	සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම	500 0	750 0	1,000 0
59.	අලුත් හෝ පරණ ලෝහ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
60.	සිරප් හෝ පලතුරු බීම වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
61.	රසකැවිලි වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
62.	පොල් ලෙලි පෙඟවීම (පල් කිරීම)	500 0	750 0	1,000 0
63.	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
64.	දත් බුරුසු නිපදවීම	500 0	750 0	1,000 0
65.	ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
66.	රා එකතු කිරීම	500 0	750 0	1,000 0
67.	විනාකිරි නිපදවීම හා ගබඩා කිරීම	500 0	750 0	1,000 0
68.	යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දිව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
69.	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ නිෂ්පාදනය හෝ ඒවා ලීටර් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
70.	සෝඩා නිපදවීම	500 0	750 0	1,000 0
71.	සම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
72.	පළතුරු, මාලු හෝ වෙනත් ආහාර වර්ග ටින් කිරීම	500 0	750 0	1,000 0
73.	මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග, මාෂ භෝග, කුළු බඩු හෝ පිටි ඇඹරීම සඳහා ඇඹරුම්හලක්	500 0	750 0	1,000 0
74.	ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
75.	කපුරු නිපදවීම	500 0	750 0	1,000 0
76.	ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
77.	රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0
78.	ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
79.	සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
80.	පාසල් රට හුණු නිපදවීම	500 0	750 0	1,000 0
81.	ටයර් ටියුබ් හෝ 50ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
82.	ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
83.	ටයර් ටියුබ් වෝල්කනයිස් කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
84.	සිමෙන්ති කිලෝග්‍රෑම් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
85.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බසිටස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
86.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
87.	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
88.	පොහොර, හුණු පිටි හෝ වෙනත් ද්‍රව්‍යන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම	500 0	750 0	1,000 0
89.	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල්	500 0	750 0	1,000 0
90.	ධාන්‍ය හෝ මාංෂ භෝග කිලෝග්‍රෑම් 250ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

නිකුත් කරනු ලබන සහතික, ලබාදෙනු ලබන සේවාවන් සහ වෙනත් ගාස්තු පැනවීම

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2019.10.24 වන දින පැවැති මහා සභාවේ අංක 05-18 යටතේ යෝජනාව සභා සම්මත වී ඇත. ඒ අනුව සභාව විසින් ලබාදෙනු ලබන සහතිකයක් හෝ සේවාව වෙනුවෙන් ගාස්තු නියම කර පහත සඳහන් ආකාරයට විය යුතු බවට සභාව තීරණය කර ඇති බව මෙයින් දන්වමි.

තව ද මෙම සභාව විසින් සේවා ගාස්තු අය කිරීම පිළිබඳව අතුරු ව්‍යවස්ථාවක් 2017.11.02 වන දින *රජයේ ගැසට්* නිවේදනය පළ කරන ලද දැන්වීම අනුව ද,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාබල ප්‍රදේශය තුළ පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් සහතිකයක් හෝ සේවාවක් ලබා දීම සඳහා එම උපලේඛනයේ 2 වන තීරුවේ ඒ ඒ සහතිකය හෝ සේවාව සැපයීම වෙනුවෙන් සඳහන් කර ඇති ගාස්තුව 2020 වර්ෂය සඳහා පනවා අය කල යුතු බවත් එකී සේවාව හෝ සහතිකය ලබා ගන්නා තැනැත්තෙක් විසින් ඒ සේවාව හෝ සහතිකය ලබා ගැනීමට පෙර එම ගාස්තුව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට සභාව තීරණය කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

ඕ. ජී. රෝහණ බණ්ඩාර,
සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 29 වැනි දින,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

පරිසර බලපත්‍ර සඳහා පරීක්ෂණ ගාස්තු

ආයෝජන මුදල (රු.)

1.	1,000,000 වැඩි	රු.	10,000 + (VAT)
2.	500,001 සිට 1,000,000 දක්වා	රු.	5,000 + (VAT)
3.	250,001 සිට 500,000 දක්වා	රු.	3,750 + (VAT)
4.	250,000 අඩු	රු.	3,000 + (VAT)

පරිසර බලපත්‍ර ගාස්තු

සී කාණ්ඩය (වසර 03 ක් සඳහා)	රු. 40,000 + මුද්දර ගාස්තුව + (VAT)

ලේඛන සෙවීම ප්‍රතිඵල සහතික කිරීමේ ගාස්තු

	පළමු වසර (රු)	*අනෙකුත් වසර සඳහා (රු.)*
ලේඛන සෙවීම	100.00	25.00
පිටපත් කිරීම	20.00	10.00
පරීක්ෂා කිරීම	15.00	10.00

ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම

1. ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනට යටත් පිරිසෙයින් දවස් හතකට කලින් අවසර පත්‍ර ලබා ගැනීම සඳහා ඉල්ලුම්පතක් සභාවට ඉදිරිපත් කළ යුතුය. එම ඉල්ලුම් පත්‍රය පහත දේවල්වලින් සමන්විත විය යුතුය.

    * ලේකම් මහතා වෙත යොමුකළ ලිඛිත ඉල්ලුම්පත්‍රය
    * දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන පරිමිතියේ පිහිටීමට සාපේක්ෂව 1:1000 පරිමාවට නොඅඩු පරිමාවකින් අඳින ලද භූමි සැලැස්ම
    * 1:1000 පරිමාවට නොඅඩු පරිමාවකට අඳින ලද එම නිර්මිතියේ රූප සටහනක්

* එම සැලැස්මේ රූපසටහනේ හෝ නිර්මිතියෙහි අනුකූලව සංශෝධන

* ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීමේ යොදූ ගන්නා වර්ණ සියල්ල යොදූ කුඩා පරිමාණයට අඳින ලද එම දැන්වීමේ පිටපතක්

* යාබද වීදිවලට සහ ප්‍රධාන සලකුණුවලට සාපේක්ෂව ප්‍රචාරක දැන්වීමේ පිහිටීමේ දක්වෙන සැලැස්මක්

* ප්‍රචාරක දැන්වීමට අදළ සවිස්තරය හා අනන්‍යතාවය

* අනවසර බැනර්, දැන්වීම් ඉවත් කිරීමේ බලය සහාව සතු වේ.

අනු. අංකය	*පුවරුවේ ස්වභාවය*	*වර්ග අඩි ප්‍රමාණය*	*ගාස්තුව රුපියල්*		
			මාස 03ට අඩු	*මාස 03 හෝ 06 අතර*	*වසරක්*
01	කිසියම් බිත්තියක හෝ තාප්පයක ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	02 ත් 10 ත් අතර	25	25	30
		10 ට වැඩි	25	30	45
02	රෙදි ඩිජිටල් බැනර් සඳහා	02 ත් 10 ත් අතර	30	35	40
		10 ට වැඩි	35	40	45
03	තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරන ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	02 ත් 10 ත් අතර	35	40	45
		10 ට වැඩි	40	45	50
04	විදුලිය යොදූ ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	02 ත් 10 ත් අතර	45	45	50
		10 ට වැඩි	50	55	60
05	විද්‍යුත් උපකරණ යොදූ කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	02 ත් 10 ත් අතර	40	45	50
		10 ට වැඩි	50	55	60
06	ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මඟින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	02 ත් 10 ත් අතර	50	55	60
		10 ට වැඩි	55	60	65
07	ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් මඟින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	02 ත් 10 ත් අතර	20	25	30
		10 ට වැඩි	30	35	40

ගාස්තු

		රු.
01.	ඉල්ලුම්පත් ගාස්තුව	500 0
02.	පෙරසැරි ගාස්තුව	30 0
03.	අනවසර ගාස්තුව දිනකට	250 0

පෝරම ගාස්තු හා සහතික කිරීම		**රු.**
01.	වීටී රේඛා හෝ නොපවරවා ගැනීම්	1,500 0
02.	ඔප්පු මුද්‍රිත සාරාංශ අයදුම්පත්	1,200 0
03.	ගොඩනැගිලි අයදුම්පත්	500 0
04.	විදුලි ලිපි නිකුත් කිරීම	1,000 0
05.	ජල ඉල්ලුම්පත්	500 0
06.	වෙළඳ බලපත්‍ර අයදුම්පත්	100 0
07.	අනුකූලතා සහතික	2,500 0

08. ගොඩනැගිලි අයදුම්පත් හා පෙරසැරි ගාස්තු

	රු.ශත
ව.අ. 500 ට අඩු	500 0
ව.අ. 501 සිට 1,000 දක්වා	750 0
ව.අ. 1,001 සිට 1,500 දක්වා	1,000 0
ව.අ. 1,501 සිට 2,000 දක්වා	1,500 0
ව.අ. 2,001 සිට 3,000 දක්වා	5,000 0
ව.අ. 3,000 සිට සිට වැඩිවන ව.අ. 01 ට	5.00 බැගින්

සැ.යු. 01 සිට 06 දක්වා සෑම මහලක්ම වෙන වෙනම ගණනය කෙරේ.

07. කුඩා ජල විදුලි බලාගාරයක් ඉදි කිරීම මෙ. වො. 01 ට	50,000 0
08. මෙ.වො. 01ට වැඩි සෑම මෙ.වො. 01ටම	40,000 0
09. සන්නිවේදන දුරකථන කුළුනක් සඳහා උස මීටර් 30 (පරිත්‍යාග)	200,000 0
10. ගොඩනැගිලි අයදුම්පත්‍ර සඳහා කාලය දීර්ඝ කිරීම වසරකට	1,000 .0

11. අනවසර ඉදිකිරීම් ප්‍රමිතීන් අනුව ඉදි කළ ඒවා නීත්‍යානුකූල කිරීම සඳහා දඩ මුදල් අයකිරීම (අත්තිවාරමේ සිට) වර්ග ප්‍රමාණය අනුව

I. අත්තිවාරමේ අවසානය දක්වා ඉදිකර ඇත්නම් ව.අ. 01 ට	1 0
II. ජනෙල් මට්ටම් ඉදිකර ඇත්නම් ව.අ. 01 ට	2 50
III. බිත්ති අවසන් කර ඉදිකර ඇත්නම් ව.අ. 01 ට	3 0
IV. වහල අවසානය දක්වා ඉදිකර ඇත්නම් ව.අ. 01 ට	5 0

12. බිම් කට්ටි සැළසුම් අනුමැතිය

I. පර්චස් 20 දක්වා	750.00
II. පර්චස් 21 සිට 40 දක්වා	1,000.00
III. පර්චස් 41 සිට 60 දක්වා	1,500.00
IV. පර්චස් 61 සිට 120 දක්වා	2,000.00
V. පර්චස් 121 සිට 200 දක්වා	3,000.00
VI. පර්චස් 201 සිට වැඩි වන සෑම පර්චස් 20ක් හෝ කොටසකට	20.00

පුස්තකාල සාමාජික ගාස්තු

	රු. ශත
I. ළමා	50.00
II. වැඩිහිටි	100.00
III. දිනකට දඩ මුදල් එක් පොතකට	1.00
IV. සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තු ළමා	50.00
V. සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තු වැඩිහිටි	100.00

කර්මාන්ත සඳා සමිති ලියාපදිංචි කිරීම 1200.00

කර්මාන්ත පෙරසැරි ගාස්තු

	රු. ශත
0 සිට රු. 50,000 දක්වා	300 0
රු. 50,000 සිට රු. 100,000	600 0
රු. 100,000 සිට රු. 500,000	2,000 0
රු. 5,000,000 සිට රු. 1,000,000 දක්වා	3,000 0
රු. 10,000 සිට රු. 1,500,000 දක්වා	4,000 0
රු. 1,500,000 සිට රු. 2,000,000 දක්වා	5,000 0

රු. 2,000,000 සිට වැඩිවන සෑම ලක්ෂ 5 කටම රු. 500.00 බැගින් ගාස්තුව වැඩිවේ.

සහතික පත්‍ර නිකුත් කිරීම	*රු. ශත*
1. වීථි රේඛා හා නොපවරා ගැනීමේ සහතිකපත් ගාස්තු	1,500 0
2. විදුලි සහතිකපත්‍ර ගාස්තු	1,000 0

ලියාපදිංචි කිරීමේ ගාස්තුව	*රු. ශත*
1. කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු	1,200 0
2. සැලසුම් ශිල්පීන් ලියාපදිංචි කිරීමේ ගාස්තු	2,500 0
3. පාරිසරික නිර්දේශ නිකුත් කිරීමේ ගාස්තු	500 0
4. පස් කැපීම සඳහා නිර්දේශ නිකුත් කිරීමේ ගාස්තු	750 0

01. ප්‍රජා ජල ව්‍යාපෘතිය සඳහා ජල මනු කියවීම සම්බන්ධව අය කරන ගාස්තු පහත සඳහන් පරිදි වේ.
ස්ථාවර ගාස්තුව රු. 100.00
ජල ගාස්තු අය කිරීම

ඒකක ගණන	*අය කරන මුදල (රු.)*
1-5 දක්වා	6.00
6-10 දක්වා	7.00
11-15 දක්වා	9.00
16-20 දක්වා	12.00
21-25 දක්වා	15.00
25ට වැඩි	20.00

02. ජල ගාස්තු අය කරන අනෙකුත් ප්‍රදේශවලට අදාළ ගාස්තු

ස්ථාවර ගාස්තුව - රු. 100.00

ඒකක ගණන	*අය කරන මුදල (රු.)*		
	ගෘහ ඒකක	*ව්‍යාපාර*	*ලාභ නොලබන ආයතන*
0-10	10.00	12.00	7.00
11-15	13.00	15.00	10.00
16-20	16.00	18.00	13.00
21-25	20.00	22.00	17.00
25ට වැඩි	25.00	27.00	22.00

03. බව්වාගම ජල යෝජනා ක්‍රමය සඳහා

ස්ථාවර ගාස්තු රු. 150.00

ඒකක ගණන	*අයකරන මුදල (රු.)*
1-5 දක්වා	6.00
6.10 දක්වා	7.00
11-15 දක්වා	9.00
16-20 දක්වා	12.00
21-25 දක්වා	15.00
25ට වැඩි	20.00

ජල මනු රහිත සම්බන්ධතා සඳහා ස්ථාවර ගාස්තු

* ගාහස්ත	රු. 150.00
* ව්‍යාපාර ස්ථාන	රු. 300.00

04. අනුමත නැති ජල සම්බන්ධතා සඳහා දඩ ගාස්තු රු. 1,000.00ක් අය කරනු ලැබේ

05 ජල සම්බන්ධතාවය සහාව විසින් විසන්ධි කරන අවස්ථාවේ දී නැවත සම්බන්ධතාවය ලබා දීමේ ගාස්තු රු. 500.00 ක් සහ දඩ මුදල රු. 200.00 ක් අය කරනු ලැබේ.

06. ජල නළ පද්ධතියට හානියක් සිදු කළහොත් දඩ මුදලක් වශයෙන් රු. 500.00 ක් අය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා ජේ.සී.බී යන්ත්‍ර හා ගල් රෝල් කුලියට දීම

මී. පැය සඳහා අය කිරීම		රු. 3,000 0
වියදම 8.5*123	- 1045.50	
වැටුප් ගෙවීම	350	
නඩත්තු කටයුතු	500	(1895 0)
		1104 50

ප්‍රාදේශීය සභා කටයුතු හා නගර සභා කසළ ව්‍යාපෘති සඳහා සහ මිල

	රු.	ශත
ඉන්ධන 8.5* 123	1,045	50
වැටුප් ගෙවීම	350	0
නඩත්තු කටයුතු	500	0
ප්‍රතිලාභ හෝ වෙනත්	2,500	0

(ඉන්ධන මිල සූත්‍රය අනුව මෙම ගාස්තු ක්‍රමය සංශෝධනයට යටත් වේ.)

ආකෘති පත්‍ර විකුණුම්

වෙළඳ බලපත්‍ර හා බදු පෝරම	100.00
ඔප්පු සාරාංශ අයදුම්පත්	1,200.00
ජල අයදුම්පත් ගාස්තු	500.00
ගොඩනැගිලි අයදුම්පත්	500.00
සැලසුම් ශිල්පීන් ලියාපදිංචි කිරීම සඳහා පෝරම	200.00
පාපැදි අයදුම්පත්‍ර	16 0
ජල සම්බන්ධතා විසන්ධි කළ පසු නැවත සන්ධි ගාස්තු	500.00
ජල ලේඛනයේ නම මාරු කිරීමේ ගාස්තු	500.00

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සංවර්ධන උපදේශක සභාව පිහිටුවීම සඳහා අතුරු ව්‍යවස්ථාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 (1) වගන්තියෙන් සාදන ලද 2013.09.30 වැනි දින මහා සභාවේ අනුමත කරන ලද සංවර්ධන උපදේශක කාරක සභා පිහිටුවීම සඳහා අතුරු ව්‍යවස්ථාව, 2019.10.24 වැනි දින පැවති මහා සභාවේ 05-18 යටතේ සභා සම්මත විය. ඒ අනුව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සංවර්ධන උපදේශක කාරක සභා පිහිටුවීම සඳහා අතුරු ව්‍යවස්ථා නිවේදනය මෙයින් පළ කරමි. එම නිවේදනය ගැසට් පත්‍රයේ පළ කළ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට බලපාන බව මෙයින් දැනුම් දෙමි.

ඕ. ජී. රෝහණ බණ්ඩාර,
සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 29 වැනි දින,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

01. මෙම කොටසේ අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සංවර්ධන හා මහජන සුභ සාධන සේවා විධිමත් කිරීම සඳහා ප්‍රාදේශීය සභාවට සහාය දක්වන සංවර්ධන උපදේශක කාරක සභා අතුරු ව්‍යවස්ථාව යැයි හඳුන්වනු ලැබේ.

02. මහා සභා තීරණයක් මත පත්කරනු ලබන මෙම උපදේශක කමිටුවේ සාමාජිකයින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචිකරුවන් විය යුතු අතර, සිවිල් අයිතිවාසිකම්වල අනර්ථයක් සිදු නොකරන ලද පුද්ගලයන් විය යුතු ය.

03. මෙම අතුරු ව්‍යවස්ථාව මගින් පත්කරනු ලැබූ සාමාජිකයින්ගේ ධුර කාලය වර්ෂයක් දක්වා බල පැවැත්වේ.

04. සංවර්ධන උපදේශක කාරක සභාවේ සාමාජිකයින් පත් කිරීමේ දී ඔවුන්ගේ කුමන හෝ කාර්යයක් සම්බන්ධයෙන් වුව ද විශේෂ හැකියාවක් ඇත්නම් වඩාත් සුදුසු ය.

05. සුවිශේෂ හැකියාවන් ඇති පුද්ගලයින් සොයා ගැනීමට අපහසු අවස්ථාවල විවිධ කාර්යයන් සඳහා නිපුණත්වයක් දක්වන්නේ නම් මේ සඳහා පත් කළ හැකි ය.

06. එසේ නොවන අවස්ථාවක දී සමාජ සත්කාර සේවයේ නියැලී සිටින පුද්ගලයින් ඒ සඳහා පත් කළ හැකි ය.

07. මෙම සාමාජිකත්වය ස්වේච්ඡාවෙන් සිදු කරනු ලබන උපදේශන සේවාවකි.

<u>සංවර්ධන උපදේශක කාරක සභාවේ කාර්යයන් :</u>

* සිව් අවුරුදු සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම
* වාර්ෂික අයවැය ඇස්තමේන්තුව කෙටුම්පත් කිරීම
* ඉටු කළ යුතු සංවර්ධන කාර්යයන් ප්‍රමුඛතා ගත කිරීම
* හදිසි ආපදා සහන සැලසීම හා ආපදා වලක්වා ගැනීම
* ආදායම් උත්පාදන මාර්ග හා විශේෂ ව්‍යාපෘති හඳුනා ගැනීම.

08. වර්ෂයක් සඳහා ක්‍රියාත්මක වන සංවර්ධන උපදේශක කාරක සභාවේ නිල කාලය වසරකි.

09. කිසියම් සාමාජිකයෙකු උපදේශක කාරක සභාවෙන් ඉවත් වන්නේ නම් දැනුම් දීමක් ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමාට මාසයකට කලින් දැනුම් දිය යුතු ය.

10. උපදේශක කාරක සභා රැස්වීම්වල දී ගණපූර්ණය පවත්වාගෙන යාම පිළිබඳව කමිටු සභාපතිවරයා විසින් සැහීමකට පත්විය යුතු ය.

අර්ථ කථනය:-

උපදේශක කාරක සභාව :

සංවර්ධන කාර්යයන් පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීමේ බලතල ව්‍යාප්ත කිරීම සඳහා ප්‍රදේශයේ සුවිශේෂ හැකියාවන් සහිත තැනැත්තෙකුගෙන් සමන්විත කමිටුව.

ධුරවල කාලය :

කමිටු සාමාජිකයින්ගේ රාජකාරිමය කාලය මෙයින් අදහස් වේ.

සුවිශේෂී හැකියාවන්:

සමාජගත කාර්යයන්වල දී ඒවා හොඳින් කිරීමේ හැකියාව ඇති පුද්ගලයින් මින් අදහස් වේ.

නිපුණතාව:

යම්කිසි කාර්යයක් මනාව කිරීමේ හැකියාව.

සිවිල් අයිතිවාසිකම් සඳහා අන්තර්ගතය :

ජීවත්වීමේ දී වටපිටාව සමග සුහදශීලීව ජීවත්වන කිසිම සමාජ විරෝධී ක්‍රියාවකට සම්බන්ධ නොවූවන් මින් අදහස් වේ.

12 - 713/8

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

බල ප්‍රදේශය තුළ භෞතික සැලසුම්කරණ ප්‍රතිපත්තිය

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 24 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී යෝජනා අංක 05-18 යටතේ සභා සම්මත කරන ලද යෝජනාව අනුව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ භෞතික සැළසුම්කරණයේ මාර්ග, ගොඩනැගිලි, මිහිදන් උයන්, ළිං, වීදි ලාම්පු ප්‍රතිපත්තිය මහජනතාවට දැන ගැනීම පිණිස මෙයින් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

ඕ. ජී. රෝහණ බණ්ඩාර,
සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 29 වැනි දින,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

භෞතික සැළසුම් කරන ප්‍රතිපත්තිය

අරමුණු :

සෑම ග්‍රාම නිලධාරී කොට්ඨාසයක් ම නියෝජනය වන පරිදි සංවර්ධන කාර්යයන් ව්‍යාප්ත කිරීමට ජනතා සහභාගිත්වය ලබා ගැනීම තුළින් භෞතික සැළසුම්කරණය සඳහා ප්‍රමිතියානුකූල නිමාවක් ඇති කිරීම.

නිර්ණායකයන් :

* ජන ඝනත්වය
* දුෂ්කරතාවයන්
* ජන ඉල්ලුම
* ජනතා සහභාගීත්වය
* කාර්යය අවශ්‍යතාවයන්ගේ වැදගත්කම

ක්‍රමවේදය :

01. මාර්ග :

I. සියලු මාර්ගවල වර්ෂයකට වතාවක් හෝ කාණු කැපීම, කාණු ගොඩ දැමීම, කාණු උරහිස පිරිසිදු කිරීම.
II. පලුදු සහිත මාර්ග වලින් 40% ක් පලුදු මැකීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අයවැය ලේඛනය මගින් ලබා දීම.
III. මාර්ගවල පාලම්, බෝක්කු, අත්වැල් වර්ෂයකට වරණ ගැන්වීම.
IV. ජනතා සහභාගීත්වයෙන් නව මාර්ග කැපීම, මාර්ග කැපීම, මාර්ග පුළුල් කිරීම, ඒවා *ගැසට් පත්‍රයට* ඇතුළත් කිරීම.
V. සෑම මාර්ගයක්ම නියෝජනය වන ආකාරයට ගොඩනැගිලි සීමා, වීදි සීමා *ගැසට්* කිරීම, මායිම් සළකුණු කිරීම.
VI. මාර්ගවලට හානිකරන අයට අවශ්‍ය දඬුවම් ලබා දීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම.
VII. මාර්ග සීමාවලට මුහුණලා ඇති ගොඩනැගිලවල පිරිසිදුභාවය පිළිබඳව ප්‍රාදේශීය සභා පනතේ නිසි ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කිරීම.
VIII. මාර්ග අලුතින් කොන්ක්‍රීට් කිරීම/ තාර දැමීම, කාණු සෑදීම, ජල බස්නා ඇති කිරීම.
IX. නාගරික කොටස්වල පදික වේදිකාව ඉදි කිරීම.
X. සභාව සතු මාර්ගවල හඳුනාගැනීමේ පුවරු සවි කිරීම.
XI. අඩි පාරවල් වාහන ගමන් කළ හැකි මාර්ග බවට පත් කිරීම හා එම තත්ත්වයට ගෙන ඒමට සැළසුම් කිරීම.
XII. වීදි ආලෝකකරණය.

02. මිහිදන් උයන් :

I. සියලුම සුසාන භූමිවල අයිතිය ප්‍රාදේශීය සභාවට ලබා ගැනීම.
II. මායිම් නිරවුල් කර වැටවල් ඉදිකිරීම.
III. ජනතා සහභාගීත්වයෙන් සුසාන භූමියේ දේහ මිහිදන් කරන ප්‍රදේශ හඳුනාගැනීම.
IV. විශාලත්වය සහ මහජන කැමැත්ත මත සුසාන භූමිවල කොටසක් වාණිජ කටයුතු සඳහා ශාඛා වගා කිරීම.
V. මරණාධාර සංගම්වල සහභාගීත්වයෙන් සුසාන භූමිවල මිහිදන් කරන දේහ පිළිබඳ තොරතුරු දින වකවානු සහිතව ලබාගෙන පුද්ගලයින්ගේ පුද්ගලික විස්තර සහිත ලේඛනයක් පවත්වාගෙන යාම.
VI. සිහිවටන, ස්මාරක ඉදිකරන අය සඳහා ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබා දුන් අංකය එම සිහිවටන හා ස්මාරක වල සඳහන් කිරීම.
VII. සුසාන භූමිය භාවිතා කරන්නන්ගේ සහභාගීත්වයෙන් වැටවල් සඳහා ශාඛා සිටුවීමට සැළැස්වීම.
VIII. සුසාන භූමි නඩත්තු කාර්යයන්, මරණාධාර හා සුභ සාධක සමිතිවලට පැවරීම.

03. ළිං සහ පිහිළි :

I. අලුතින් ඉදිකරන ළිං සහ පිහිලි වල පිහිටීමේ අයිතිය පවරා ගැනීම.
II. ළිං හා පිහිළි ඉදිකිරීමේ දී ඒ සඳහා මහජන සහභාගීත්වය ලබා ගැනීම.
III. ඉදිකර ඇති ළිං, පිහිළි සඳහා වාර්ෂිකව නඩත්තු වැඩසටහනක් සකස් කිරීම.
IV. අභාවයට යන ළිං හඳුනාගෙන ඒවා මහජන අවශ්‍යතාවයන් මත පුනර්ජීවනය කිරීම.
V. බෝවන රෝග පවතින කාලවල දී ජලයේ ගුණාත්මකභාවය රැක ගැනීමට අවශ්‍ය ප්‍රතිකාර සැළසීම.
VI. අනාරක්ෂිත ගැඹුරු ළිං ආරක්ෂිත තත්ත්වයට පත් කිරීම.
VII . ළිං, පිහිළිවල ප්‍රවේශ මාර්ග ඉදිකිරීම සහ නඩත්තුව.
VIII. නව ජල යෝජනා ක්‍රම ඇතිවීම හේතු කොට ගෙන භාවිතයට නොගන්නා ළිං වසා දැමීම.

04. වීදි ලාම්පු ප්‍රතිපත්තිය :

I. ට්‍රාන්ස්පෝමරයේ ධාරිතාවයෙන් 3% ක් පුරවැසියාගේ පොදු අවශ්‍යතාවය, නගර අලංකරණය සඳහා වැඩි දියුණු කිරීමේ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.
II. දියුණු ප්‍රදේශ ලෙස නම් කර ඇති ප්‍රදේශ සඳහා ප්‍රධාන මාර්ග, අතුරු මාර්ග, මංසන්ධි සඳහා වීදි ලාම්පු සවි කිරීම.
III. අනෙකුත් තදාසන්න ප්‍රදේශවල මහජනයාගේ ඉල්ලීම මත වීදි ලාම්පු සවි කිරීම.
IV. ප්‍රාදේශීය සභාවේ හඳුනාගත් ප්‍රදේශ සඳහා මංසන්ධි, ආගමික ස්ථාන, රාජ්‍ය ගොඩනැගිලි පිහිටි ස්ථානවල වීදි ලාම්පු සවි කිරීම.
V. වීදි ලාම්පු දැල්වීම සහ නිවීම සඳහා මහජන දායකත්වය ලබා ගත හැකි ස්ථාන සඳහා ප්‍රමුඛත්වය ලබා දීම.
VI. මහජන ඉල්ලීම පරිදි සවි කරන වීදි ලාම්පුවල දිගු කාලීන පැවැත්ම, ආරක්ෂාකාරීත්වය සම්බන්ධ ගැටලු ඇති නොවුනොත්, වෙනත් වීදි ලාම්පුවල ආරක්ෂාව තහවුරු කිරීම, නඩත්තු කිරීම සඳහා නිලධාරියකු පත් කිරීම.

VII. වීදි ලාම්පු ලේඛනයක් පවත්වාගෙන යාම හා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.
VIII. ක්‍රියා විරහිත වීදි ලාම්පු නඩත්තු කිරීම.
IX. දියුණු ප්‍රදේශ ලෙස නම් නොකරන ලද ප්‍රදේශවල වීදි ලාම්පු සවි කළ පසු දියුණු කළ ප්‍රදේශ ලෙස *ගැසට්* කිරීම.
X. ඉඩම් කට්ටි කිරීමේ දී එම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතන හරහාම අවශ්‍ය වීදි ලාම්පු සවි කිරීමට වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
XI. ඉඩම් කට්ටි කිරීමේදී එම ඉඩම් කට්ටි ප්‍රමාණය අනුව ඒ සඳහා අවශ්‍ය උපරිම ධාරිතාවයක ට්‍රාන්ස්ෆෝමර් සවි කිරීමට උපදෙස් දීම, එම ට්‍රාන්ස්ෆෝමර් ධාරිතාවය හරහා උචිත ප්‍රමාණයට වීදි ලාම්පු සවි කිරීම.
XII. වීදි ලාම්පුවලට හානිකරන්නන් සඳහා දඬුවම් ලබා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
XIII. වීදි ලාම්පු සවි කිරීමට සමගාමීව ප්‍රාදේශීය සභා ඒකක බල ගැන්වීම.

12 - 713/9

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 24 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 05-18 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා පනවන ලද කර්මාන්ත බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවය යුතු බවත් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

ඕ. ජී. රෝහණ බණ්ඩාර,
සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 29 වැනි දින,
පස්බාගේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (1) වන උපවගන්තියේ ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ පළමු වන තීරුවේ නිරූපිත යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම මත එම උපලේඛනයේ දෙවන තීරුවේ අනුරූපිත සටහනේ නිරූපිත ප්‍රමාණය අනුව කර්මාන්ත බද්දක් 2020 වර්ෂය වෙනුවෙන් පනවා අය කිරීමටත් එම කර්මාන්ත බදු 2020 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ."

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව* *රු. ශත*
වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක	500 0
වාර්ෂික වටිනාකම රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	750 0
වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන අවස්ථාවක	1,000 0

12-713/10

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා වාහන හා සතුන් මත බදු පැනවීම

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 05-18 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මේ බද්දට යටත්වන කිසියම් වාහනයක් හෝ සතකු තබා ගන්නා සෑම තැනැත්තකුම විසින්, එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින 30ක් සම්පූර්ණ වූ වහාම 2020 වර්ෂය සඳහා වන මෙම බද්ද පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

ඕ. ජී. රෝහණ බණ්ඩාර,
සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2019 වර්ෂයේ නොවැම්බර් මස 29 වැනි දින,
පස්බාගේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය සහ 4 වන උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2020 වර්ෂයේ දී පහත උපලේඛනයේ පළමු වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තකු මතම එහි II තීරුවේ අනුරූපිත සටහනේ නිරූපිත බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අය කිරීමට පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය."

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව* *රු. ශත*
මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජීන් රික්ෂෝවක්, බයිසිකල් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක්ම සඳහා	25.00
සෑම බයිසිකල් හෝ ට්‍රයිසිකල් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා	
(අ) වෙළෙඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම්	18.00
(ආ) වෙළෙඳ නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම්	4.00
සෑම කරත්තයක් සඳහා	20.00
සෑම අත් කරත්තයක් සඳහා	10.00
සෑම රික්ෂෝවක් සඳහා	7.50
සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවෙකු සඳහා	15.00
සෑම ඇතෙකු සඳහා	50.00

විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, විල්බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්යයන් සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීම්වලින් නිදහස් කෙරේ.

මෙහි උපලේඛනයේ "වෙළෙඳ කාර්යය" යන්නට, විකිණීම සඳහා හෝ අන් ආකාරයකින් හෝ යම් වෙළෙඳ ව්‍යාපාරයක් *නැතහොත්* කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ යම් ලිඛිත *නැතහොත්* ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

පරිසර ආරක්ෂණ ගාස්තු - 2020 වර්ෂය

2000 අංක 53 සහ 1998 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව මධ්‍යම පරිසර අධිකාරිය මගින් සභාව වෙත පවරා ඇති බලතල මත පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත ආරම්භ කර පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ සඳහන්වන කර්මාන්ත සම්බන්ධයෙන් ඉහත කී පනතේ අදාළ සංශෝධිත යටතේ පවරා ඇති රෙගුලාසිවලට අදාළව එකී ව්‍යාපෘති පවත්වාගෙන යනු ලබන්නන් විසින් 2020 වර්ෂයට බලපත්‍රයක් ලබාගත යුතු බවට 2019.10.24 වැනි දින පැවැති මහා සභාවේ 05-18 යටතේ තීරණය කර ඇති බැවින් ඒ සඳහා පහත දක්වා ඇති ගාස්තු ගෙවිය යුතු බව මෙයින් නිවේදනය කරමි. අදාළ රෙගුලාසිවලට අනුකූලව පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම, අලුත් කිරීම, අවලංගු කිරීම, ප්‍රතික්ෂේප කිරීම, අත්හිටුවීම පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව සතුයි.

ඕ. ජී. රෝහණ බණ්ඩාර,
සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 29 වැනි දින,
පස්බාගේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

1. සියලුම වාහන ඉන්ධන පිරවුම්හල් (ද්‍රව පෙට්‍රෝලියම්, ද්‍රවිකෘත පෙට්‍රෝලියම් වායු)
2. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත
3. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවන පොල්තෙල් සිදීමේ කර්මාන්ත
4. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවන මධ්‍යසාර අඩංගු නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
5. වියළි ක්‍රියාවන් සහිත වී මෝල්
6. මාසික නිෂ්පාදන ධාරිතාව කි.ග්‍රෑ. 1,000 ට අඩුවන ඇඹරුම්හල්
7. දුම්කොළ වේලීමේ කර්මාන්ත
8. සල්ෆර් දුම් ගැසීම සහිත එක් ක්‍රියාවලියක දී නිෂ්පාදන ධාරිතාව කි.ග්‍රෑ. 500ක් හෝ ඊට වැඩි ධාරිතාවක් සහිත කුරුඳු දුම්ගැසීමේ කර්මාන්ත
9. කෑමට ගන්නා ලුණු ඇසිරීමේ හා සැකසීමේ කර්මාන්ත
10. ක්ෂණික තේ කර්මාන්ත ශාලා හැර අනෙකුත් තේ කර්මාන්ත ශාලා
11. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත
12. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
13. දිනකට මෙට්‍රික් ටොන් 20ට අඩු නිෂ්පාදන ධාරිතාවයක් සහිත හුණු පෝරණු
14. ප්ලාස්ටර් ඔප් පැරිස් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත හෝ සේවකයින් 25ට අඩු සංඛ්‍යාවක් සේවයේ නියුක්ත පිඟන් මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
15. සියලු බෙලිකටු ඇඹරීමේ කර්මාන්ත
16. උළු සහ ගඩොල් කර්මාන්ත
17. එක් වරකට එක් බෝර වළක් බැගින් පුපුරවමින් මසකට ඝන මීටර 600ක නිෂ්පාදන ධාරිතාවයකට අඩු මිනිස් ශ්‍රමය හා පුපුරණ ද්‍රව්‍ය භාවිතයෙන් සිදු කරනු ලබන කැනීම්
18. දිනකට ඝන මීටර් 50ට අඩු දැව ඉරුම් ධාරිතාවයක් ඇති ලී මෝල් හෝ බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතයෙන් දැව පිරියම් කිරීමේ කර්මාන්ත හෝ පදම් කිරීමේ කර්මාන්ත
19. බහු කාර්ය යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත හෝ සේවකයන් 05ට වැඩි 25ට අඩු ගණනක් සේවයේ යෙදෙන දැව ආශ්‍රිත කර්මාන්ත
20. නේවාසික කාමර 05ට හෝ ඊට වැඩි සහ 20ට අඩු හෝටල්, ආගන්තුක නිවාස සහ තානායම්
21. වාහනවල වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ/නඩත්තු කිරීමේ කටයුතු සිදුකරන ස්ථාන
22. ශීතකරණ හා වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම, නඩත්තු කිරීමේ කටයුතු සිදුකරන ස්ථාන
23. වාහන සේවා කටයුතු සිදු නොකරන කන්ටේනර් බහලුම් පර්යන්ත
24. සේවකයින් 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන සියලුම විදුලි හෝ ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ අළුත්වැඩියා කිරීමේ ස්ථාන
25. ඊයම් උණු කිරීම සිදු කිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර

බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාව

2020 වර්ෂයට අදාළ වරිපනම් බදු පැනවීම

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තිය හා එකී පනතේ 146 වන වගන්තියේ (1) උපවගන්තිය ප්‍රකාර බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව වරිපනම් බදු අය කරනු ලබන සීමාව පහත උපලේඛනයේ දක්වා ඇති ප්‍රතිශතයන් පනවා අය කිරීම සුදුසු බවට 2019 ක් වූ ඔක්තෝබර් මස 08 වන දින පැවති මහ සභාවේ තීරණ අංක 2 යටතේ යෝජනා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

වරිපනම් බදු අය කරනු ලබන සීමාවන් :

01. බුලත්කොහුපිටිය, අවිස්සාවේල්ල පාරේ 49/7 බෝක්කුවේ සිට කෑගල්ල පාරේ 16/4 බෝක්කුව දක්වා හා බුලත්කොහුපිටිය මංසන්ධියේ සිට අංගුන්න පාලම දක්වා මහා මාර්ගය මධ්‍යයේ දෙපසට විහිදෙන දම්වැල් 02 ක සීමාව තුළ පිහිටි නිශ්චල දේපළක් මත, තක්සේරු වටිනාකමින් සියයට දහයක (10%) වරිපනම් බද්දක් ද,

02. කෑගල්ල පාරේ 16/4 බෝක්කුවේ සිට තන්නිමලේ මන්සංධිය දක්වා මාර්ගය මධ්‍යයේ සිට දෙපසට විහිදෙන දම්වැල් 02 ක සීමාව තුළ පිහිටි නිශ්චල දේපළක් මත, තක්සේරු විටිනාකමින් සියයට පහක (5%) වරිපනම් බද්දක්ද,

03. බුලත්කොහුපිටිය - අවිස්සාවේල්ල පාරේ අංක 26/5 දරන බෝක්කුව අසල සිට බුලත්කොහුපිටිය අවිස්සාවේල්ල පාරේ වෑකඩ අංක 34/5 දරන බෝක්කුව දක්වා මාර්ගය මධ්‍යයේ දෙපසට විහිදෙන දම්වැල් 02 ක සීමාව තුළ පිහිටි නිශ්චල දේපළක් මත, තක්සේරු වටිනාකමින් සියයට පහක් (5%) වරිපනම් බද්දක් ද,

අය කරනු ලැබේ.

ඩී. බී. වී. රුවන් සංජීව දියසුන්නත,
සභාපති,
ප්‍රාදේශීය සභාව - බුලත්කොහුපිටිය.

2019 ඔක්තෝබර් මස 15 වැනි දින,
බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

වාර්ෂික වරිපනම් බදු සඳහා යෝජනාව

බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාව විසින් 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය හා එකී පනතේ 146 වැනි වගන්තියේ (1) උපවගන්තිය ප්‍රකාරව බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2020 වර්ෂයට අදළව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට ගනු ලබන සභා තීරණය පහත සඳහන් වේ. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඉහත දක්වා ඇති වරිපනම් බදු අය කරනු ලබන සීමාව ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා නව වරිපනම් කලාපය සඳහා 2015 වර්ෂය සඳහා වූ තක්සේරුව/සත්‍යාක්ෂණය ලෙස සම්මත කළ යුතු බවට ද, අනෙකුත් කලාපයන් සඳහා 2009 වර්ෂය සඳහා වූ තක්සේරුව/සත්‍යාක්ෂණය ලෙස සම්මත කළ යුතු බවට ද, එකී තක්සේරුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වැනි උපවගන්තියෙන් මහා සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී තක්සේරුව සඳහා පහත සඳහන් ප්‍රතිශතවලින් යුක්ත වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවටත්,

තව ද, 2020 වර්ෂය සඳහා පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එම වාර්ෂික වරිපනම් බද්ද 2020 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දිනට හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ III වැනි තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවකට අදාළ මුදලින් සියයට පහක (5%) වට්ටමක් ද බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාව ලබාදිය යුතු බවටත් බුලත් කොහුපිටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන ලදී.

උපලේඛනය

I වැනි තීරුව *කාර්තුව*	*II වැනි තීරුව* *ගෙවිය යුතු දිනය*	*III වැනි තීරුව* *5% ක වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමුවන කාර්තුව	2020 ජනවාරි මස 01 සිට මාර්තු මස 31 දක්වා	2020 ජනවාරි මස 31
දෙවන කාර්තුව	2020 අප්‍රේල් මස 01 සිට ජූනි මස 30 දක්වා	2020 අප්‍රේල් මස 30
තුන්වන කාර්තුව	2020 ජූලි මස 01 සිට සැප්තැම්බර් මස 30 දක්වා	2020 ජූලි මස 31
හතරවන කාර්තුව	2020 ඔක්තෝබර් මස 01 සිට දෙසැම්බර් මස 31 දක්වා	2020 ඔක්තෝබර් මස 31

12 - 770/1

බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා අක්කර බදු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාව විසින් 2020 වර්ෂයට අදාළ අක්කර බදු පැනවීම සුදුසු බවට 2019 ක් වූ ඔක්තෝබර් මස 08 වැනි දින පැවති මහ සභාවේ තීරණ අංක 7 යටතේ යෝජනා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. බී. වී. රුවන් සංජීව දියසුන්නත,
සභාපති,
ප්‍රාදේශීය සභාව - බුලත්කොහුපිටිය.

2019 ඔක්තෝබර් මස 15 වැනි දින,
බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (3) වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත පිහිටියා වූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් යටතේ වූ හෙක්ටෙයාර් එකක් මත පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අනුප්‍රමාණයන්ගෙන් යුතු වාර්ෂික අක්කර බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අය කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට ගනු ලබන සභා තීරණය පහත සඳහන් වේ. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියෙහි සඳහන් විධිවිධාන අනුව පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් අක්කර බද්ද නියම කිරීම හා අය කිරීමේ කාර්යය සඳහා විශේෂ ප්‍රදේශයක් වශයෙන් සලකනු ලබන බව ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ අංක IV (ආ) වන කොටස හා 1989.03.10 වැනි දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති නියමයට ඇතුළත් බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ හෙක්ටෙයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් 5 (පහ) කට අඩු ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් යටතේ වූ සෑම ඉඩමක් වෙනුවෙන් ම එකී ඉඩමේ හෙක්ටෙයාර් එකක් සඳහා 2020 වර්ෂයට රු. 50/- ක් (රු. පනහක්) බැගින් ද, හෙක්ටයාර් 05 ක් හෝ ඊට වැඩිවන සෑම අවස්ථාවකම හෙක්ටයාරයකට රු. 10ක් (රු. දහයක්) බැගින් ද වන වාර්ෂික බද්දක් පනවා අය කිරීමට බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන ලදී.

09. මෝටර් රථ ආම්චර් එතීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10. ගල් ස්මාරක නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11. පෙට්‍රල්, ඩීසල් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12. මෝටර් රථ අමතර කොටස් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13. පොලිෂ් හෝ ඉටි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14. කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15. පොලිතින් බෑග් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
16. වැලිගොඩ දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17. විෂබීජ නාශක ද්‍රව්‍ය නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18. ලී බඩු ආරක්ෂක ද්‍රව්‍ය නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19. රබර් මුදවන ස්ථානයක් (රබර් රෝලක් හා දුම් කාමරයක් පවත්වාගෙන යාම)	500 0	750 0	1,000 0
20. රබර් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21. රබර් ඔට්ටපාලු මිලට ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22. රබර් මිශ්‍ර මෙට්ට, රෙදි වර්ග හා වෙනත් උපකරණ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23. යකඩ තහඩු ගැල්වනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24. ප්ලාස්ටික් බඩු, සෙල්ලම් බඩු, නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25. බාල්දි හා වෙනත් තහඩු උපකරණ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26. යන්ත්‍ර උපකරණ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27. විදුලි උපකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28. පරණ යකඩ බඩු ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29. කොහු හෝ වෙනත් කෙඳිවලින් උපකරණ හෝ භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30. අයිස් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*	
ව්‍යාපාරයේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750.00 ට නොවැඩි*	*වාර්ෂික වටිනාකම රු. 750.00 ට වැඩි රු. 1,500 ට අඩු*	*වාර්ෂික වටිනාකම රු. 1,500.00 ට වැඩි*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
31. කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප කණු, සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32. සම් භාණ්ඩ නිපදවීමේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33. ටයර් කට්ට කැපීම හෝ පිරවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34. යන්ත්‍රානුසාරයෙන් පාවහන් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35. ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36. මැණික් ගල් කැපීම හා ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37. ඉටිපන්දම් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
38. රූපවාහිනී, ගුවන්විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39. වී මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
අශ්ව බල 5-10 දක්වා	500 0	750 0	1,000 0
අශ්ව බල 11- 21 දක්වා	500 0	750 0	1,000 0
40. මිරිස් කුඩු, කුළු බඩු ධාන්‍ය වර්ග ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41. පොල්තෙල් සිඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
42. කොහු මෝලක් හෝ කොහු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
43. පොල් ලී මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
44. ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
45. රථ වාහන ආසන (කුෂන්) වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
46. ආනයනය කරන දුව වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
47. ඩිස්පෙන්සරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
48. ආයුර්වේද බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

12 - 570/7

ගලිගමුව ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු අයකිරීම මත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122-126 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාර 2007.09.17 වැනි දින අංක 1515/3 *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත්කර ඇති ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමේ හා විධිමත් කිරීමේ අතුරු ව්‍යවස්ථාවට අනුව ගලිගමුව ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් ආකාරයකට පාරකට, වැටකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට

සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තු අය කිරීමට අදාළ පහත යෝජනාව 2019 ඔක්තෝබර් මස 08 වැනි දින පැවැති මහ සභාවේ තීරණ අංක 5.1.9 යටතේ සම්මත වූ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමන් ජයසිංහ,
සභාපති,
ගලිගමුව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 08 වැනි දින,
ගලිගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ 122-126 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාර 2007.09.17 වැනි දින අංක 1515/3 *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත්කර ඇති ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම හා විධිමත් කිරීමේ අතුරු ව්‍යවස්ථාවට අනුව ගලිගමුව ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් ආකාරයකට පාරකට, වැටකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තුවක් 2020 වර්ෂයේ සිට පනවා අයකිරීමට යෝජනා කරන්නීය.

උපලේඛනය

විස්තරය	*වර්ග අඩි 01 කට මිළ රුපියල්*
1. බැනරයක් මගින් ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය (මසකට)	රු. 30
2. කටවුට් (මසකට)	රු. 45
3. ස්ථීර පුවරුවක ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම (මසකට)	රු. 90

12 - 570/8

ගලිගමුව ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් මත ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත ප්‍රකාර 1988.08.23 වැනි දින අංක 520/7 දරන පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* (iv) අ කොටසේ ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදුව ගලිගමුව ප්‍රාදේශීය සභාවේ යෝජනාවලින් අනුමත (269 වැනි අධිකාරය මත) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතට හා නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාරව ගලිගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කරනු ලබන සියලුම ඉදිකිරීම් සඳහා අයදුම්පත් ගලිගමුව ප්‍රාදේශීය සභාව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුත බවටත්, ගලිගමුව ප්‍රාදේශීය සභා සීමාව තුළ ගොඩනැගිලි ඉදිකිරීම් හා අනවසර ඉදිකිරීම් සඳහා පහත උපෙල්ඛනවල සඳහන් ගාස්තු අය කිරීමටත්, අදාළ පහත යෝජනාව 2019 ඔක්තෝබර් මස 08 වැනි දින පැවති මහා සභාවේ තීරණ අංක 5.1.10 යටතේ සභා සම්මත වූ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමන් ජයසිංහ,
සභාපති,
ගලිගමුව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 08 වැනි දින,
ගලිගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත ප්‍රකාර 1988.08.23 වැනි දින අංක 520/7 දරන පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* (iv) අ කොටසේ ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදුව ගලිගමුව ප්‍රාදේශීය සභාවේ යෝජනාවලින් අනුමත (269 වැනි

අධිකාරය මත) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතට හානිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාරව ගලිගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කරනු ලබන සියලුම ඉදිකිරීම් සඳහා අයදුම්පත් ගලිගමුව ප්‍රාදේශීය සභාව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු බවටත්, ගලිගමුව ප්‍රාදේශීය සභා සීමාව තුල ගොඩනැගිලි ඉදිකිරීම් හා අනවසර ඉදිකිරීම් සඳහා පහත උපලේඛනවල සඳහන් ගාස්තු අය කිරීමටත් යෝජනා කරන්නීය.

උපලේඛන අංක 01

	රු. ශත
1. ගොඩනැගිලි අයදුම්පත් ගාස්තු	960 0
2. විථී රේඛා හා නොපවරවා ගැනීමේ සහතික නිකුත් කිරීමේ ගාස්තු	650 0

උපලේඛන අංක 02

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතට අනුව පෙරසැරි ගාස්තු අය කිරීම

සංවර්ධන කාර්යයයේ ස්වභාවය	*භාවිතා කළයුතු ආකෘති පත්‍රය*	*අයකළ යුතු ගාස්තු*		
I. සංවර්ධන අවසර පත්‍ර නිකුත් කිරීම	"අ"	පෙරසැරි ගාස්තුව I. බිම් කට්ටි ප්‍රමාණය	එක් බිම් කට්ටියකට අයකළ යුතු මුදල (මාර්ග කාණු හා පොදුබිම් කොටස් හැර)	
ඉඩම් අනු කොටස්වලට බෙදීම		ව.මී. 150-300	රු. 500.00	
		ව.මී. 301-600	රු. 400.00	
		ව.මී. 601-900	රු. 300.00	
		ව.මී. 900 ට වැඩි	රු. 200.00	
II. ගොඩනැගිලි ඉදිකිරීම්/පවත්නා ගොඩනැගිලි වලට අළුතින් කොටසක් එකතු කිරීම/නැවත ඉදිකිරීම	"ආ"	ගෙබිම විශාලත්වය ව.මී.	පදිංචිය සඳහා	වාණිජ හෝ වෙනත් භාවිත
		45 ට අඩු	500.00	1,000.00
		45-90	1,500.00	2,000.00
		91-180	2,500.00	3,000.00
		181-270	3,500.00	4,000.00
		271-450	4,500.00	6,000.00
		451-675	5,500.00	8,000.00
		676-900	6,500.00	10,000.00
		901-1225	7,500.00	12,000.00
		1225 ට වැඩි	7,500.00	12,000.00
			වර්ග මීටර 1226 ඉක්මවීමෙන් පසු සෑම වර්ග මීටර් 90ක් සඳහාම රු. 1,000 බැගින්	වර්ග මීටර 1226 ඉක්මවීමෙන් පසු සෑම වර්ග මීටර් 90ක් සඳහාම රු. 1,250 බැගින්
III. මායිම් තාප්ප/ආරක්ෂක බැම් ඉදිකිරීම		III. නේවාසික දික් මීටර් 01ක් සඳහා ගාස්තුව	වාණිජ හෝ වෙනත් වර්ග දික් මීටර් 01 ක් සඳහා	
* ගොඩනැගිලි සීමාවෙන් පිටත		රු. 300.00	රු. 400.00	
* ගොඩනැගිලි සීමාව තුළ		රු. 500.00	රු. 600.00	

IV. ඉඩම්/කුඹුරු ගොඩ කිරීම		IV.	ව.මී. 150 ට අඩු රු. 1,500 ක් සහ එයට වැඩි සෑම ව.මී. 150 කට රු. 1,000.00 බැගින්
V. දුරකථන කුළුණු/ඇන්ටනා කුළුණු ඉදිකිරීම		V.	උස මී. 5-20 දක්වා රු. 20,000.00 ක් සහ වැඩිවන සෑම මී. 01 ටම රු. 1,00.00 බැගින්
VI. විශේෂ ව්‍යාපෘති සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම		IV.	රුපියල් මිලියන 05 කට රු. 5,000.00 සහ වැඩිවන සෑම රු. මිලියන 01 කට 100.00 බැගින්

2. නේවාසික සඳහා වූ ඒකකයක භාවිතය වෙනස් වීම	"ආ"	පෙරසැරි ගාස්තු	රු. ශත
		I. ගෙබිම ප්‍රමාණය (වර්ග මීටර්)	
		45 ට අඩු	500.00
		45-90	1,000.00
		91-180	1,250.00
		181-270	1,500.00
		271-450	1,750.00
		451-675	2,000.00
		676-900	2,250.00
		900 ට වැඩි	2,250.00 වර්ග මීටර 901 වැඩි වන එක් එක් වර්ග මීටර් 90ක් සඳහා රු. 500 බැගින්

II. නිසි සංවර්ධන බලපත්‍රයකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීම/ කොටස් එකතු කිරීම/නැවත ඉදි කිරීම		නේවාසික වර්ග මීටර් එකක් සඳහා ගාස්තු	වාණිජ හා වෙනත් වර්ග මීටර් එකක් සඳහා ගාස්තු
ඉදිකිරීමේ අදියර			
• අත්තිකාරම් වැඩ පමණක් (කයිරු මට්ටම) සම්පූර්ණ කොට ඇති විට		රු. 200.00	රු. 500.00
• වහළ මට්ටම දක්වා (වහලය රහිතව) ඉදි කොට ඇති විට		රු. 300.00	රු. 1,000.00
• වහලය ඇතුළුව ඉදි කොට ඇති විට		රු. 400.00	රු. 1,500.00
• සම්පූර්ණයෙන් ඉදි කොට ඇති විට		රු. 500.00	රු. 2,000.00
III. මායිම් තාප්ප ආරක්ෂිත බැම්ම ඉදි කිරීම		රු. 400.00	රු. 400.00
IV. ඉඩම්/කුඹුරු ගොඩ කිරීම සඳහා		සෑම වර්ග මීටර් 150 කට රු. 5,000.00 බැගින්	
V. දුරකථන/විදුලි සංදේශ කුළුණු සඳහා		උස සෑම මීටර් 5 කට රු. 10,000.00 බැගින්	
VI. විශේෂ සංවර්ධන ව්‍යාපෘති		සෑම මිලියන 5 කට රු. 10,000.00 බැගින්	
VII. අනුකූලතා සහතිකය නොමැතිව පදිංචි වීම / භාවිතා කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම		එක් දිනකට රු. 50.00 බැගින්	

උපලේඛන අංක 03

2020 වර්ෂය සඳහා අනුකූලතා සහතික නිකුත් කිරීම සඳහා ගාස්තු අය කිරීම

සංවර්ධන කාර්යයේ ස්වභාවය අනුකූලතා සහතික නිකුත් කිරීම (සෑම ඉදිකිරීමක්/සංවර්ධනයක් සඳහාමඅනුකූලතා සහතිකයක් ලබා ගත යුතුය)	භාවිත කළ යුතු ආකෘති පත්‍රය	අයකළ යුතු ගාස්තු *අනුකූලතා සහතිකය ප්‍රදානය කිරීමේ ගාස්තු*
i. ඉඩම් අනු බෙදුම්	ඈ	පළමු බිම් කොටසට රු. 1,000ක් සහ ඊට වැඩි වන සෑම බිම් කට්ටියකටම රු. 500
ii. (*අ*) නේවාසික ඉදිකිරීම්		ව.මී. 300 ට අඩු රු, 3,000ක් සහ ඊට වැඩි වන සෑම ව.මී. 1 කට රු. 10 බැගින්
(*ආ*) වාණිජ හා වෙනත් ඉදිකිරීම්		ව.මී. 100 අඩු රු. 3,000ක් සහ ඊට වැඩි වන සෑම ව.මී. 1 කට රු. 20 බැගින්
iii. මායිම තාප්ප/ආරක්ෂක බැම් ඉදිකිරීම		පළමු දික් මීටර් 100 සඳහා රු. 1,000ක් සහ ඊට වැඩි වන සෑම මීටර් 1 කටම රු. 10 බැගින්
iv. ඉඩම්/කුඹුරු ඉඩම් ගොඩකිරීම		ව.මී. 150 අඩු රු. 3,000ක් සහ ඊට වැඩිවන සෑම ව.මී. 1කට රු. 20 බැගින්
v. දුරකථන විදුලි සංදේශ කුළුණු		උස මීටර් 5 සිට 20 දක්වා රු. 2,000 සහ ඊට වැඩි වන සෑම මීටර් 1කට රු. 100 බැගින්
vi. විශේෂ ව්‍යාපෘති		කුඩා පරිමාණ සඳහා රු. 5,000 මධ්‍යම පරිමාණ සඳහා රු. 10,000 මහා පරිමාණ සඳහා රු. 20,000

12 - 570/9

ගලිගමුව ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා පිඹුරුපත් අනුමත කිරීම මත ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත මගින් සහ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ වගන්ති වලින් පැවරී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ ගාස්තු 2020 වර්ෂයට අය කිරීම 2019 ඔක්තෝබර් මස 08 දින පැවති මහ සභාවේ තීරණ අංක 5.1.11 යටතේ සභා සම්මත වූ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමන් ජයසිංහ,
සභාපති,
ගලිගමුව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 08 වැනි දින,
ගලිගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත මගින් සහ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාර 2020 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිඹුර අනුමත කිරීම සඳහා පහත සඳහන් ගාස්තු අයකිරීමට යෝජනා කරන්නීය.

උපලේඛන අංක 01

පර්චස් 6-20 දක්වා	රු. 500.00
පර්චස් 21-30 දක්වා	රු. 700.00
පර්චස් 31-50 දක්වා	රු. 1000.00
පර්චස් 51 ට වැඩි සියළුම පිඹුරුපත් සඳහා	රු. 1500.00

උපලේඛන අංක 02

I. නාගරික සංවර්ධන අධිකාරියට අයත් ප්‍රදේශයක පිඹුරුපත් අනුමත කිරීමේ පෝරම ගාස්තු රු. 110.00
II. නිවාස හා නගර සංවර්ධන ආඥාපනත ක්‍රියාත්මක වන ප්‍රදේශයක පිඹුරුපත් අනුමත කිරීමේ පෝරම ගාස්තුව රු. 110.00
III. අනුකූලතා සහතික නිකුත් කිරීමේ පෝරම ගාස්තුව රු. 110.00

12 - 570/10

ගලිගමුව ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය ප්‍රකාරව ගලිගමුව ප්‍රාදේශීය සභා බල සීමාව ඇතුලත යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විකුණනු ලබන අවස්ථාවක එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් සියයට එකක් (1%) කට සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත්,

වෙන්දේසි ඉඩමේ සමස්ථ භූමි ප්‍රමාණය අක්කර 2 1/2 ට වැඩි වූ විට එම ප්‍රමාණයෙන් සියයට දහයක් (10%) ක කොටසක් පොදු පහසුකම් සඳහා වෙන්කල යුතු බවටත්, අදාල පහත යෝජනාව 2019 ඔක්තෝබර් මස 08 වැනි දින පැවති මහ සභාවේ තීරණ අංක 5.1.12 යටතේ සභා සම්මත වූ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමන් ජයසිංහ,
සභාපති,
ගලිගමුව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 08 වැනි දින,
ගලිගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය ප්‍රකාරව ගලිගමුව ප්‍රාදේශීය සභා බල සීමාව ඇතුලත යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විකුණනු ලබන අවස්ථාවක එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් සියයට එක (1%) කට සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත්, වෙන්දේසි ඉඩමේ සමස්ථ භූමි ප්‍රමාණය අක්කර 2 1/2ට වැඩි වූ විට එම ප්‍රමාණයෙන් සියයට දහයක් (10%)ක කොටසක් පොදු පහසුකම් සඳහා වෙන්කළ යුතු බවටත්, යෝජනා කරන්නීය.

12 - 570/11

ගලිගමුව ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ආදාහනාගාර සේවාව පවත්වාගෙන යාම වෙනුවෙන් ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වැනි වගන්තියෙන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ගලිගමුව ප්‍රාදේශීය සභාව ආදාහනාගාර සේවාව පවත්වාගෙන යාම සඳහා වූ අතුරු ව්‍යවස්ථාව 2012.06.08 දිනැති ගැසට් මගින් ප්‍රකාශයට පත්ව ඇති අතර. ඒ අනුව 2020 වර්ෂය සඳහා ගාස්තු පැනවීමට අදාල පහත යෝජනාව 2019 ඔක්තෝබර් මස 08 වැනි දින පැවති මහ සභාවේ තීරණ අංක 5.1.13 යටතේ සභා සම්මත වූ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමන් ජයසිංහ,
සභාපති,
ගලිගමුව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 08 වැනි දින,
ගලිගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වැනි වගන්තියෙන් ගලිගමුව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ආදාහනාගාර සේවාව පවත්වාගෙන යාම සඳහා පහත සඳහන් ගාස්තු 2020 වර්ෂය සඳහා පනවා අය කිරීමට යෝජනා කරන්නීය.

1. බල ප්‍රදේශය තුල පදිංචි අයකුගේ මෘත දේහයක් ආදාහනය කිරීම	රු. 6,500.00
2. බල ප්‍රදේශයෙන් පිටත පදිංචි අයකුගේ මෘත දේහයක් ආදාහනය කිරීම	රු. 7,500.00

12 - 570/12

ගලිගමුව ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා පරිසර ගාස්තු පැනවීම

2000 අංක 53 හා 1988 අංක 56 දරන පනත්වලින් සංශෝධිත, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වැනි වගන්තිය යටතේ මධ්‍යම පරිසර අධිකාරිය මගින් පනවා ඇති පහත සඳහන් ආකාරයට 2020 වර්ෂය සඳහා පරිසර ගාස්තු පනවා අයකර ගැනීමට අදාල පහත යෝජනාව 2019 ඔක්තෝබර් මස 08 වැනි දින පැවති මහ සභාවේ තීරණ අංක 5.1.14 යටතේ සභා සම්මත වූ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමන් ජයසිංහ,
සභාපති,
ගලිගමුව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 08 වැනි දින,
ගලිගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

2000 අංක 53 හා 1988 අංක 56 දරන පනත්වලින් සංශෝධිත, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වැනි වගන්තිය යටතේ මධ්‍යම පරිසර අධිකාරිය මගින් පනවා ඇති පහත සඳහන් ආකාරයට 2020 වර්ෂය සඳහා පරිසර ගාස්තු පනවා අයකර ගැනීමට යෝජනා කරන්නීය.

1. පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ගාස්තුව	රු. 4,000.00
2. පරිසර ඉල්ලුම්පත්‍ර ගාස්තු	රු. 120.00

කොම්පෝස්ට් පොහොර අලෙවිය

1. කොම්පෝස්ට් පොහොර 1kg ක්	රු. 10 0
2. කොම්පෝස්ට් පොහොර 500kg ට වැඩිවන විට	රු. 8 0

12 - 570/13

ගලිගමුව ප්‍රාදේශීය සභාව

2020 වර්ෂයට ගලිගමුව ප්‍රාදේශීය සභාව සතු පහත විස්තර සඳහන් ද්‍රව්‍ය හා උපකරණ කුලියට ලබා දීම

ගලිගමුව ප්‍රාදේශීය සභාව සතු පහත සඳහන් ද්‍රව්‍ය හා උපකරණ කුළියට ලබාදීම වෙනුවෙන් ඉදිරියෙන් දක්වා ඇති ගාස්තු පනවා අය කිරීමට අදාල පහත යෝජනාව 2019 ඔක්තෝබර් මස 08 වැනි දින පැවති මහ සභාවේ තීරණ අංක 5.1 යටතේ සභා සම්මත වූ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමන් ජයසිංහ,
සභාපති,
ගලිගමුව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 08 වැනි දින,
ගලිගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

ගලිගමුව ප්‍රාදේශීය සභාව සතු පහත විස්තර සඳහන් ද්‍රව්‍ය හා උපකරණ කුලියට ලබා දීම වෙනුවෙන් පහත සඳහන් ගාස්තු 2020 වර්ෂය සඳහා පනවා අය කිරීමට යෝජනා කරන්නීය.

• පුටු 01	දිනක් සඳහා	රු.	5.00
• කොඩි කණු 01	දිනක් සඳහා	රු.	25.00
• පාලම් කොඩි 01	දිනක් සඳහා	රු.	10.00
• වෙනත් කොඩි 01	දිනක් සඳහා	රු.	5.00
• ටකරන් තහඩු 01	දිනක් සඳහා	රු.	10.00
• සාස්පාන්/තාච්චි 01	දිනක් සඳහා	රු.	100.00
• නව වේදිකාව	එක් දිනක් සඳහා	රු.	10,000.00
• නව වේදිකාව	තැන්පත්	රු.	3,000.00

12 - 570/14

ගලිගමුව ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා සභාව සතු වාහන කුලියට ලබා දීමේදී කුළී ගාස්තු අය කිරීම

පහත උපලේඛනයේ සඳහන් පරිදි සභාව සතු වාහන කුලියට ලබාදීමේදී කුලී ගාස්තු අය කිරීම අදාල පහත යෝජනාව 2019 ඔක්තෝබර් මස 08 වැනි දින පැවති මහ සභාවේ තීරණ අංක 5.1.15 යටතේ සභා සම්මත වූ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමන් ජයසිංහ,
සභාපති,
ගලිගමුව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 08 වැනි දින,
ගලිගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

ගලිගමුව ප්‍රාදේශීය සභාව සතු වාහන කුලියට ලබාදීම වෙනුවෙන් පහත සඳහන් ගාස්තු 2020 වර්ෂය සඳහා පනවා අය කිරීමට යෝජනා කරන්නීය.

අනු. අංකය	*වාහනයේ නම සහ විස්තරය*	*ගාස්තු විස්තරය*		
01	බැකෝ යන්ත්‍රය 5575	මීටර් පැය 01 ට (පැය 4 ක මුදල එකවර ගෙවිය යුතුය. යාමට ඒමට ගාස්තු අයකෙරේ)	රු.	3,000.00
02	මෝටර් ග්‍රේඩරය ZA 5408	මීටර් පැය 01 ට (යාමට ඒමට ගාස්තු අයකෙරේ)	රු.	3,500.00
03	ජල බවුසරය	කිලෝ මීටර් 10 ක් ඇතුලත ජලය සමග ලෝඩ් එකක්	රු.	4,500.00
		ජලය රහිතව වරකට බවුසරය	රු.	3,000.00
		පැය 8 ක් තබා ගන්නේ නම්	රු.	5,500.00
		කි.මී. 10 ට වැඩිවන 1 කි.මීටරයක් සඳහා බැගින් අය කරයි. පැය 8 කට වැඩි කාලයක් තබා ගන්නේ නම් රු. 500.00 ක් අය කරයි.	රු.	100.00
		බල ප්‍රදේශයෙන් පිටත ජලය සමග ලෝඩ් 01 ක් සඳහා	රු.	6,500.00
04	ගලි බවුසරය	බල ප්‍රදේශය තුළ -		
		ගෘහස්ථ ලෝඩ් 01 ක්	රු.	4,000.00
		සේවා ගාස්තුව	රු.	675.00
				4,675.00
		ව්‍යාපාරික ලෝඩ් 01 කට	රු.	5,000.00
		සේවා ගාස්තුව	රු.	675.00
				5,675.00
		බල ප්‍රදේශයෙන් පිටත		
		ගෘහස්ථ ලෝඩ් 01 කට	රු.	4,500.00
		සේවා ගාස්තුව	රු.	2,000.00
				6,500.00
		බල ප්‍රදේශයෙන් පිටත යන කිලෝ මීටර් 01 ක් සඳහා රු. 100.00 බැගින් අයකරයි.		
		ව්‍යාපාරික ලෝඩ් 01 කට	රු.	5,500.00
		සේවා ගාස්තු	රු.	2,000.00
				7,500.00
		බල ප්‍රදේශයෙන් පිටත යන කිලෝ මීටර් 01 ක් සඳහා රු. 100.00 බැගින් අයකරයි.		
05	මාර්ග තලනය	දිනකට	රු.	4,000.00

කැකිරාව ප්‍රාදේශීය සභාව

2020 වර්ෂයට වෙළඳ බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුු 147 වැනි වගන්තිය යටතේ කැකිරාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද කැකිරාව ප්‍රාදේශීය සභා රැස්වීමේදී තීරණ අංක 603 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි,

ඉහත කී යෝජනාව,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු 147 වන වගන්තිය යටතේ කැකිරාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයේ I වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා කැකිරාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2020 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අයකළ යුතු යැයි යෝජනා කරමි.

තව ද එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පලක් වන විට දී ඊට අදාළ බලපත්‍ර ලබා දීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2019 වර්ෂයේ ලැබීම් වලින් සියයට එකක් (1% ක්) බලපත්‍ර ගාස්තු ලෙස 2020 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් මම තීරණය කරමි.

ඒ අනුව 2019 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනට පැවති යම් කාර්යයක් සම්බන්ධයෙන් වූ විට යථෝක්ත බලපත්‍රය 2020 මාර්තු මස 31 වැනි දිනට ප්‍රථම ද, 2020 වර්ෂයේ ආරම්භ කරනු ලබන කාර්යයක් සම්බන්ධයෙන් වූ විට යථෝක්ත බලපත්‍රය එම කාර්යය ආරම්භ කර මාස 03ක් ඇතුළත ප්‍රාදේශීය සභාවෙන් ලබා දිය යුතු බවට වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. එම්. එස්. ඒ. බී. හේරත්,
සභාපති,
කැකිරාව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 30 වැනි දින,
කැකිරාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

I වැනි තීරුව *බලපත්‍රයෙන් බලය දෙනු ලබන කාර්යය*	*II වැනි තීරුව* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
	රු. 750 නොඉක්මවන අවස්ථාවක *රු. ශත*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක* *රු. ශත*
1. ලැගුම් නිවාසයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2. හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3. බත් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4. ආපන ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5. තේ කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6. බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

I වැනි තීරුව	*II වැනි තීරුව*		
බලපත්‍රයෙන් බලය දෙනු ලබන කාර්යය	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
	රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
7. කිරි පට්ටියක්/ගව ගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8. කිරි/කිරි ආශ්‍රිත නිෂ්පාදන විකිණීම	500 0	750 0	1,000 0
9. මාලු විකිණීම	500 0	750 0	1,000 0
10. මස් විකිණීම	500 0	750 0	1,000 0
11. සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12. ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13. බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14. ගෝඝාතක ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15. රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16. අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

12 - 806/1

කැකිරාව ප්‍රාදේශීය සභාව

2020 වර්ෂයට කර්මාන්ත බද්දක් පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය යටතේ කැකිරාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද කැකිරාව ප්‍රාදේශීය සභා රැස්වීමේදී තීරණ අංක 604 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි,

ඉහත කී යෝජනාව,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කැකිරාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි නියම කරමි.

ඒ අනුව 2019 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනට පැවති යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විට යටෝක්ත බද්ද 2020 මාර්තු මස 31 වැනි දිනට ප්‍රථම ද, 2020 වර්ෂයේ ආරම්භ කරනු ලබන කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විට යටෝක්ත බද්ද කර්මාන්තය ආරම්භ කර මාස 03ක් ඇතුළත ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. එම්. එස්. ඒ. බී. හේරත්,
සභාපති,
කැකිරාව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 30 වැනි දින,
කැකිරාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

අනු. අංකය	*I වැනි තීරය* කර්මාන්තයේ ස්වභාවය	*II වැනි තීරය* ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්		
		වාර්ෂික වටිනාකම රු. 750 ට නොවැඩි	*වාර්ෂික වටිනාකම රු. 750 සිට සිට රු. 1,500*	*වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	වී මෝල පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	සෙක්කුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	මෝටර් රථ වාහන අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
4.	පෑස්සුම් වැඩපොලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	ධාන්‍ය ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6.	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8.	වාහන තීන්ත ආලේප කිරීම	500 0	750 0	1,000 0
9.	කම්මල (යකඩ තලන) පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	කොන්ක්‍රීට් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	හකුරු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
12.	කළුගල් කැඩීම	500 0	750 0	1,000 0
13.	වානේ ගෘහ භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
14.	ගඩොල් පෝරණු	500 0	750 0	1,000 0
15.	හුණු පෝරණු	500 0	750 0	1,000 0
16.	ලියවන පට්ටල්	500 0	750 0	1,000 0
17.	පපඩම් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
18.	නාම පුවරු සෑදීම/ඇඳීම	500 0	750 0	1,000 0
19.	චිත්‍ර ශිල්පී වැඩ	500 0	750 0	1,000 0
20.	විදුලි උපකරණ අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
21.	දර මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	වේවැල් භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
23.	වඩුමඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	මනු පුවරු හා මනු පෙට්ටි සෑදීම	500 0	750 0	1,000 0
25.	සබන්/හඳුන්කුරු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
26.	පොල්තෙල් සිදීම	500 0	750 0	1,000 0
27.	වැලි තොටුපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	බිම් මල් නිෂ්පාදන	500 0	750 0	1,000 0
29.	පරිගණක අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
30.	විසිතුරු මල් පැළ විකිණීම	500 0	750 0	1,000 0
31.	ලී ඉරීම (යාන්ත්‍රික)	500 0	750 0	1,000 0
32.	කොප්පරා/පොල් විකිණීම	500 0	750 0	1,000 0
33.	බැටරි චාජ් කිරීම	500 0	750 0	1,000 0
34.	ඔරලෝසු අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
35.	යතුරු පැදි අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
36.	පා පැදි අළුත්වැඩියාව	500 0	750 0	1,000 0

අනු. අංකය	*I වැනි තීරය* කර්මාන්තයේ ස්වභාවය	*II වැනි තීරය* ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්		
		වාර්ෂික වටිනාකම රු. 750 ට නොවැඩි	වාර්ෂික වටිනාකම රු. 750 සිට සිට රු. 1,500	වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි
		රු. ශත	රු. ශත	රු. ශත
37.	ටයර්, ටියුබ් අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
38.	ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
39.	රබර් සීල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
40.	කැටයම් භාණ්ඩ හා සිමෙන්ති භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
41.	විදුලි භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
42.	පින්තූර රාමු කිරීම/වීදුරු අල්මාරි සෑදීම	500 0	750 0	1,000 0
43.	මැටි භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
44.	ඉදල්, කොහු, ලණු භාණ්ඩ නිෂ්පාදනය, විකිණීම	500 0	750 0	1,000 0
45.	ඇඳුම් මැසීම	500 0	750 0	1,000 0
46.	පාවහන් නිෂ්පාදනය/බෑග් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
47.	මෝටර් රථ බෝඩි සෑදීම	500 0	750 0	1,000 0
48.	ඇණ කම්බි වර්ග නිෂ්පාදනය	500 0	750 0	1,000 0
49.	ෆයිබර් ග්ලාස් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
50.	රෙකෝඩ් බාර් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
51.	කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
52.	එළවලු තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
53.	ස්වර්ණාභරණ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
54.	රෙදි බතික් කිරීම	500 0	750 0	1,000 0
55.	ලෝහ වර්ග පෑස්සීම	500 0	750 0	1,000 0
56.	මෝටර් වාහන අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
57.	ඇළුමිනියම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
58.	බ්‍රේක් ලයිනර්, ක්ලච් ලයිනර් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
59.	විදුලි භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
60.	පොහොර නිෂ්පාදනය	500 0	750 0	1,000 0
61.	පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
62.	දුම්කොළ වියළීම	500 0	750 0	1,000 0
63.	සත්ව ආහාර නිෂ්පාදනය	500 0	750 0	1,000 0
64.	සබන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
65.	පළතුරු බීම නිෂ්පාදනය	500 0	750 0	1,000 0
66.	රසකැවිලි නිෂ්පාදනය	500 0	750 0	1,000 0

12 - 806/2

කැකිරාව ප්‍රාදේශීය සභාව

2020 වර්ෂයට ව්‍යාපාර බද්දක් පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තිය යටතේ කැකිරාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද කැකිරාව ප්‍රාදේශීය සභා රැස්වීමේදී තීරණ අංක 605 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි,

ඉහත කී යෝජනාව,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි උපවගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කැකිරාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් කැකිරාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2020 වර්ෂයේ දී පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන් ම එම ව්‍යාපාරයේ 2019 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයේ I තීරුවෙන් නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි යෝජනා කරමි.

ඒ අනුව 2019 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනට පැවති යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වූ විට යථෝක්ත බද්ද 2020 මාර්තු මස 31 වැනි දිනට ප්‍රථම ද 2020 වර්ෂයේ ආරම්භ කරනු ලබන ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වූ විට යථෝක්ත බද්ද ව්‍යාපාරය ආරම්භ කර මාස 03ක් ඇතුළත ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. එම්. එස්. ඒ. බී. හේරත්,
සභාපති,
කැකිරාව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 30 වැනි දින,
කැකිරාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

	I වැනි තීරුව *බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය*	*II වැනි තීරුව* *ගෙවිය යුතු බද්ද* *රු. ශත*
1.	රුපියල් 6,000 නොඉක්මවන අවස්ථාවක	–
2.	රුපියල් 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට	90 0
3.	රුපියල් 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
4.	රුපියල් 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
5.	රුපියල් 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200 0
6.	රුපියල් 1,50,000 ඉක්මවන විට	3,000 0

මෙම බදු මුදල අදළ වන ව්‍යාපාර :

1. කොමිස් ඒජන්තවරු
2. වෙන්දේසිකරුවන්
3. බ්‍රෝකර්වරු
4. මුදල් ආයෝජකයින්
5. උකස් බඩු වෙළෙඳුන්
6. කොන්ත්‍රාත්කරුවන්
7. සැපයුම්කරුවන්
8. රියදුරු පුහුණු ආයතන
9. රක්ෂණ ආයතන
10. විදේශ රැකියා ආයතන
11. නියෝජිත තැපැල් කාර්යාල
12. සිවිල් ඉංජිනේරු සේවා
13. කෘෂි යන්ත්‍රෝපකරණ
14. ඉන්ධන පිරවුම්හල්

15. බැංකු හා මුල්‍ය ආයතන
16. වාහන සේවා ස්ථාන
17. තොග බඩු ගබඩා කිරීම
18. රථ වාහන වෙළෙඳාම
19. දුරකතන සම්ප්‍රේෂණ කුළුණු මගින් සේවා සැපයීමේ ස්ථාන
20. දෘෂ්ටි පරීක්ෂකයින්
21. අවමංගල්‍ය සේවා කටයුතු සැපයීම
22. පුද්ගලික අධ්‍යාපන ආයතන පවත්වාගෙන යාම
23. ගෘහ නිර්මාණ සැලසුම් ආයතන
24. සිල්ලර වෙළෙඳාම
25. දුම්කකොළ/සුරුට්ටු ගබඩා කිරීම/විකිණීම
26. සිගරැට් තොග වෙළෙඳාම
27. ස්වර්ණාභරණ වෙළෙඳාම
28. ඡායාරූප ශාලා
29. ධාන්‍ය ගබඩා කිරීම හා වෙළෙඳාම
30. පරණ යකඩ/හිස් බෝතල්/ගෝනි විකිණීම
31. හුණු/සිමෙන්ති වෙළෙඳාම
32. පොහොර වෙළෙඳාම
33. ඇළුමිනියම් භාණ්ඩ වෙළෙඳාම
34. ප්ලාස්ටික් භාණ්ඩ වෙළෙඳාම
35. බොරළුවලක් පවත්වාගෙන යාම"
36. දැව ගෘහ භාණ්ඩ වෙළෙඳාම
37. වානේ ගෘහ භාණ්ඩ වෙළෙඳාම
38. බුලත්/පුවක් වෙළෙඳාම
39. පොල්තේල ගබඩා කිරීම/විකිණීම
40. කුකුළු ගොවිපලක් පවත්වාගෙන යාම
41. සත්ව ගොවිපලක් පවත්වගෙන යාම
42. එළවළු වෙළෙඳාම
43. පළතුරු වෙළෙඳාම
44. උත්සව භාණ්ඩ කුළියට දීම
45. විදුලි උපකරණ විකිණීම
46. උත්සව ශාලා පැවැත්වීම
47. වීඩියෝ පට විකිණීම
48. වේවැල් භාණ්ඩ වෙළෙඳාම
49. දැව ගබඩා/අලෙවිය
50. පුපුරණ ද්‍රව්‍ය/පතරොම් විකිණීම
51. සහල් විකිණීම
52. මාළු දැල් හා ආම්පන්න විකිණීම
53. ගුවන් විදුලි යන්ත්‍ර විකිණීම
54. රූපවාහිණී යන්ත්‍ර විකිණීම
55. මහන මැෂින් වෙළෙඳාම
56. සිනමා ශාලාවත් පවත්වාගෙන යාම
57. දේශීය හා විදේශීය දුරකතන සේවා මධ්‍යස්ථාන
58. සුවඳ විලවුන්, මනිබඩු වෙළෙඳාම
59. ගොඩනැගිලි උපකරණ වෙළෙඳාම
60. තීන්ත වෙළෙඳාම
61. ගෑස් ගබඩා කිරීම/විකිණීම
62. පුවත්පත් විකිණීම
63. පිත්තල භාණ්ඩ විකිණීම

64. ජංගම රථවල වෙළෙඳාම
65. ගිණිකෙළි භාණ්ඩ වෙළෙඳාම
66. ක්‍රීඩා භාණ්ඩ වෙළෙඳාම
67. විදුලි භාණ්ඩ වෙළෙඳාම
68. අත් මෙවලම් හා ජව මෙවලම් කට්ටල විකිණීම
69. රෙදිපිළි/සාප්පු බඩු වෙළෙඳාම
70. පාපැදි/පාපැදි අමතර කොටස් වෙළෙඳාම
71. මෝටර් සයිකල් වෙළෙඳාම
72. ටයර් ටියුබ් වෙළෙඳාම
73. ඡායා පිටපත් කිරීම
74. විද්‍යුත් තරාදි වෙළෙඳාම
75. මැටි භාණ්ඩ විකිණීම
76. පාවහන් අලෙවිය
77. පොත් පත් හා ලිපි ද්‍රව්‍ය වෙළෙඳාම
78. රෙක්ෂින් වර්ග වෙළෙඳාම
79. ශබ්ද විකාශන යන්ත්‍ර කුළියට දීම
80. විසිතුරු භාණ්ඩ වෙළෙඳාම
81. සත්ව ආහාර අලෙවිය
82. තේ කුඩු ගබඩා කිරීම හා විකිණීම
83. ලිහිසි තෙල් ගබඩා කිරීම/අලෙවිය
84. අලි සෆාරි ස්ථානයක් පවත්වාගෙන යාම
85. ජීප් සෆාරි ස්ථානයක් පවත්වාගෙන යාම
86. පශු වෛද්‍ය මධ්‍යස්ථානයක් පැවැත්වීම
87. කායවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.

12 - 806/3

කැකිරාව ප්‍රාදේශීය සභාව

2020 වර්ෂයට වාහන හා සත්ත්ව බද්දක් පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද කැකිරාව ප්‍රාදේශීය සභා රැස්වීමේදී තීරන අංක 606 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි,

ඉහත කී යෝජනාව,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය හා 148 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය යටතේ කැකිරාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර කැකිරාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේදී පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයෙහි තබාගන්නා සෑම තැනැත්තෙකුගෙන්ම එහි II තීරුවේ නිරූපිත බද්දක් 2020 වර්ෂය සඳහා අයකළ යුතු යැයි යෝජනා කරමි.

එච්. එම්. එස්. ඒ. බී. හේරත්,
සභාපති,
කැකිරාව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 30 වැනි දින,
කැකිරාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

		I වැනි තීරුව	*II වැනි තීරුව* රු. ශත
(1)	I.	මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
	II.	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා	
		(අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18 0
		(ආ) වෙළෙඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4 0
	III	සෑම කරත්තයක් සඳහා	20 0
	IV	සෑම අත් කරත්තයක් සඳහා	10 0
	V	සෑම රික්ෂෝවක් සඳහා	7 50
	VI	සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
	VII	සෑම ඇතෙකු සඳහා	50 0

2. විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

3. මෙම උපලේඛනයෙහි "වෙළඳ කාර්යය" යන්නට, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළෙඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12 - 806/4

කැකිරාව ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියෙන් කැකිරාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද කැකිරාව ප්‍රාදේශීය සභා රැස්වීමේ තීරන අංක 607 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි,

ඉහත කී යෝජනාව,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි උපවගන්තියේ (1) වන උපවගන්තියෙන් කැකිරාව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කැකිරාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි දියුණුකළ ප්‍රදේශවල පවතින සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල 2020 වාර්ෂික වටිනාකම සඳහා 2004 වර්ෂයේදී සිදු කරන ලද තක්සේරුව 2020 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට හතයි දශම පහක (7.5%) වරිපනම් බද්දක් පනවා අයකළ යුතු බවටත් යෝජනා කරමි.

තව ද 2020 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද කැකිරාව ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2020 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දිනට හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී

උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ 3 වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල කැකිරාව ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවකට අදාළ මුදලින් 5%ක වට්ටමක් අනුව ද කැකිරාව ප්‍රාදේශීය සභාවට ලබාදිය යුතු බවටත් නිවේදනය කරමි.

එච්. එම්. එස්. ඒ. බී. හේරත්,
සභාපති,
කැකිරාව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 30 වැනි දින,
කැකිරාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමු කාර්තුව	2020.01.31 දින හෝ ඊට පෙර	2020.01.31
දෙවන කාර්තුව	2020.04.30 දින හෝ ඊට පෙර	2020.04.30
තුන්වන කාර්තුව	2020.07.31 දින හෝ ඊට පෙර	2020.07.31
හතරවන කාර්තුව	2020.10.31 දින හෝ ඊට පෙර	2020.10.31

11 - 806/5

කැකිරාව ප්‍රාදේශීය සභාව

2020 වර්ෂයට ප්‍රචාරක දැන්වීම් ගාස්තු ගෙවීම

2017.06.07 දිනැති අංක 2022/32 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* උතුරු මැද පළාත් සභාවේ, පළාත් පාලන අමාත්‍යාංශයේ ගරු ලේකම්තුමා විසින් අනුමත කර, ප්‍රකාශයට පත්කොට ඇති පළාත් සභාවේ ස්ථිරත්වය නිවේදනය කිරීම මෙයෙන් යුත් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව කැකිරාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකරව 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද කැකිරාව ප්‍රාදේශීය සභා රැස්වීමේදී තීරණ අංක 608 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි,

එකී යෝජනාව,

2017.06.07 දිනැති අංක 2022/32 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* උතුරු මැද පළාත් සභාවේ, පළාත් පාලන අමාත්‍යාංශයේ, ගරු ලේකම්තුමා විසින් අනුමත කර, ප්‍රකාශයට පත්කොට ඇති පළාත් සභාවේ ස්ථිරත්වය නිවේදනය කිරීම මෙයෙන් යුත් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව කැකිරාව ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇලකට, දොළකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි වර්ග අඩි 1 කට නොඅඩු දැන්වීමක් හෝ ඉදිකිරීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තු ගෙවිය යුතු බවට යෝජනා කරමි.

එච්. එම්. එස්. ඒ. බී. හේරත්,
සභාපති,
කැකිරාව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 30 වැනි දින,
කැකිරාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

	විස්තරය	*එක් වර්ෂයකට හෝ එක් මාසයකට හෝ ඉන් කොටසකට ගාස්තුව*
		රු. ශ.
1.	බිත්තියක හෝ පුවරුවක හෝ ලැල්ලක ආධාරයෙන් ප්‍රදර්ශනය කරවා ඇති ස්ථිර (එක් පැත්තක) ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩි 1 ට	50 0
3.	තාවකාලික ප්‍රචාරක දැන්වීම් සඳහා වර්ග අඩියකට (බැනර්/කටවුට්) (දින 30ක කාල සීමාවක් සඳහා)	25 0

12 - 806/6

කැකිරාව ප්‍රාදේශීය සභාව

2020 වර්ෂයට ඉඩම් විකිණීම මත බදු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 154 (1) වැනි වගන්තියට අනුව කැකිරාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද කැකිරාව ප්‍රාදේශීය සභා රැස්වීමේදී තීරණ අංක 609 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි,

එකී යෝජනාව,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 154 (1) වැනි වගන්තියට අනුව කැකිරාව ප්‍රාදේශීය සභා බල සීමාව ඇතුළත යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කාරයෙකු ඔහුගේ සේවකයෙකු හෝ අනු නියෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියකින් හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් (1%) ක සමාන වන බද්දක් විකුණුම්කරු හෝ ඒ වෙන්දේසිකරු හෝ ඔහුගේ සේවකයා හෝ නියෝජිතයා විසින් කැකිරාව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට යෝජනා කරමි.

එච්. එම්. එස්. ඒ. බී. හේරත්,
සභාපති,
කැකිරාව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 30 වැනි දින,
කැකිරාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12 - 806/7

කැකිරාව ප්‍රාදේශීය සභාව

2020 වර්ෂයට සුසාන භූමි ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 127 වැනි වගන්තිය හා (231 වැනි අධිකාරය) සුසාන භූමි ආඥාපනතේ 03 වැනි වගන්තිය හා 17 සිට 20 වැනි වගන්ති අනුව කැකිරාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද කැකිරාව ප්‍රාදේශීය සභා රැස්වීමේ තීරණ අංක 610 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි,

එකී යෝජනාව,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 127 වැනි වගන්තිය හා (231 වැනි අධිකාරය) සුසාන භූමි ආඥාපනතේ 03 වැනි වගන්තිය හා 17 සිට 20 වැනි වගන්ති අනුව එම කාර්යයන් සඳහා එකී ආඥාපනතේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කැකිරාව ප්‍රාදේශීය සභාව තුළ ස්මාරක ඉදිකිරීම සඳහා පහත සඳහන් ආකාරයට ගාස්තු 2020 ජනවාරි මස 01 වැනි දින සිට දෙසැම්බර් මස 31 වැනි දින දක්වා ලිත් වර්ෂය තුළ පනවා අයකිරීමට යෝජනා කරමි.

	රු. ශත
භූමදානය සඳහා - වර්ග අඩියකට	25 0
වල බැඳීම සඳහා - වර්ග අඩියකට	50 0
ස්මාරකයක් ඉදිකිරීම	500 0

මෘත දේහයක් ආදාහනය කිරීම සඳහා :

	රු. ශත
ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ	9,000 0
ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිට	10,000 0

එච්. එම්. එස්. ඒ. බී. හේරත්,
සභාපති,
කැකිරාව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 30 වැනි දින,
කැකිරාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12 - 806/8

කැකිරාව ප්‍රාදේශීය සභාව

2020 වර්ෂයට - අයාලේ යන ගවයින් අල්ලා ගැනීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 66 වන වගන්තිය අනුව කැකිරාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද කැකිරාව ප්‍රාදේශීය සභා රැස්වීමේදී තීරණ අංක 611 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි,

එකී යෝජනාව,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 66 වන වගන්තිය අනුව අයාලේ යන ගවයින් අල්ලා ගැනීම නීත්‍යානුකූල වන බැවින්, ඒ සඳහා පහත පරිදි ගාස්තු අයකිරීමට යෝජනා කරමි.

		රු. ශත
1.	එක් ගවයෙක් අල්ලා ප්‍රවාහනය කිරීම සඳහා	2,500 0
2.	එකී කම්කරුවන් සඳහා	1,000 0
3.	දිනකට නඩත්තු වියදම	700 0
	මුළු එකතුව	**4,200 0**

එච්. එම්. එස්. ඒ. බී. හේරත්,
සභාපති,
කැකිරාව ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 30 වැනි දින,
කැකිරාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12 - 806/9

කැකිරාව ප්‍රාදේශීය සභාව

මිනින්දෝරු ගාස්තු අයකිරීම, පෙරසැරි ගාස්තු අයකිරීම 2020 වර්ෂය

නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ (268 අධිකාරය) අංක 19 හා 20 අනුව කැකිරාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද කැකිරාව ප්‍රාදේශීය සභා රැස්වීමේ තීරණ අංක 612 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි,

නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ (268 අධිකාරය) අංක 19 හා 20 අනුව කැකිරාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ මිනින්දෝරු සැලැස්මක් මගින් කොටස් කරනු ලබන විට ඒ, සෑම ඉඩමක් සඳහා මිනින්දෝරු සැලැස්මක් ප්‍රාදේශීය සභාවෙන් අනුමත කරවා ගත යුතු අතර, ඒ සඳහා ඉඩම්වල තක්සේරු වටිනාකමෙන් 1%ක් බදු වශයෙන් ද, 0.5% පෙරසැරි ගාස්තු වශයෙන් අය කිරීමට යෝජනා කරමි.

	රු. ශත
1. වීථිරේඛා සහතික නිකුත් කිරීමේ බලපත්‍ර ගාස්තුව	1,000 0
වීථිරේඛා සහතික නිකුත් කිරීමේ පරීක්ෂණ ගාස්තුව	500 0
2. ඉඩම් අනු බෙදුම් අනුමත කිරීමේ පරීක්ෂණ ගාස්තුව	500 0
ඉඩම් අනුබෙදුම් අනුමත කිරීමේ ඉල්ලුම්පතු ගාස්තුව	500 0
3. මිනින්දෝරු සැලසුම් අනුමත කිරීමේ පරීක්ෂණ ගාස්තුව	500 0
මිනින්දෝර සැලැස්ම අනුමත කිරීම ගාස්තු	500 0

4. ගොඩනැගිලි සැළසුම් අනුම කිරීම - UD ගාස්තු (අය කිරීම වර්ග අඩි ප්‍රමාණය අනුව)

ගෙබිමේ විශාලත්වය වර්ග මීටර්වලින්	*පදිංචිය සඳහා*	*වාණිජ හෝ වෙනත් භාවිත* *රු.*
45ට අඩු	500 0	1,000 0
45-90	1,500 0	2.000 0
91-180	2,500 0	3,000 0
181-270	3,500 0	4,000 0
271-450	4,500 0	6,000 0
451-675	5,500 0	8,000 0
676-900	6,500 0	10,000 0
901-1225	7,500 0	12,000 0
1225ට වැඩි	7.500 0	12,000 0
	ව.මී. 1226 ඉක්මවීමෙන් පසු සෑම ව.මී. 90ක් සඳහාම රු. 1,000 බැගින්	ව.මී. 1226 ඉක්මවීමෙන් පසු සෑම ව.මී. 90ක් සඳහාම රු. 1,250 බැගින්

i. වානිජ (පරීක්ෂණ ගාස්තු)	1,000 0
ii. නේවාසික (පරීක්ෂණ ගාස්තු)	500 0
i. ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තුව	500 0
ii. UD මිනින්දෝරු අයදුම්පත්‍ර ගාස්තුව	250 0
5. අනුකූලතා සහතික නිකුත් කිරීමේ ගාස්තුව	1,000 0
අනුකූලතා සහතික ඉල්ලුම්පත්‍ර ගාස්තුව	500 0
අනුකූලතා සහතික නිකුත් කිරීමේ පරීක්ෂණ ගාස්තුව	500 0

එච්. එම්. එස්. ඒ. බී. හේරත්,
සභාපති,
කැකිරාව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 30 වැනි දින,
කැකිරාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

කැකිරාව ප්‍රාදේශීය සභාව

විවිධ වෙන්කිරීම් සඳහා ගාස්තු - 2020 වර්ෂය

කැකිරාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද කැකිරාව ප්‍රාදේශීය සභා රැස්වීමේ තීරණ අංක 613 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඒ අනුව පහත උපලේඛනයේ සඳහන් කැකිරාව ප්‍රාදේශීය සභාව සතු යන්ත්‍ර සූත්‍ර සහ දේපළ දෛනික කුළී පදනම මත ලබාදීම සුදුසු බවට යෝජනා කරමි.

උපලේඛනය

		නැන්පත් මුදල *රු. ශත*	*ගෙවිය යුතු මුදල්* *රු. ශත*
1.	ක්‍රීඩාංගනය වෙන් කිරීමේ ගාස්තු - දිනකට	2,500 0	15,000 0
2.	පොදු සංදර්ශන සඳහා දිනකට		200 0
3.	නගර ශාලාව කුළියට දීම - දිනකට (නාට්‍ය හා සිනමා සංදර්ශන)		7,500 0
4.	නගර ශාලාව කුළියට දීම - දිනකට (රැස්වීම් වැඩමුළු සඳහා)		5,000 0
5.	නගර ශාලාව කුළියට දීම පැය 06කට (රැස්වීම් වැඩමුළු සඳහා)		2,500 0
6.	වානේ පුටු කුළියට දීම (දිනකට එක් පුටුවක්)		3 0
7.	ජල බවුසරය කුළියට දීම දිනකට		4,500 0
8.	ජල බවුසරය කුළියට දීම (දින භාගයක්)		2,500 0
9.	තණකොළ කපන යන්ත්‍රය කුළියට දීම - දිනකට (ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පාසල් සඳහා)		750 0
10.	තණකොළ කපන යන්ත්‍රය කුළියට දීම - දිනකට (ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත පාසල්)		2,000 0
11.	තණකොළ කපන යන්ත්‍රය කුළියට දීම - දිනකට (වෙනත් ස්ථාන සඳහා)		2,000 0
12.	ශබ්ද විකාශන යන්ත්‍රය කුළියට දීම - දිනකට		400 0
13.	ශබ්ද විකාශන යන්ත්‍රය කුළියට දීම - වරුවකට		200 0
14.	ප්‍රේක්ෂකාගාරය ඉහළ මහලය කුළියට දීම - දිනකට		2,000 0
15.	ප්‍රේක්ෂකාගාරය පහත මහලය කුළියට දීම - දිනකට		2,000 0
16.	ට්‍රැක්ටරය කුළියට දීම- දිනකට		1,200 0
17.	ට්‍රැක්ටරයෙන් කසළ බැහැරලීමට (එක් ගමන් වාරයකට)		500 0
18.	ජෙනරේටරය කුළියට දීම - දිනකට		500 0
19.	ජල පොම්පය කුළියට දීම - පැයකට		200 0
	වැඩිවන සෑම පැයකටම		80 0
20.	මෝටර් ග්‍රේඩරය කුළියට දීම - පැයකට		5,000 0
21.	බැකෝ ලෝඩරය (පැයකට)		3,000 0
22.	ෆෝටෝන් ටිපර් රථය කුළියට දීම		10,000 0
23.	ගල් රෝල (ප්‍රකම්පන යන්ත්‍රය ලොකු- ටොන් 05) කුළියට දීම - දිනකට (ප්‍රවාහන හා ඉන්ධන ඉල්ලුම්කරු විසින් සපයා ගත යුතුයි)		7,500 0
24.	කුඩා ගල් රෝල කුළියට දීම - දිනකට (ප්‍රවාහන හා ඉන්ධන ඉල්ලුම්කරු විසින් සපයා ගත යුතුයි)		3,500 0

25.	කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය කුළියට දීම - දිනකට	2,500 0
24.	ගලි බවුසරය කුළියට දීම :	
	පළමු බවුසරය	3,750 0
	දෙවන බවුසරය	2,750 0
	තෙවන බවුසරය (ප්‍රවාහනය සඳහා කි. මී. 1 ට රු. 150 බැගින් ගෙවිය යුතුය)	1,750 0

එච්. එම්. එස්. ඒ. බී. හේරත්,
සභාපති,
කැකිරාව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 30 වැනි දින,
කැකිරාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12 - 806/11

කැකිරාව ප්‍රාදේශීය සභාව

දීර්ඝ කාලීන බලපත්‍ර නිකුත්කිරීම සඳහා ගාස්තු අය කිරීම - 2020 වර්ෂය

කැකිරාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද කැකිරාව ප්‍රාදේශීය සභා රැස්වීමේ තීරණ අංක 614 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි,

කැකිරාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දීර්ඝ කාලීන බලපත්‍ර නිකුත්කළ යුතු ඉඩම් සඳහා පරීක්ෂා කිරීමේ ගාස්තු පහත සඳහන් ලෙස 2020 වසර සඳහා අය කිරීමට යෝජනා කරමි.

අනු. අංකය		*නේවාසික රු. ශ.*	*කෘෂිකාර්මික රු. ශ.*	*වාණිජ රු. ශ.*
1.	පර්චස් 40 දක්වා	200 0	1,000 0	1,000 0
2.	පර්චස් 80 දක්වා	500 0	2,000 0	2,000 0
3.	පර්චස් 160 දක්වා	1,000 0	4,000 0	4,000 0
4.	පර්චස් 160 ට වැඩි	2,000 0	5,000 0	5,000 0

එච්. එම්. එස්. ඒ. බී. හේරත්,
සභාපති,
කැකිරාව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 30 වැනි දින,
කැකිරාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12 - 806/12

වලල්ලාවිට ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

වලල්ලාවිට ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ නොවැම්බර් මස 21 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 6- I යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බද්ද, මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළදී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2020 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහ (5%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

උදේනි අතුකෝරල,
ගරු සභාපති,
වලල්ලාවිට ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 21 වැනි දින,
මීගහතැන්න,
වලල්ලාවිට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

''1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2019 වර්ෂයේ දී බලාත්මක කරන ලද සත්‍යාක්ෂණය කිරීම 2020 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී පනතේ 134 වන වගන්තියේ (03) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වලල්ලාවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ -

(අ) හෙක්ටයාර පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන්ම, එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක් ම මත 2020 වර්ෂය සඳහා රුපියල් 10 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

(ආ) ඉහත කී පනතේ 134 වන වගන්තියේ (3) වන උපවගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින්, වලල්ලාවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ iv (ආ) වන කොටසේ 1989 *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති හෙයින්, හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු වූ සෑම ඉඩමක් මත 2020 වර්ෂය සඳහා රුපියල් 10 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්, සහ

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 වන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කළ යුතු යැයි ද වලල්ලාවිට ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.''

වලල්ලාවිට ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

වලල්ලාවිට ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ නොවැම්බර් මස 21 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 6-I යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළදී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් බද්ද 2020 වර්ෂයේ ජනවාරි මස 31 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහ (5%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

උදේනි අතුකෝරල,
ගරු සභාපති,
වලල්ලාවිට ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 21 වැනි දින,
මීගහතැන්න,
වලල්ලාවිට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

''1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වලල්ලාවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2019 වර්ෂයේ වාර්ෂික වටිනාකම් 2020 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (01) වන උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට හයක (6%) ක වරිපනමක් 2020 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, සහ

ඒ වරිපනම්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කළ යුතු යැයි ද වලල්ලාවිට ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.''

12 - 632/2

වලල්ලාවිට ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

වලල්ලාවිට ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ නොවැම්බර් මස 21 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 6-I යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා පනවන ලද ඒ කර්මාන්ත බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

උදේනි අතුකෝරල,
ගරු සභාපති,
වලල්ලාවිට ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 21 වැනි දින,
මීගහතැන්න,
වලල්ලාවිට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

''1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර වලල්ලාවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ II වන තීරුවේ, ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2020 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර වලල්ලාවිට ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් වලල්ලාවිට ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

අනු. අංකය	*I වැනි තීරුව* *කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*II වැනි තීරුව* *ස්ථානයෙහි වාර්ෂික වටිනාකම*		
		රු. 750 ට අඩු අවස්ථාවක	*රු. 750 ට වැඩි රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ට වඩා වැඩි අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	ගඩොල් හෝ උළු පෝරණුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	අත් යන්ත්‍ර මගින් කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	පපඩම් නිෂ්පාදනය හා විකිණීම	500 0	750 0	1,000 0
4.	මැටි භාණ්ඩ නිෂ්පාදනය හා විකිණීම	500 0	750 0	1,000 0
5.	බීඩි එතීම හා විකිණීම	500 0	750 0	1,000 0
6.	මිණිරන් ශුද්ධ කිරීම හා විකිණීම	500 0	750 0	1,000 0
7.	මෙට්ට නිෂ්පාදන ස්ථානයක් පැවැතවීම	500 0	750 0	1,000 0
8.	ඔරලෝසු අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
9.	හඳුන්කුරු නිෂ්පාදනය හා විකිණීම	500 0	750 0	1,000 0
10.	තේ කර්මාන්ත ශාලා සඳහා	500 0	750 0	1,000 0
11.	ක්‍රේප් රබර් නිෂ්පාදන ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
12.	පාවහන් නිෂ්පාදනය හා අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
13.	මිනිරන් පතලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
14.	ටයර් ට්‍යුබ් අළුත්වැඩියාව	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
	කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය	*ස්ථානයෙහි වාර්ෂික වටිනාකම*		
අනු. අංකය		*රු. 750 ට අඩු අවස්ථාවක*	*රු. 750 ට වැඩි රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ට වඩා වැඩි අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
15.	බීරළු කැපීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
16.	රබර් කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
17.	මිරිස්ගල් වංගෙඩි ගල්වලින් නිපදවීම	500 0	750 0	1,000 0
18.	මිරිස්කුඩු, සිල්ලර කුඩු, ආදිය පැකට් කර විකිණීම	500 0	750 0	1,000 0
19.	බිම්මල් වගා කිරීම හා විකිණීම	500 0	750 0	1,000 0
20.	රබර් රෝලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
(ඇ) 134 වන වගන්තියේ (6) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර යටෝක්ත වාර්ෂික වරිපනම් 2020 වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දින වලින් අවසන් වන කාර්තු තුළදී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව 2019 ඔක්තෝබර් මස 17 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ අංක 6 : 1 : 8 (2) යෝජනාව යටතේ ඉදිරිපත් කර ඇති යෝජනාව ඒකමතිකව අනුමත කරන බව මම මෙයින් මහජනතාවට දන්වමි.

ඒ. වී. සරත් කුමාර,
සභාපති,
ඉමදූව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 17 වැනි දින,
ඉමදූව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය,
ඉමදූව.

12 - 643/2

ඉමදූව ප්‍රාදේශීය සභාව

කර්මාන්ත බදු පැනවීම- 2020

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉමදූව ප්‍රාදේශීය සභාවේ 2020 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බව සභාව විසින් තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

එම පනතේ 150 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර ඉමදූව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ 1 වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම එම උපලේඛනයේ 11 වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණය අනුව වූ කර්මාන්ත බද්දක් 2020 වර්ෂයේදී පනවා අය කිරීමට ද,

(ආ) 2019.12.31 වැනි දින පැවති යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් 2020 අප්‍රේල් 01 වැනි දිනට ප්‍රථම ඉමදූව ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බව ද,

(ඇ) 2020 ආරම්භ කරනු ලබන යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විට එම බද්ද කර්මාන්තය මාස 03ක් ඇතුළත ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බව 2019 ඔක්තෝබර් 17 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ අංක 6:1:8 (3) යෝජනාව යටතේ ඉදිරිපත් කර ඇති යෝජනාව ඒකමතිකව අනුමත කරන බව මම මෙයින් මහජනතාවට දන්වමි.

ඒ. වී. සරත් කුමාර,
සභාපති,
ඉමදූව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 17 වැනි දින,
ඉමදූව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය,
ඉමදූව.

උපලේඛනය

I වැනි තීරුව *කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*II වැනි තීරුව* *වාර්ෂික වටිනාකම*		
	වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක	*වටිනාකම රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන විට*	*වටිනාකම රු. 1,500 ඉක්මවන විට*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
1. පා පැදි අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2. කම්මලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3. කොප්පරා නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4. වී මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5. ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6. තෙල් මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7. වඩු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8. කොහු මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9. ආයුර්වේද බෙහෙත් ද්‍රව්‍ය විකිණීම	500 0	750 0	1,000 0
10. බැටරි චාර්ජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11. ටේලර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12. ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13. පොල් ලී මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14. පොල් ලෙලි පෙඟවීම සඳහා කොටුවක් පවත්වාගෙන යාම (බඹයක් හෝ ඉන් කොටසක්)	500 0	750 0	1,000 0
15. පා පැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16. පාවහන් හෝ කුඩ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

12 - 643/3

ඉමඳූව ප්‍රාදේශීය සභාව

ව්‍යාපාර බදු අය කිරීම - 2020

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉමඳූව ප්‍රාදේශීය සභාවේ 2020 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බව සභාව විසින් තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

එම පනතේ 152 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඉමඳූව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 11 වන උප ලේඛනයේ සඳහන් යම් ව්‍යාපාරයක් 2020 වර්ෂයේදී පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තෙක් මත එකී ව්‍යාපාරයේ 2019 වර්ෂයේ ආදායම මත 1 වන උපලේඛනයේ අනු ප්‍රමාණය අනුව 11 වන උප ලේඛනයේ නිරූපිත ව්‍යාපාර සම්බන්ධයෙන් වූ බද්දක් පනවා අය කිරීමටත් සහ,

3 වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්දට යටතේ සෑම තැනැත්තෙකු විසින්ම යටෝක්ත බද්ද 2020 වර්ෂයේ ජුනි මස 30 දිනට ප්‍රථම සභාව වෙත ගෙවිය යුතු බව 2019 ඔක්තෝබර් 17 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ අංක 6:1:8 (4) යෝජනාව යටතේ ඉදිරිපත් කර ඇති යෝජනාව ඒකමතිකව අනුමත කරන බව මම මෙයින් මහජනතාවට දන්වමි.

ඒ. වී. සරත් කුමාර,
සභාපති,
ඉමඳුව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 17 වැනි දින,
ඉමඳුව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය,
ඉමඳුව.

උප ලේඛනය

අංකය	*බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය*	*ගෙවිය යුතු බද්ද රු. ශත*
01	රු. 6,000 නොඉක්ම වන අවස්ථාවක	නැත
02	රු. 6,000 ඉක්ම වන නමුත් 12,000 නොඉක්මවන විට	90.00
03	රු. 12,000 ඉක්ම වන නමුත් 18,750 නොඉක්මවන විට	180.00
04	රු. 18,750 ඉක්ම වන නමුත් 75,000 නොඉක්මවන විට	360.00
05	රු. 75,000 ඉක්ම වන නමුත් 150,000 නොඉක්මවන විට	1,200.00
06	රු. 150,000 ඉක්ම වන විට	3,000.00

අදාළ වන ව්‍යාපාර :-

01. වාණිජ හා ග්‍රාමීය බැංකු
02. මුදල් ණයට දෙන්නන්
03. උකස් බඩු ගන්නන්
04. රක්ෂණ නියෝජිතවරුන්
05. දේපළ වෙළඳ සමාගම්
06. සුපිරි වෙළඳසැල් (ෆුඩ් සිටි)
07. සිල්ලර/ තොග වෙළඳසැල්
08. පෞද්ගලික අධ්‍යාපන ආයතන
09. කොන්ත්‍රාත්කරුවන්
10. ගෘහ නිර්මාණ ශිල්පීය ආයතන
11. රියදුරු පුහුණු පාසල්
12. පෞද්ගලික බස්රථ ව්‍යාපාරිකයින්
13. පෞද්ගලික ගණන් පරීක්ෂණ ආයතන
14. මොටර් රථ/ යතුරු පැදි/ ත්‍රිරෝද රථ විකිණීමේ නියෝජිත ආයතන
15. ඇගළුම් කම්හල්
16. කාමර 10ට වැඩි සංචාරක ලැගුම්හල්
17. කරගල් කැඩීමේ ස්ථාන (ගල්වල)
18. යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යාම
19. දැව ගබඩා
20. තේ කර්මාන්ත ශාලා
21. කළුගල් ඇඹරීමේ යන්ත්‍රාගාර (ගල් මොල්)
22. ආයුර්වේද වෛද්‍ය සම්භාහන මධ්‍යස්ථාන
23. වෛද්‍ය රසායනාගාර
24. බටහිර වෛද්‍ය මධ්‍යස්ථාන
25. මෝටර් රථ වාහන/ යතුරු පැදි/ ත්‍රී රෝද රථ සේවා කරන ස්ථාන

26. ඉන්ධන පිරවුම්හල්
27. හෝටලයක්, ලැගුම් හලක්, උත්සව ශාලාවක් පවත්වාගෙන යාම
28. යෝගට් නිෂ්පාදන ආයතන
29. කොන්ක්‍රීට් නිෂ්පාදන ආයතන
30. දුරකථන සංඥා කුළුණු
31. කර්මාන්තශාලා හිමියන්
32. විදුලි උපකරණ විකිණීමේ ස්ථාන
33. පරිගණක හෝ පරිගණක උපාංග අලෙවිය
34. දිවා සුරකුම් මධ්‍යස්ථාන
35. ස්වර්ණාභරණ අලෙවි ස්ථාන
26. දන්ත ශල්‍යාගාර
37. පශු වෛද්‍ය මධ්‍යස්ථාන
38. පරිගණක පුහුණු කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම
39. පාවිච්චි කරන ලද පා පැදි/ යතුරු පැදි/ මෝටර් වාහන විකිණීමේ ස්ථාන
40. අලෙවි නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
41. ධීවර අලෙවි සැලක් පවත්වාගෙන යාම
42. වාහන දුම් පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම
43. කැටගල් නිෂ්පාදනය කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම
44. ලී බඩු/ ගෘහ භාණ්ඩ අලෙවි සැලක් පවත්වාගෙන යාම
45. බැංකු සේවා සැපයුම් ස්ථාන
46. ෆාමසියක් පවත්වාගෙන යාම
47. නිමි ඇඳුම් අලෙවි සැලක් පවත්වාගෙන යාම
48. යතුරු පැදි අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
49. ජංගම දුරකථන අලෙවිය/ අලුත්වැඩියාව
50. ත්‍රී රෝද රථ/ යතුරුපැදි අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
51. ඡායා රූප ශාලාවක් පවත්වාගෙන යාම
52. පොත්පත්, පුවත්පත් හෝ ලිපි ද්‍රව්‍ය විකිණීම
53. වෙල්ඩින් වැඩපළක් පවත්වාගෙන යාම
54. පාවහන් අලෙවි කිරීම හෝ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
55. ගී පටිගත කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම (වීඩියෝ සෙන්ටර්)
56. හාඩ්වෙයාර්
57. සිමෙන්ති ගඩොල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
58. විදුලි උපකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
59. ලී බඩු සාප්පු
60. කුලුබඩු අලවිය
61. නාම පුවරු හා බැනර් ඇඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
62. පා පැදි අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
63. සාප්පු බඩු/ ජුවලරි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
64. වැලි ගෙනවිත් බෙදා හරින ස්ථානයක් පවත්වාගෙන යාම
65. ප්ලාස්ටික් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
66. යතුරු ලියනය හා බදු උපදේශන ස්ථානයක් පවත්වාගෙන යාම
67. සංගීත භාණ්ඩ විකිණීම හෝ බදු දීම
68. තෑගි භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
69. අටපිරිකර පූජා භාණ්ඩ ගබඩා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
70. පිත්තල භාණ්ඩ විකිණීම
71. ශබ්ද විකාශන උපකරණ විදුලි උත්පාදක යන්ත්‍ර බදු දීම
72. පිඟන් බඩු හෝ වීදුරු බඩු විකිණීම
73. ශීතකරණ හෝ අධිශීතරකණ අලුත් වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
74. කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම
75. වේවැල් භාණ්ඩ නිපදවීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
76. පාවිච්චි කරන ලද වාහන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
77. කොන්ක්‍රීට් සිලින්ඩර විකිණීම

78. ගඩොල් හෝ උළු ගබඩා කර තැබීම
79. පින්තූර රාමුකරන ස්ථානයක් පවත්වාගෙන යාම
80. වාත්තු වැඩපලක් පවත්වාගෙන යාම
81. සත්ව ආහාර ගබඩා කිරීම හෝ විකිණීම
82. තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු, සීනි සහ සහල් ගබඩා කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
83. කලර් ලැබ් එකක් පවත්වාගෙන යාම
84. මදුරු දැල් නිෂ්පාදනය හෝ විකිණීම
85. රබර් මිලට ගැනීමේ/ විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
86. අලුත් හෝ පාවිච්චි කරන ලද ටයර් හෝ ටියුබ් ගබඩා කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
87. තීන්ත වර්ග අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
88. ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
89. ඇස් කණ්නාඩි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
90. කරවල හෝ ජාඩි ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
91. ටයර් ටියුබ් වොල්කැනයිසින් කිරීම
92. දේශීය විදේශීය සංචාරකයින් සඳහා බෝට්ටු සේවය (ගංඟාවල/ ඔයවල්වල)
93. දේශීය විදේශීය සංචාරකයින් සඳහා ඔරු පාරු/ අඟුල් සේවය (ගංඟාවල/ ඔයවල්වල)
94. මෝටර් රථ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
95. ග්‍රොසරියක් පවත්වාගෙන යාම
96. සිල්ලර අලෙවි සැලක් පවත්වාගෙන යාම
97. එළවළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
98. පළතුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
99. දර මඩුවක් පවත්වාගෙන යාම
100. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
101. ලොතරැයි ටිකට් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
102. කුළු බඩු අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
103. මල්පැල හෝ වෙනත් පැල තවානක් පවත්වාගෙන යාම
104. ශාරීරික වර්ධන මධ්‍යස්ථානයක පවත්වාගෙන යාම
105. වළං වෙළඳාම හා මැටි භාණ්ඩ අලෙවිය
106. විසිතුරු මසුන් විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
107. දේශීය බෙහෙත් ශාලාවක් (ආයුර්වේද) පවත්වාගෙන යාම
108. එල්. පී. ගෑස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
109. තැඹිලි කුරුම්බා හෝ පොල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
110. පා පැදි අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
111. සහල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
112. මස් විකිණීම
113. මාළු ලෑල්ලක් පවත්වාගෙන යාම
114. ආයුර්වේද බෙහෙත් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

12 - 643/4

ඉමඳූව ප්‍රාදේශීය සභාව

බලපත්‍ර ගාස්තු පැනවීම 2020

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉමඳූව ප්‍රාදේශීය සභාවේ 2020 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බව සභාව විසින් තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149, 150, 151 සහ 152 වැනි වගන්ති ප්‍රකාර ඉමඳූව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත සඳහන් උප ලේඛන වල දක්වා ඇති පරිදි ඇතැම් ව්‍යාපාර සම්බන්ධයෙන් ස්ථානයේ වාර්ෂික වටිනාකම මත පදනම් වූ වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් 2020 වර්ෂයට පනවා අය කිරීමටත් මෙම බලපත්‍ර ගාස්තු 2020 මාර්තු 31 දිනට පෙර ගෙවිය යුතු බව 2019 ඔක්තෝබර්

17 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ අංක 6:1:8 (5) යෝජනාව යටතේ ඉදිරිපත් කර ඇති යෝජනාව ඒකමතිකව අනුමත කරන බව මම මෙයින් මහජනතාවට දන්වමි.

ඒ. වී. සරත් කුමාර,
සභාපති,
ඉමඳුව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 17 වැනි දින,
ඉමඳුව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය,
ඉමඳුව.

කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*වාර්ෂික වටිනාකම රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන විට*	*වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන විට*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
1. බේකරි	500 0	750 0	1,000 0
2. බත් කඩ, ආපනශාලා	500 0	750 0	1,000 0
3. තේ කඩ, ආපනශාලා, භෝජනාගාර	500 0	750 0	1,000 0
4. කිරි පෙට්ටියක්, කිරි හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන	500 0	750 0	1,000 0
6. ලොන්ඩරි	500 0	750 0	1,000 0
7. කොන්ඩා සැකසීමේ ස්ථාන, බාබර් සාප්පු හා සැලුන් සහ රූපලාවන්‍යාගාර	500 0	750 0	1,000 0
8. ස්නැක් බාර්	500 0	750 0	1,000 0
9. රසකැවිලි නිෂ්පාදන හෝ විකිණීම	500 0	750 0	1,000 0
10. පිහිනුම් තටාකයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11. අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12. කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13. සංචාරක වෙළඳුන් (ආහාරපාන)	500 0	750 0	1,000 0
14. සංචාරකයින් සඳහා හෝටලයක් හෝ නිවාඩු නිකේතනයක් පැවැත්වීම (1968 අංක 15 දරන සංචාරක සංවර්ධන පනත ප්‍රකාර පසුගිය වර්ෂයේ ලැබීම මත 1%ක් ගෙවිය යුතුය.)			

12 - 643/5

ඉමඳුව ප්‍රාදේශීය සභාව

රථ වාහන සහ සතුන් පිළිබඳ බදු පැනවීම 2020

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉමඳුව ප්‍රාදේශීය සභාවේ 2020 වර්ෂය සඳහා රථවාහන සහ සතුන් පිළිබඳ බදු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බව සභාව විසින් තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තියේ කියවිය යුතු 148 වන වගන්තිය සහ 4 වන උපලේඛනයේ විධි විධාන වලින් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉමඳුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2020 වර්ෂයේදී පහත

උපලේඛනයේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබාගන්නා සෑම තැනැත්තෙකු මතම ඊට අනුරූපිත සම්බන්ධයෙන් නිරූපිත බද්දක් පනවා අය කිරීමටත් සභාව වෙත ගෙවිය යුතු බව 2019 ඔක්තෝබර් මස 17 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ අංක 6:1:8 (6) යෝජනාව යටතේ ඉදිරිපත් කර ඇති යෝජනාව ඒකමතිකව අනුමත කරන බව මම මෙයින් මහජනතාවට දන්වමි.

ඒ. වී. සරත් කුමාර,
සභාපති,
ඉමඳුව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝම්බර් මස 17 වැනි දින,
ඉමඳුව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය,
ඉමඳුව.

උපලේඛනය

	රු ශත
මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා, සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලය හෝ බයිසිකලයක්, කාරයක් හෝ කරත්තයක් සඳහා	25.00
(අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18.00
(ආ) වෙළෙඳ නොවන කාර්ය සඳහා යොදවන්නේ නම්	4.00
සෑම කරත්තයක් සඳහා	20.00
සෑම අත් කරත්තයක් සඳහා	10.00
සෑම රික්ෂෝවක් සඳහා	7.00
සෑම අශ්වයෙකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා	15.00
සෑම ඇතෙකු සඳහා	50.00

12 - 643/6

ඉමඳුව ප්‍රාදේශීය සභාව

සති පොළ බදු සහ තාවකාලික වෙළෙඳසැල් බදු පැනවීම - 2020

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉමඳුව ප්‍රාදේශීය සභාවේ 2020 වර්ෂය සඳහා සති පොළ බදු සහ තාවකාලික වෙළඳසැල් බදු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බව සභාව විසින් තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 119 වන වගන්තිය ප්‍රකාරව ඉමඳුව ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ 2020 වර්ෂය සඳහා සතිපොළ බදු අයකිරීමට සහ තාවකාලික වෙළෙඳසැල් වලින් බදු පැනවීමට විධානය කිරීමට ඉමඳුව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව 2019 ඔක්තෝබර් මස 17 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ අංක 6:1:8 (7) යෝජනාව යටතේ ඉදිරිපත් කර ඇති යෝජනාව ඒකමතිකව අනුමත කරන බව මම මෙයින් මහජනතාවට දන්වමි.

ඒ. වී. සරත් කුමාර,
සභාපති,
ඉමඳුව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 17 වැනි දින,
ඉමඳුව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය,
ඉමඳුව.

උපලේඛනය

		රු ශත
01.	වර්ග අඩි 01 සිට 05 දක්වා	100.00
02.	වර්ග අඩි 06 සිට 10 දක්වා	150.00
03.	වර්ග අඩි 11 සිට 15 දක්වා	200.00
04.	වර්ග අඩි 16 සිට 20 දක්වා (ඊට වැඩිවන සෑම ස්ථානයකින්ම වර්ග අඩියට රු. 10.00 බැගින්)	250.00
05.	අයිස් ක්‍රීම් වෑන් රථයක් හෝ ජංගම වෙළෙඳ රථයක් සඳහා	250.00
06.	ජංගම වෙළෙඳ ප්‍රචාරක දැන්වීම් අලෙවි නියෝජිත රථයක් සඳහා (පොළ භූමිය තුළ හෝ ඉන් පිටත ඕනෑම දිනක)	1,000.00
07.	ජංගම රසකැවිලි වෙළෙඳාම සඳහා	150.00
08.	සංචාරක තොග වෙළෙඳුන් සඳහා (තොග/ සිල්ලර)	300.00
09.	රෙදි අලෙවි කරන සංචාරක වෑන් රථ සහ ඇළුමිනියම් බඩු, පිඟන් බඩු හෝ ප්ලාස්ටික් බඩු, රෙදිපිළි, තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් හෝ අලෙවි කරන්නන් සඳහා (වෑන් රථ තුළ තබාගෙන පොළ භූමිය තුළ හෝ ඉන් පිටත ඕනෑම දිනක)	250.00
10.	පොළ භූමියෙහි ඉදිකර ඇති වෙළෙඳ කුටි කුටියක් සඳහා I අදියර කුටියක් සඳහා II අදියර	300.00 150.00
11.	සෑම තාවකාලික කඩ කාමරයක් සඳහා (වර්ග අඩි 20ක ප්‍රමාණයක්)	200.00

තාවකාලික වෙළෙඳසැල් බදු පැනවීම

උපලේඛනය

		රු ශත
01.	වර්ග අඩි 01 සිට 05 දක්වා	80.00
02.	වර්ග අඩි 06 සිට 10 දක්වා	100.00
03.	වර්ග අඩි 11 සිට 15 දක්වා	150.00
04.	වර්ග අඩි 16 සිට 25 දක්වා	200.00
05.	වර්ග අඩි 26 සිට 50 දක්වා	250.00
06.	වර්ග අඩි 51 සිට 100 දක්වා	300.00
07.	වර්ග අඩි 101 සිට 150 දක්වා	350.00
08.	වර්ග අඩි 151 සිට 200 දක්වා	400.00
09.	වර්ග අඩි 201 සිට 300 දක්වා	500.00
10.	වර්ග අඩි 301 සිට 400 දක්වා	600.00
11.	වර්ග අඩි 401 සිට 500 දක්වා	700.00
12.	ඊට වැඩි වන සෑම අවස්ථාවකදීම	1,000.00
13.	අයිස් ක්‍රීම් වෑන් රථයකින්	200.00
14.	අයිස් ක්‍රීම් බයිසිකලයකින්	100.00
15.	ජංගම වෙළෙඳාම් කඩල - රසකැවිලි සඳහා	150.00
16.	පෞද්ගලික රථ ගාල් සඳහා	250.00
17.	පාපැදි හා යතුරු පැදි ආරක්ෂා කරන ස්ථාන සඳහා	200.00

ඉමඳූව ප්‍රාදේශීය සභාව

සභාව සතු පොදු ක්‍රීඩාංගනවලින් බදු පැනවීම 2020 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉමඳූව ප්‍රාදේශීය සභාවේ 2020 වර්ෂය සඳහා සතු පොදු ක්‍රීඩාංගනවලින් බදු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බව සභාව විසින් තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ වගන්තිය ප්‍රකාරව ඉමඳූව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල 2020 වර්ෂය සඳහා ඉමඳූව ප්‍රාදේශීය සභාව සතු පොදු ක්‍රීඩාංගන බදු සභාව වෙත ගෙවිය යුතු යැයි විධානය කිරීමට ඉමඳූව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව 2019 ඔක්තෝබර් මස 17 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී අංක 6:1:8 (8) යෝජනාව යටතේ ඉදිරිපත් කර ඇති යෝජනාව ඒකමතිකව අනුමත කරන බව මම මෙයින් මහජනතාවට දන්වමි.

ඒ. වී. සරත් කුමාර,
සභාපති,
ඉමඳූව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 17 වැනි දින,
ඉමඳූව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය,
ඉමඳූව.

උපලේඛනය

		රු ශත
01.	වෙළෙඳ නොවන කටයුත්තක් සඳහා එක් දිනකට	500.00
02.	වෙළෙඳ කටයුත්තක් සඳහා එක් දිනකට	
I.	වර්ග අඩි 01 - 100 දක්වා	250.00
II.	වර්ග අඩි 101 - 250 දක්වා	500.00
III.	වර්ග අඩි 251 - 500 දක්වා	750.00
IV.	වර්ග අඩි 501 - 1,000 දක්වා	1,000.00
V.	සම්පූර්ණ ක්‍රීඩාංගනය සඳහා	2,000.00

12 - 643/8

ඉමඳූව ප්‍රාදේශීය සභාව

පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු පැනවීම - 2020 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉමඳූව ප්‍රාදේශීය සභාවේ 2020 වර්ෂය සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බව සභාව විසින් තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන පාරිසරික පනතේ අංක 23 වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව වන සම්පත් හා පාරිසරික අමාත්‍යාංශය මගින් පවරා ඇති බලතල ප්‍රකාරව ඉමඳූව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ආරම්භ කොට පවත්වාගෙන යනු ලබන පහත උප ලේඛනයේ දැක්වෙන ව්‍යාපාර හා කර්මාන්ත සම්බන්ධයෙන් අංක 1533/16 සහ 2008.01.25 දිනැති හා 1534/18 දරන 2008.02.01 දිනැති සංශෝධිත ගැසට් නිවේදන යටතේ සංශෝධිත පනවන ලද රෙගුලාසිවලට අනුකූලව එකී ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන්නන් විසින් අදාළ වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි ඉදිරියට උපරිම වර්ෂ තුනකට

රු. 4,000ක බලපත්‍ර ගාස්තුවක් මෙම ප්‍රදේශීය සභාව වෙත ගෙවා අදාළ පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු බව 2019 ඔක්තෝබර් මස 17 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ අංක 6:1:8 (9) යෝජනාව යටතේ ඉදිරිපත් කර ඇති යෝජනාව ඒකමතිකව අනුමත කරන බව මම මෙයින් මහජනතාවට දන්වමි.

ඒ. වී. සරත් කුමාර,
සභාපති,
ඉමඳුව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 17 වැනි දින,
ඉමඳුව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය,
ඉමඳුව.

උපලේඛනය

පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ක්‍රියාකාරකම් :

01. සියලුම වාහන ඉන්ධන පිරවුම් හල් (ද්‍රව පෙට්‍රෝලියම් හා ද්‍රවිකෘත පෙට්‍රෝලියම් වායු)
02. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන ඉටි පන්දම් නිෂ්පාදන කර්මාන්ත.
03. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවන පොල් තෙල් සිදීමේ කර්මාන්ත.
04. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවන මධ්‍යසාර අඩංගු නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.
05. වියලි ක්‍රියාවලි සහිත වී මෝල්
06. මාසික නිෂ්පාදන ධාරිතාව කිලෝ ග්‍රෑම් 1000කට අඩුවන ඇඹරුම් හල්
07. දුම් කොළ චේලීමේ කර්මාන්ත
08. සල්ෆර් දුම් ගැස්සීම සහිත එක් ක්‍රියාවලියකදී නිෂ්පාදන ධාරිතාව කිලෝ ග්‍රෑම් 500 හෝ එයට වැඩි ධාරිතාවක් සහිත කුරුදු දුම් ගැස්සීමේ කර්මාන්ත.
09. කෑමට ගන්නා ලුණු ඇසිරීමේ හා සැකසීමේ කර්මාන්ත
10. ක්ෂණික තේ කර්මාන්තශාලා හැර අනෙකුත් තේ කර්මාන්ත ශාලා
11. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත
12. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
13. දිනකට මෙට්‍රික් ටොන් 20ට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත හුණු පෝරණු
14. ප්ලාස්ටර් ඔෆ් පැරිස් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත හෝ සේවකයන් 25ට අඩු සංඛ්‍යාවක් සේවයේ නියුක්ත පිඟන් මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
15. සියලු බෙලිකටු ඇඹරීමේ කර්මාන්ත
16. උළු සහ ගඩොල් කර්මාන්ත
17. එක් වරකට එක් බෝරවලක් බැගින් පුපුරවමින් මසකට ඝන මීටර 600ක නිෂ්පාදන ධාරිතාවයකට අඩු මිනිස් ශ්‍රමය හා පුපුරණ ද්‍රව්‍ය භාවිතයෙන් සිදු කරන ලබන කැණීම්.
18. දිනකට ඝන මීටර 50ට අඩු දැව ඉරුම් ධාරිතාවයක් ඇති ලී මෝල් හෝ බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතයෙන් දැව පිරියම් කිරීමේ කර්මාන්ත හෝ දැව පදම් කිරීමේ කර්මාන්ත
19. බහු කාර්ය යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත හෝ සේවකයින් 05ට වැඩි 25ට අඩු ගණනක් සේවයේ යෙදෙන දැව ආශ්‍රිත කර්මාන්ත
20. නේවාසික කාමර 05 හෝ ඊට වැඩි සහ 20ට අඩු හෝටල්, ආගන්තුක නිවාස සහ තානායම්
21. වාහනවල වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ හා සවිකිරීමේ කටයුතු හෝ විසිරි පින්තාරු කටයුතු සිදු කරන ගරාජ හැර අනෙකුත් වාහන අළුත් වැඩියා කිරීමේ හා නඩත්තු කිරීමේ කටයුතු සිදුකරන ගරාජ
22. ශීතකරණ හා වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හා සවිකිරීම සිදුකරන ස්ථාන
23. වාහන සේවා කටයුතු සිදු නොකරන කන්ටේනර් බහාලු පර්යන්ත
24. සේවකයින් 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන සියළුම විදුලි හෝ ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ අළුත්වැඩියා කිරීමේ ස්ථාන
25. ඊයම් උණු කිරීම සිදු කිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර

ඉමඳුව ප්‍රාදේශීය සභාව

ප්‍රචාරක දැන්වීම්, දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථා පැනවීම - 2020

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් වගන්තියෙන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉමඳුව ප්‍රාදේශීය සභාවේ 2020 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම්, දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථා පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බව සභාව විසින් තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, 1988.03.23 වැනි දින අංක 520/7 *අති විශේෂ ගැසට් පත්‍රයේ*, පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු ඇමතිතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත්කොට ඇති අතුරු ව්‍යවස්ථාවේ 28 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම/ දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර ඉමඳුව ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීථියකට, පාරකට, ඇළකට, මාවතකට, මුහුදකට හෝ අහසකට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උප ලේඛනයේ සඳහන් බලපත්‍ර ගාස්තුවක් 2020 වර්ෂයේ අය කිරීමට සභාව තීරණය කරන ලද බව ප්‍රකාශයට පත් කරමි. ගලවා ඉවත් කරන ලද දැන්වීම් පුවරු හෝ බැනර් නැවත ලබා ගැනීමේදී 10%ක සේවා ගාස්තුවක් අයකළ යුතු බව 2019 ඔක්තෝබර් මස 17 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ අංක 6:1:8 (10) යෝජනාව යටතේ ඉදිරිපත් කර ඇති යෝජනාව ඒකමතිකව අනුමත කරන බව මම මෙයින් මහජනතාවට දන්වමි.

ඒ. වී. සරත් කුමාර,
සභාපති,
ඉමඳුව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 17 වැනි දින,
ඉමඳුව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය,
ඉමඳුව.

උපලේඛනය

	මාසයකට හෝ ඉන් කොටසක් සඳහා රු. ශත	*ලිත් වර්ෂයක් සඳහා රු. ශත*
01. බිත්තියක හෝ පුරුවක ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීම් සඳහා සෑම වර්ග අඩියකටම (චිත්‍රපටි දැන්වීම් හැර)	50.00	200.00
02. ලෑල්ලක් හෝ ආධාරකයක් හෝ බැනරයක් හෝ කටවුට් මඟින් ප්‍රදර්ශනය කරනු ලබන හෝ ගමන් කරන වාහනයකට සම්බන්ධකර ප්‍රදර්ශනය කරනු ලබන (චිත්‍රපට දැන්වීමක් හැර) ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම	50.00	200.00
03. චිත්‍රපට දර්ශන ප්‍රචාර සඳහා ප්‍රදර්ශනය කරන දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම	50.00	200.00
04. බිත්තියක හෝ පුවරුවක හෝ ලෑල්ලක හෝ ආධාරකයක් මඟින් ප්‍රදර්ශනය කරන ප්‍රතිදීප්ත ප්‍රචාරක දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම	50.00	200.00

12 - 643/10

ඉමඳුව ප්‍රාදේශීය සභාව

ඉඩම් විකිණීම මත බදු පැනවීම - 2020

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉමඳුව ප්‍රාදේශීය සභාවේ 2020 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බව සභාව විසින් තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 154 (1) වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව ඉමඳුව ප්‍රදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ

අනාගාරයකින් විකුණනු ලබන අවස්ථාවක, එම ඉඩම් විකිණීමේ ලත් මුදලින් 1%ට සමාන බද්දක් විකුණුම්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් ඉමදූව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට විධානය කිරීමට ඉමදූව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව 2019 ඔක්තෝබර් මස 17 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ අංක 6:1:8 (11) යෝජනාව යටතේ ඉදිරිපත් කර ඇති යෝජනාව ඒකමතිකව අනුමත කරන බව මම මෙයින් මහජනතාවට දන්වමි.

ඒ. වී. සරත් කුමාර,
සභාපති,
ඉමදූව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝම්බර් මස 17 වැනි දින,
ඉමදූව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය,
ඉමදූව.

12 - 643/11

ඉමදූව ප්‍රාදේශීය සභාව

සමාජශාලා හා ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනතට අදාළ බදු පැනවීම - 2020 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉමදූව ප්‍රාදේශීය සභාවේ 2020 වර්ෂය සඳහා සමාජශාලා හා ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනතට අදාළ බදු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බව සභාව විසින් තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

1987 අංක 17 දරන සමාජශාලා ආඥාපනත සහ ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනත යටතේ බදු සහ බලපත්‍ර ගාස්තු 2020 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉමදූව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඉහත සඳහන් ආඥාපනත යටතේ මෙහි පනවා ඇති බදු හා බලපත්‍ර ගාස්තු පනවා අයකළ යුතු බව 2019 ඔක්තෝම්බර් මස 17 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ අංක 6:1:8 (12) යෝජනාව යටතේ ඉදිරිපත් කර ඇති යෝජනාව ඒකමතිකව අනුමත කරන බව මම මෙයින් මහජනතාවට දන්වමි.

ඒ. වී. සරත් කුමාර,
සභාපති,
ඉමදූව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 17 වැනි දින,
ඉමදූව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය,
ඉමදූව.

උපලේඛනය

1975 අංක 17 දරන සමාජශාලා සඳහා බලපත්‍ර දීමේ පනත

		රු. ශත
01.	ඉල්ලුම්පත්‍ර ගාස්තු	10.00
02.	වාර්ෂික බලපත්‍ර ගාස්තු	1,000.00

විනෝද බදු ආඥා පනත

විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ අලෙවි කරනු ලබන ටිකටිපත් වල මුළු වටිනාකමින් 10%ක විනෝද බද්දක්.

ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥා පනත

(176 වැනි අධිකාරිය) ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනතේ 3 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් පරිදි පැනවෙන ගාස්තුවක්

		රු. ශත
01.	දින 01ක් හෝ දින 07ක් නොඉක්මවන විට	250.00
02.	දින 07ක් ඉක්මවන විට ඉන් වැඩිවන සෑම දිනකටම	50.00

12 - 643/12

ඉමඳූව ප්‍රාදේශීය සභාව

වාහන නවතා තැබීමේ බදු පැනවීම - 2020 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉමඳූව ප්‍රාදේශීය සභාවේ 2020 වර්ෂය සඳහා වාහන නවතා තැබීමේ බදු ගාස්තු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බව සභාව විසින් තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඉමඳූව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇති වාහන නතර කිරීමේ ස්ථාන සඳහා වාහනවලින් පහත සඳහන් පරිදි 2020 වර්ෂයට බදු අය කිරීමට විධානය කිරීමට ඉමඳූව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව 2019 ඔක්තෝබර් මස 17 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ අංක 6:1:8 (13) යෝජනාව යටතේ ඉදිරිපත් කර ඇති යෝජනාව ඒකමතිකව අනුමත කරන බව මම මෙයින් මහජනතාවට දන්වමි.

ඒ. වී. සරත් කුමාර,
සභාපති,
ඉමඳූව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝම්බර් මස 17 වැනි දින,
ඉමඳූව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය,
ඉමඳූව.

උපලේඛනය

විස්තරය

	රු. ශත
මෝටර් බයිසිකලයක්	20.00
මෝටර් රථයකින්	100.00
වෑන් රථයකින්	150.00
බස් රථයකින්	200.00

12 - 643/13

ඉමඳූව ප්‍රාදේශීය සභාව

පෙරසැරි ගාස්තු, සේවා ගාස්තු, ආවරණ අනුමැතිය ලබාදීමේ ගාස්තු හා ඉමඳූව ප්‍රාදේශීය සභාව සතු දේපළ හා ඉමඳූව ප්‍රාදේශීය සභාව මගින් සපයනු ලබන සේවාවන් වෙනුවෙන් ගාස්තු අය කිරීම - 2020 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉමඳූව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සිදු කරනු ලබන සංවර්ධන කාර්යයන් සහ ඉඩම් අනුබෙදුම් මත අය කරනු ලබන පෙරසැරි ගාස්තු, සේවා ගාස්තු, ආවරණ අනුමැතිය ලබාදීමේ ගාස්තු, නාගරික සංවර්ධන අධිකාරි පනතේ බලතල ක්‍රියාත්මක කිරීමට පොදුවේ අදාළවන පරිදි ඉමඳූව ප්‍රාදේශීය සභාවේ දේපළ හා සේවාව වෙනුවෙන් 2020 වර්ෂය සඳහා පහත උපලේඛනයේ දක්වා ඇති ගාස්තු අයකළ යුතු බව 2019 ඔක්තෝබර් මස 17 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ අංක 6:1:8 (14) යෝජනාව යටතේ ඉදිරිපත් කර ඇති යෝජනාව ඒකමතිකව අනුමත කරන බව මම මෙයින් මහජනතාවට දන්වමි.

ඒ. වී. සරත් කුමාර,
සභාපති,
ඉමඳූව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 17 වැනි දින,
ඉමඳූව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය,
ඉමඳූව.

උපලේඛනය

විස්තර :

		රු. ශත
01.	විටීරේඛා සහ නොපවරා ගැනීමේ සහතික	500.00
02.	ඔප්පු සාරාංශ උද්දෘත පෝරම (ඒ, ටී පෝරම) ගාස්තු	200.00
03.	අනතුරුදායක ගස් පෝරම ගාස්තු - කොස් ගසක් සඳහා	750.00
04.	වෙනත් ඕනෑම ගසක් සඳහා	500.00
05.	ගොඩනැගිලි අයදුම්පත් පෝරම ගාස්තු	250.00
06.	ජාතික ගොඩනැගිලි පරීක්ෂණ අයදුම්පත් ගාස්තු (N.B.R.O ගාස්තු)	25.00
07.	වරිපනම් උද්දෘතයක් නිකුත් කිරීමේ පෝරම ගාස්තු	200.00
08.	ඉඩම් අනුබෙදුම් පෝරම ගාස්තු	200.00
09.	පුස්තකාල සාමාජික අයදුම්පත් ගාස්තු (වැඩිහිටි)	10.00
10.	පුස්තකාල සාමාජික ගාස්තු	100.00
11.	පුස්තකාල සාමාජික අයදුම්පත් ගාස්තු - පාසල් ළමුන් (14ට අඩු)	10.00
12.	සාමාජික ගාස්තු	20.00
13.	පෙර පාසල් සඳහා බඳවා ගැනීමේ අයදුම්පත් ගාස්තු	25.00
14.	පෙර පාසල් බඳවා ගැනීමේ ගාස්තු	500.00
15.	වෙනත් ඕනෑම සහතිකයක් නිකුත් කිරීම සඳහා ගාස්තු	200.00
16.	ආදාහනාහාර ගාස්තු (බල ප්‍රදේශය තුළ)	6,000.00
17.	ආදාහනාහාර ගාස්තු (බල ප්‍රදේශයෙන් පිටත)	7,000.00
18.	ජලබවුසරය සඳහා සේවා ගාස්තු අවමගුල් උත්සව සඳහා	1,500.00
19.	ජලබවුසරය සඳහා සේවා ගාස්තු වෙනත් කටයුතු සඳහා	2,500.0
	කි. මී. 10 ඉක්මවා යෑමේදී ප්‍රවාහන ගාස්තු	500.00
	කිලෝමීටර් 1ක් සඳහා	50.00
20.	ගල්රෝල මඟින් සේවා ගාස්තු පැය 8ක කාලයක් සඳහා	
	(ඉන්ධන නොමැතිව, රියදුරු සහිතව)	9,000.00
	පැය 8 ට වැඩිවන විට පැයකට	900.00
21.	බැකෝ සේවා ගාස්තු (බැ. මී. පැ 5ට අඩු විට)	
	බැ කෝ. මී. පැයක කාලයකට	2,200.00
	බැකෝ එක මීටර් පැය 5කට වඩා වැඩි (බැ. කෝ. මී. පැයකට)	
	කාලයක් සඳහා	2,000.00
	(සභාව මඟින් සිදුකරන සංශෝධනයන්ට යටත්ව)	

22. *ඉඩම් අනුබෙදුම පෙරසැරි ගාස්තු :*

	විස්තරය	*රු. ශත*
1.	පර්චස් 10ට අඩු	500.00
2.	පර්චස් 10-20 දක්වා	750.00
3.	පර්චස් 20 - 40 දක්වා	1,000.00
4.	පර්චස් 40 සිට අක්කරය දක්වා	1,200.00
5.	අක්කර 01ට වැඩි	2,000.00

ලංකාපුර ප්‍රාදේශීය සභාව

අතුරු ව්‍යවස්ථා යටතේ 2020 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු නියම කිරීම

ලංකාපුර ප්‍රාදේශීය සභාව විසින් 2019.10.22 වැනි දින පවත්වනු ලැබූ රැස්වීමේ තීරණ අංක (ඉ) 01 iv යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

යම් අතුරු ව්‍යවස්ථාවක නියමය යටතේ බලපත්‍ර ලබාගත යුතු යම් කර්මාන්තයක් හෝ වෙළෙඳාමක් පවත්වාගෙන යනු ලබන ස්ථානය වෙනුවෙන් 2020 වර්ෂය සඳහා ලංකාපුර ප්‍රාදේශීය සභාවෙන් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම වෙනුවෙන් ඒ යෝජනාවේ සඳහන් ආකාරයේ බලපත්‍ර ගාස්තුවක් අයකරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. එම්. එස්. පී. බී. විජේකෝන්,
සභාපති,
ලංකාපුර ප්‍රාදේශීය සභාව,
තල්පොත,
පොළොන්නරුව.

2019 නොවැම්බර් මස 27 වැනි දින,
ලංකාපුර ප්‍රාදේශීය සභාවේ දී ය.

වෙළෙඳ බලපත්‍ර ගාස්තු නියම කිරීම

''ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ ලංකාපුර ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ බලපත්‍ර ලබාගත යුතු යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා ලංකාපුර ප්‍රාදේශීය සභාව විසින් 2020 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් සම්බන්ධයෙන් ම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු 149 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව පහත උපලේඛනයේ I වන තීරුවේ නිරූපිත ප්‍රමාණයේ බලපත්‍ර ගාස්තුවක් නියම කර අයකර ගැනීමටත්,

එකී උපලේඛනයේ සඳහන් කර්මාන්ත හෝ ව්‍යාපාර අතරින් ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝ පිළිගෙන ඇති හෝටලයක් හෝ ආපන ශාලාවක් හෝ නවාතැන්පොළක් වන විට, එකී හෝටලයෙන් හෝ ආපන ශාලාවෙන් හෝ නවාතැන්පොළෙන් පසුගිය වර්ෂයේ ලත් ලැබීම්වලින් සියයට එක (1%) කට සමාන මුදල් ප්‍රමාණය හෝ ඉහත කී උපලේඛනයේ II වන තීරුවේ නිරූපිත මුදල් ප්‍රමාණය යන මුදල් ප්‍රමාණ දෙකෙන් වැඩි මුදලට සමාන ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් නියම කර අය කිරීමටත් ලංකාපුර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.''

අනු අංකය	*කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*I වැනි තීරුව*	*II වැනි තීරුව*	
		ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	ලැගුම් නිවාස	500 0	750 0	1,000 0
02.	හෝටල්	500 0	750 0	1,000 0
03.	බත්කඩ, ආපනශාලා සහ තේ හෝ කෝපි කඩ	500 0	750 0	1,000 0
04.	බේකරිය	500 0	750 0	1,000 0
05.	කිරිපිටි හා කිරි වෙළෙඳාම	500 0	750 0	1,000 0

අනු අංකය	*කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*I වැනි තීරුව*	*II වැනි තීරුව*	
		ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
06.	මාළු විකිණීම	500 0	750 0	1,000 0
07.	මස් විකිණීම	500 0	750 0	1,000 0
08.	අයිස් කර්මාන්ත ශාලා	500 0	750 0	1,000 0
09.	සිසිල් බීම කර්මාන්ත ශාලා	500 0	750 0	1,000 0
10.	ලොන්ඩරි	500 0	750 0	1,000 0
11.	ගවගාල්	500 0	750 0	1,000 0
12.	ඝාතක මඩු	500 0	750 0	1,000 0
13.	කොණ්ඩා සැකසීමේ සැලූන් හල් සහ බාබර් සාප්පු	500 0	750 0	1,000 0

12-534/1

ලංකාපුර ප්‍රාදේශීය සභාව

අතුරු ව්‍යවස්ථා යටතේ 2020 වර්ෂය සඳහා කර්මාන්ත බද්දක් නියම කිරීම

ලංකාපුර ප්‍රාදේශීය සභාව විසින් 2019.10.22 වැනි දින පවත්වන ලැබූ රැස්වීමේ තීරණ අංක (ඉ) 01 iv යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ :

2020 වර්ෂය සඳහා නියම කරන ලද ඒ කර්මාන්ත (වෙළෙඳාම) බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ලංකාපුර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. එම්. එස්. පී. බී. විජේකෝන්,
සභාපති,
ලංකාපුර ප්‍රාදේශීය සභාව.
තල්පොත,
පොළොන්නරුව.

2019 නොවැම්බර් මස 27 වැනි දින,
ලංකාපුර ප්‍රාදේශීය සභාවේ දී ය.

කර්මාන්ත (වෙළෙඳාම) බද්ද නියම කිරීම

''1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලය යටතේ ලංකාපුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන, ඉහත කී පනතේ 152 වන වගන්තිය යටතේ ව්‍යාපාර බද්දක් ගෙවීමට යටත් වන යම් ව්‍යාපාරයක් නොවන්නා වූ සහ කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ බලපත්‍රයක් ලබාගැනීමට අවශ්‍ය නොවන්නාවූ යම් කර්මාන්තයක් (වෙළෙඳාමක්) කරගෙන යනු ලබන අවස්ථාවක, ඒ එක් එක් කර්මාන්තය (වෙළෙඳාම) පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම, පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක, ඒ උපලේඛනයේ II වන තීරුවේ සඳහන් ප්‍රමාණයට සමාන මුදලක කර්මාන්ත (වෙළෙඳාම) බද්දක් 2020 වර්ෂය සඳහා නියම කර අයකර ගත යුතු බව සහ ඒ කර්මාන්ත (වෙළෙඳාම) බද්ද ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් ලංකාපුර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.''

උපලේඛනය

I තීරුව	*II තීරුව* රු. ශත
වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක	500 0
රු. 750 ඉක්මවන, එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	750 0
රු. 1,500 ඉක්මවන අවස්ථාවක	1,000 0

12-534/2

ලංකාපුර ප්‍රාදේශීය සභාව

අතුරු ව්‍යවස්ථා යටතේ 2020 වර්ෂය සඳහා ව්‍යාපාර බද්දක් නියම කිරීම

ලංකාපුර ප්‍රාදේශීය සභාව විසින් 2019.10.22 වැනි දින පවත්වනු ලැබූ රැස්වීමේ තීරණ අංක (ඉ) 01 (iv) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා නියම කරන ලද ඒ ව්‍යාපාර බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ලංකාපුර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. එම්. එස්. පී. බී. විජේකෝන්,
සභාපති,
ලංකාපුර ප්‍රාදේශීය සභාව,
තල්පොත,
පොළොන්නරුව.

2019 නොවැම්බර් මස 27 වැනි දින,
ලංකාපුර ප්‍රාදේශීය සභාවේ දී ය.

ව්‍යාපාර බද්ද නියම කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලය යටතේ ලංකාපුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන, ඉහත කී පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීමට යම් කර්මාන්තයක් (වෙළෙඳාමක්) නොවන්නාවූ සහ යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ බලපත්‍රයක් ලබාගැනීම අවශ්‍ය නොවන්නාවූ, යම් ව්‍යාපාරයක් කරගෙන යනු ලබන අවස්ථාවක, ඒ ව්‍යාපාරයෙන් පෙර වර්ෂයේ දී ලැබූ ආදායම, පහත උපලේඛන 1 තීරුවේ සඳහන් යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක, ඒ උපලේඛනයේ II වන තීරුවේ සඳහන් ප්‍රමාණයට සමාන මුදලක ව්‍යාපාර බද්දක් 2020 වර්ෂය සඳහා නියම කර අයකර ගත යුතු බව සහ ඒ ව්‍යාපාර බද්ද ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් ලංකාපුර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

I තීරුව	*II තීරුව* රු. ශත
බද්ද අදාළ වර්ෂයට පෙර වර්ෂය සඳහා වූ ව්‍යාපාරයේ ආදායම	
(i) රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිත් නැත
(ii) රු.6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90.00
(iii) රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180.00
(iv) රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360.00
(v) රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200.00
(vi) රු. 1,50,000 ඉක්මවන විට	3,000.00

12-534/3

ලංකාපුර ප්‍රාදේශීය සභාව

සේවා ගාස්තු නියම කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ ලංකාපුර ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී ඉටුකරනු ලබන පොදු උපයෝගී සේවා, සුබසාධන සේවා සහ වෙනත් බලතල ක්‍රියාවට නැංවීමේ දී අවශ්‍ය කරන සේවා සැපයීම වෙනුවෙන් 2020 වර්ෂය තුළදී අය කරනු ලබන ගාස්තු නියම කිරීම පිළිබඳ පහත සඳහන් යෝජනා සම්මතය 2019.10.22 වැනි දින තීරණ අංක (ඉ) 01 iv යටතේ සම්මත කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. එම්. එස්. පී. බී. විජේකෝන්,
සභාපති,
ලංකාපුර ප්‍රාදේශීය සභාව,
තල්පොත,
පොළොන්නරුව.

2019 නොවැම්බර් මස 27 වැනි දින,
ලංකාපුර ප්‍රාදේශීය සභාව.

සේවා ගාස්තු නියම කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙන් ලංකාපුර ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී ඉටුකරනු ලබන පහත සඳහන් පොදු උපයෝගී සේවා, සුභසාධන සේවා සහ වෙනත් බලතල ක්‍රියාවට නැංවීමේ දී අවශ්‍ය කරන සේවා සැපයීමේදී 2020 වර්ෂය ඇතුළත ප්‍රාදේශීය සභා අරමුදලට අයකර ගත යුතු ගාස්තු මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු යයි ලංකාපුර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

සේවාව	*ගාස්තුව (රු)* *රු. ශත*
01. *වාහන යෙදවීම සඳහා අය කරන කුලී ගාස්තු:*	
ට්‍රැක්ටර් තණකොළ කපන යන්ත්‍රය- වැඩකරන මී.පැ. 01ක් සඳහා ඉන්ධන සහිතව	2,000 0
පැය 03කට වඩා වැඩි වූ විට, පැයක් සඳහා ඉන්ධන සහිතව	1,500 0
ප්‍රවාහනය කිරීම මී. පැ. 01ක් සඳහා පැය 05ට වැඩි නම් ප්‍රවාහන ගාස්තු අය නොකෙරේ.	
02. ට්‍රැක්ටර් බවුසරය කුලියට දීම කුලී ගාස්තු:	
(i) ජල බවුසරය ලබාදීම ට්‍රැක්ටරය සමග (බල ප්‍රදේශය තුළ)	2,500 0
(ii) ට්‍රැක්ටරය, ජල බවුසරය, ජල පොම්පය සමග (දින 01ක් සඳහා ඉන්ධන සහිතව)	5,000 0
(iii) ට්‍රැක්ටරය පමණක් කුලියට ලබාදීම (දින 01ක් සඳහා)	3,500 0
(iv) ට්‍රැක්ටරය සහ ට්‍රෙලරය යෙදවීම (දින 01ක් සඳහා ඉන්ධන සහිතව)	4,500 0
(v) ට්‍රැක්ටර් ට්‍රෙලරය පමණක් කුලියට දීම (දින 01ක් සඳහා)	2,000 0
(vi) බවුසරය පමණක් කුලියට දීම (දින 01ක් සඳහා)	1,500 0
03. ට්‍රැක්ටර් ගලි බවුසරය කුලියට දීම	
(i) ගලි බවුසර් (දින 01ක් සඳහා)	3,800 0
(ii) ප්‍රවාහනය කි.මී. 01ක් සඳහා	50 0
04. ලොරි බවුසරය කුලියට දීම	
(i) ජල බවුසර් 01ක් (බල ප්‍රදේශය තුළ)	3,000 0
(ii) ප්‍රවාහන ගාස්තු කි. මී. 5 ඇතුළත	1,000 0
(iii) කි. මී. 5- 10	1,500 0
(iv) කි. මී. 10-15	2,000 0
(v) කි. මී. 15ට වැඩි වන කිලෝ මීටරයක් සඳහා	120 0 බැගින්
(vi) ඉන්ධන රහිතව දින 01ක් සඳහා	8,000 0
05. ටිපර් රථය කුලියට යෙදවීම	
(i) දිස්ත්‍රික්කය තුළ ටිපර් රථ (දින 01ක් සඳහා)	5,000 0

සේවාව			ගාස්තුව (රු) රු. ශත
06. ගල්රෝල කුලියට යෙදවීම ගාස්තු			
(i) පැයකට (ප්‍රවාහනය හා ඉන්ධන රහිතව)			3,500 0
(ii) දිනකට අවම පැය 03ක් වැඩ කළ යුතුය			
(iii) වැඩකරන දිනක් සඳහා රු. 3,500.00ක ගාස්තුවක් ගෙවිය යුතුය			
(iv) එක් දිනක් සඳහා ලබා ගන්නේ නම් දිනකට රු. 10,000.00 (ප්‍රවාහනය හා ඉන්ධන රහිතව)			
07. සුංගාවිල සුවපහසු මධ්‍යස්ථානයේ පහසුකම් ලබාදීමෙන් සේවා ගාස්තු අය කිරීම			
(i) බස් රථ සඳහා			250 0
(ii) වෑන් රථ සඳහා			150 0
(iii) කුඩා වාහන සඳහා			100 0
08. ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ නිෂ්පාදිත කොම්පෝස්ට් පොහොර ඒකකයක මිල ගණන්			
(i) කිලෝග්‍රෑම් 05ක ප්‍රමාණය සඳහා			15 0
(ii) කිලෝග්‍රෑම් 10ක ප්‍රමාණය සඳහා			13 0
(iii) කිලෝග්‍රෑම් 25ක ප්‍රමාණය සඳහා			12 0
(iii) කිලෝග්‍රෑම් 50ක ප්‍රමාණය සඳහා			11 0
08. පරිසර ඉල්ලුම්පත් ගාස්තු			150 0
(i) පරීක්ෂා කිරීමේ ගාස්තු			
250,000 හෝ ඊට අඩු			3,000 0
250,000 - 500,000			3,750 0
500,000.00 - 10,00,000.00			5,000 0
1,000,000ට වැඩි			100,000 0
(ii) පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු			4,000 0
09. පුස්තකාල සාමාජික ගාස්තු			
ළමා			40 0
වැඩිහිටි			60 0
10. මිනින්දෝරු සැලැස්ම අනුමත කිරීමේ අයදුම්පත්‍රය	*වාණිජ*	*නේවාසික*	
$0m^2$-$45m^2$	1,000.00	500.00	
46 m^2-90 m^2	2,000.00	1,500.00	
91 m^2-180 m^2	3,000.00	2,500.00	
181 m^2-270 m^2	4,000.00	3,500.00	
271 m^2-450 m^2	6,000.00	4,500.00	
451 m^2-675 m^2	8,000.00	7,500.00	
676 m^2-900 m^2	10,000.00	6,500.00	
901 m^2-1225 m^2	12,000.00	7,500.00	
1226 m^2 වැඩි	12,000 + 1,250	7,500 + 1,000	
1226 m^2 කට වඩා වැඩිවන සෑම වර්ග මීටර් 90 m^2 කට වරක්	1,250	1,000.00	
11. ජල ගාස්තු			
ස්ථාවර ගාස්තුව			150 0
ඒකක 0 සිට 5 දක්වා (ඒකකයක් සඳහා)			නොමැත
ඒකක 6 සිට 10 දක්වා (ඒකකයක් සඳහා)			15 0
ඒකක 11 සිට 15 දක්වා (ඒකකයක් සඳහා)			20 0
ඒකක 16 සිට 20 දක්වා (ඒකකයක් සඳහා)			25 0
ඒකක 21 සිට වැඩිවන සෑම ඒකකයක් සඳහාම ඒකකයකට			30 0
නවජල සම්බන්ධතා ගාස්තුව			10,000 0
නැවත ජල සම්බන්ධතාවය ලබාදීමේ ගාස්තුව			3,000 0
12. වෙනත් ගාස්තු			
(i) ගොඩනැගිලි අයදුම්පත් ගාස්තු			200 0
(ii) ඒ. ටී. පෝරම (ඔප්පු සාරාංශ පෝරම)			100 0
(iii) අනතුරුදායි ගස් කැපීමේ අයදුම්පත්‍ර ගාස්තු			250 0
(iv) ගොඩනැගිලි අයදුම්පත්‍ර මත අනුකූලතා සහතිකය සඳහා			500 0
(v) පාරවල් පළුදු කිරීමේ ගාස්තු			1,000 0
(vi) ප්‍රාදේශීය සභාව සතු ඉඩම් මහජන රැස්වීම් සඳහා හෝ වෙනත් කටයුතු සඳහා බදුදීම (දිනකට)			1,000 0
(vii) අලෙවි ප්‍රවර්ධන වැඩසටහනක් සඳහා අවසරපත්‍ර ගාස්තු දිනකට			1,500 0

මෙම සභාවට අයත් පුලතිසි ස්වර්ණ මණ්ඩප රංග ශාලාව, කුලී පදනම මත ලබා දීමේදී පහත සඳහන් පරිදි ගාස්තු අය කිරීම :

අ/අ	විස්තරය	භාවිත කරන වේලාව	මිල (රු.)	අමතර පැය 01 ක් සඳහා (රු.)	ආපසු ගෙවීමේ තැන්පතුව (රු.)	ශබ්ද විකාශන පද්ධතිය
01	වේදිකා නාට්‍ය					
	එක් දර්ශන වාරයක් සඳහා	4	12,000 0	4,000 0	5,000 0	නොමිලේ
	දර්ශන වාර 02 සඳහා	8	20,000 0	4,000 0	7,500 0	නොමිලේ
	දර්ශන වාර 03 සඳහා	12	30,000 0	4,000 0	10,000 0	නොමිලේ
02	සංගීත ප්‍රසංග					
	එක් ප්‍රසංගයක් සඳහා	4	20,000 0	5,000 0	10,000 0	නොමිලේ
	ප්‍රසංග 02 සඳහා	8	30,000 0	5,000 0	15,000 0	නොමිලේ
	දර්ශන වාර 03 සඳහා	12	35,000 0	5,000 0	15,000 0	නොමිලේ
03	සම්මාන උත්සව, වැඩමුළු, දේශන (වාණිජ නොවන)					
	පෙ.ව. 9.00 සිට ප.ව. 12.00 දක්වා හෝ ප.ව. 1.00 සිට ප.ව. 04.00 දක්වා	3	10,000 0	4,000 0	5,000 0	නොමිලේ
	පෙ.ව. 09.00 සිට ප.ව. 05.00 දක්වා	8	16,000 0	4,000 0	8,000 0	නොමිලේ
	ප.ව. 05.00 සිට ප.ව. 09.00 දක්වා	4	12,000 0	4,000 0	7,000 0	නොමිලේ
04	වාණිජ සංගීත වැඩසටහන්					
	පෙ.ව. 9.00 සිට ප.ව. 12.00 දක්වා හෝ ප.ව. 1.00 සිට ප.ව. 04.00 දක්වා	3	15,000 0	6,000 0	7,000 0	නොමිලේ
	පෙ.ව. 09.00 සිට ප.ව. 05.00 දක්වා	8	30,000 0	6,000 0	10,000 0	නොමිලේ
	ප.ව. 05.00 සිට ප.ව. 09.00 දක්වා	4	20,000 0	6,000 0	8,000 0	නොමිලේ
05	සම්මාන උත්සව, වැඩමුළු, දේශන (වාණිජ)					
	පෙ.ව. 9.00 සිට ප.ව. 12.00 දක්වා හෝ ප.ව. 1.00 සිට ප.ව. 04.00 දක්වා	3	12,000 0	4,000 0	5,000 0	නොමිලේ
	පෙ.ව. 09.00 සිට ප.ව. 05.00 දක්වා	8	18,000 0	4,000 0	8,000 0	නොමිලේ
	ප.ව. 05.00 සිට ප.ව. 09.00 දක්වා	4	13,000 0	4,000 0	7,000 0	නොමිලේ
06	මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර් පහසුකම් සඳහා					
	පෙ.ව. 09.00 සිට ප.ව. 12.00 දක්වා	3	2,500 0			
	ප.ව. 1.00 සිට ප.ව. 04.00 දක්වා					
	පෙ.ව. 09.00 සිට ප.ව. 05.00 දක්වා	8	5,000 0			
	ප.ව. 05.00 සිට ප.ව. 09.00 දක්වා	4	3,000 0			
07	ආලෝක පද්ධතිය					
	ආලෝක පද්ධතිය (අවම පැය 03 කට)		5,000 0	2,000 0		

ලංකාපුර ප්‍රාදේශීය සභාව

ප්‍රචාරක දැන්වීම් - දෘෂ්‍ය පරිසර යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 221 (අ) හා 122, 126 වැනි වගන්ති යටතේ ලංකාපුර ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2019.10.22 වැනි දින පවත්වන ලද මහා සභාවේ තීරණ අංක (ඉ) 01 (iv) යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. එම්. එස්. පී. බී. විජේකෝන්,
සභාපති,
ලංකාපුර ප්‍රාදේශීය සභාව,
තල්පොත,
පොළොන්නරුව.

2019 නොවැම්බර් මස 27 වැනි දින,
ලංකාපුර ප්‍රාදේශීය සභාව.

ප්‍රචාරක දැන්වීම්- දෘෂ්‍ය පරිසර යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 221 (අ) හා 122, 126 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදුව, 1983.02.12 වැනි දින අංක 754 *ගැසට් පත්‍රයේ* නිවේදනයක් මගින් ලංකාපුර ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති අතුරු ව්‍යවස්ථාවල 39 වැනි ඡේදය යටතේ ලංකාපුර ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් (බැනර් ඇතුළුව) ඉදිකිරීම හා ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2020.01.01 දින සිට පනවා අයකර ගැනීමට යෝජනා කරන්නීය.

උපලේඛනය

01. කිසියම් බැම්මක, බිත්තියක, පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමක් (චිත්‍රපට ප්‍රචාරක දැන්වීම් හැර) සඳහා වර්ෂයකට හෝ ඉන් කොටසකට ප්‍රදර්ශනය කිරීම සඳහා සෑම වර්ග අඩියකටම රු. 200 බැගින් වූ ගාස්තුවක්

02. රෙදි හෝ ඉටි රෙදි භාවිතා කරනු ලබන දැන්වීමක් සඳහා මාසයකට හෝ ඉන් කොටසකට ප්‍රදර්ශනය කිරීම සඳහා සෑම වර්ග අඩියකටම රු. 50 බැගින් වූ ගාස්තුවක්

03. විදුලි ආලෝකය කරන ලද ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා වර්ෂයකට සෑම වර්ග අඩියක් සඳහාම රු. 200 බැගින් වූ ගාස්තුවක් අයකරනු ලැබේ.

12-534/5

ලංකාපුර ප්‍රාදේශීය සභාව

වාහන හා සත්ත්ව බද්ද

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 148 වැනි වගන්ති සමග කියවිය යුතු එකී පනතේ 147 වැනි උපවගන්තිය යටතේ ලංකාපුර ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2019.10.22 වන දින පවත්වන ලද මහා සභාවේ තීරණ අංක (ඉ) 01 iv යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. එම්. එස්. පී. බී. විජේකෝන්,
සභාපති,
ලංකාපුර ප්‍රාදේශීය සභාව,
තල්පොත,
පොළොන්නරුව.

2019 නොවැම්බර් මස 27 වැනි දින,
ලංකාපුර ප්‍රාදේශීය සභාව.
පොළොන්නරුව.

වාහන හා සත්ත්ව බද්ද

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වැනි වගන්ති සමග කියවිය යුතු ඒ පනතේ 147 වැනි වගන්තියේ I වැනි උපවගන්තිය යටතේ ලංකාපුර ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව ප්‍රාදේශීය සභාව ඇතුළත ඇති හෝ පාවිච්චි කරන්නාවූ සෑම වාහනයක් සහ සතෙක් වෙනුවෙන් ම මෙහි උපලේඛනයේ සඳහන් අනුප්‍රමාණ අනුව වූ වාර්ෂික බද්දක් 2020 වර්ෂයේ දී පනවා අයකළ යුතු යැයි ලංකාපුර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

	රු. ශත
මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා -	
වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18 0
වෙළෙඳ කාර්යයක් නොවන කාර්යය සඳහා යොදවන්නේ නම්	04 0
සෑම කරත්තයක් සඳහා	20 0
සෑම අත් කරත්තයක් සඳහා	10 0
සෑම රික්ෂෝවක් සඳහා	7 0
සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා	15 0
සෑම ඇතෙකු සඳහා	50 0

විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල් බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්ය සඳහා නොයොදවන මෙකී අත් කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ උපලේඛනයේ වෙළෙඳ කාර්ය යන්නට විකිණීම සඳහා අන්‍යාකාරයකින් හෝ යම් වෙළෙඳ කාර්යක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙන යාම සඳහා හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12-534/6

ලංකාපුර ප්‍රාදේශීය සභාව

විනෝද බද්ද

විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ I වැනි උපවගන්ති යටතේ ලංකාපුර ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2019.10.22 වැනි දින පවත්වන ලද මහා සභාවේ තීරණ අංක (ඉ) 01 (iv) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. එම්. එස්. පී. බී. විජේකෝන්,
සභාපති,
ලංකාපුර ප්‍රාදේශීය සභාව,
තල්පොත,
පොළොන්නරුව.

2019 නොවැම්බර් මස 27 වැනි දින,
ලංකාපුර ප්‍රාදේශීය සභාව.

විනෝද බද්ද පැනවීම

(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ 2 වෙනි වගන්තියේ I වැනි උපවගන්තිය යටතේ මෙම සභාව විසින් සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි පැවැත්වෙන (ආඥාපනතේ විස්තර කොට ඇති පරිදි වූ) විනෝද කටයුතු සඳහා ඇතුළුවීම පිණිස අයකරනු ලබන ගාස්තුවලින් 15% බද්දක් මෙම යෝජනාව *ගැසට් පත්‍රයේ* පළවෙන දින දක්වා අයකළ යුතු යැයි යෝජනා කරන්නීය.

01. සංදර්ශනයක් පැවැත්වීම
02. සර්කස් සංදර්ශනයක් පැවැත්වීම
03. සංගීත ප්‍රසංගයක් පැවැත්වීම
04. චිත්‍රපටයක් ප්‍රදර්ශනය කිරීම

12-534/7

උඩුබද්දාව ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

උඩුබද්දාව ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ සැප්තැම්බර් 17 වැනි දින පවත්වන ලද මහාසභා රැස්වීමේදී තීරණ අංක 05-12(1) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. එම්. රාජ් සිසිර කුමාර,
සභාපති,
උඩුබද්දාව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 22 වැනි දින,
උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ 1 වන උපවගන්තිය සමග කියවිය යුතු 146 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් උඩුබද්දාව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර උඩුබද්දාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි දියුණු ගම් ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර ඇති කලාපයේ ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල 2016 වර්ෂයේ බලාත්මත කර 2019 වර්ෂය තුළදී ක්‍රියාත්මක වූ වාර්ෂික වටිනාකම්, තක්සේරුවම 2020 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එම තක්සේරුවම මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී වාර්ෂික තක්සේරු වටිනාකමෙන් 4% ක වාර්ෂික වරිපනමක් 2020 වර්ෂයේ දී පනවා අය කරතයුතු බවටද උඩුබද්දාව ප්‍රාදේශීය සභාව වෙත වරිපනමක් ගෙවීමට යටත් සෑම තැනැත්තෙකු විසින් ම යථෝක්ත වරිපනම 2020 වර්ෂයේ මාර්තු මස 31, ජූනි මස 30, සැප්තැම්බර් මස 30, දෙසැම්බර් මස 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් ගෙවනු ලැබිය යුතු යැයි විධානය කිරීමටත්,

2020 වරුෂයට ගෙවිය යුතු වරිපනම 2020 ජනවාරි මස 31 වැනි දිනට පෙර හෝ ඊට පෙර ගෙවනු ලබන්නේ නම් 10% ක වට්ටමක්ද, වරිපනම කාර්තු වශයෙන් ගෙවන්නේ නම්, අදළ කාර්තුවේ පළමු මස ඇතුළත ගෙවනු ලබන විට 5% වට්ටමක්ද, ලබා දෙනු ලබන බව ප්‍රාදේශීය සභා පනතේ 134(7) වගන්තිය අනුව සභාව විසින් යෝජනා කරන්නීය.

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු අවසන් දිනය*	*5%වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමුවන කාර්තුව	2020.03.31	2020.01.31
දෙවන කාර්තුව	2020.06.30	2020.04.30
තෙවන කාර්තුව	2020.09.30	2020.07.31
හතරවන කාර්තුව	2020.12.31	2020.10.31

12 - 644/1

උඩුබද්දාව ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

උඩුබද්දාව ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ සැප්තැම්බර් 17 වැනි දින පවත්වන ලද මහාසභා රැස්වීමේදී තීරණ අංක 05-12 (2) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. එම්. රාජ් සිසිර කුමාර,
සභාපති,
උඩුබද්දාව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 22 වැනි දින,
උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (3) වන උපවගන්තිය සමග කියවිය යුතු 146 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2017 වර්ෂයේ දී බලාත්මක කරන ලද සත්‍යෝක්ෂණය කිරීම 2020 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී පනතේ 134 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර උඩුබද්දාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද, ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ,

(අ) හෙක්ටයාර් පහක් (05) හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන්ම එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක්ම මත 2020 වර්ෂය සඳහා රුපියල් 10 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

(ආ) ඉහත කී පනතේ 134 වන වගන්තියේ (3) වන වගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් එවකට බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය වර්තමානයේ උඩුබද්දාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (ආ) වන කොටසේ 1989.03.10 වැනි දිනැති ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති හෙයින්, හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු වූ සෑම ඉඩමක් මත 2020 වර්ෂය සඳහා රුපියල් 50 ක් බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට සහ,

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධානය කළ යුතු යැයි ද සභාව විසින් යෝජනා කරන්නීය.

12 - 644/2

උඩුබද්දාව ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

උඩුබද්දාව ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ සැප්තැම්බර් 17 වැනි දින පවත්වන ලද මහාසභා රැස්වීමේදී තීරණ අංක 05-12 (3) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. එම්. රාජ් සිසිර කුමාර,
සභාපති,
උඩුබද්දාව ප්‍රාදේශීය සභාව.

2017 ඔක්තෝබර් මස 22 වැනි දින,
උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 148 වන වගන්තිය සහ හතර වන උප ලේඛනයේ විධිවිධාන අනුව ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර උඩුබද්දාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2020 වර්ෂයේ දී පහත උපලේඛනයෙහි I වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මතම එහි II තීරුවේ සඳහන් බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අය කිරීමට සභාව විසින් යෝජනා කරන්නීය.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව* *රු. ශත*
(1) (i) මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
(ii) සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් සඳහා -	
255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 153 සහ 157 වැනි වගන්තිය යටතේ සීතාවකපුර නගර සභාව විසින් සම්පාදිතව ඒ ආඥාපනතේ 154 වැනි වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් අනුමත කොට ඇති 1968 දෙසැම්බර් මස 27 වැනි දින අංක 14834 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ (සීතාවකපුර නගර සභාව) අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව 2019 ඔක්තෝබර් මස 25 වැනි දින පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීමේ දී තීරණ අංක 06 යටතේ සීතාවකපුර නගර සභා බල ප්‍රදේශය සඳහා ප්‍රචාරක දැන්වීම් ගාස්තු, එම අතුරු ව්‍යවස්ථාවේ 13 වැනි උපලේඛනයේ ගාස්තු වෙනුවට මෙහි පහත උපලේඛනයේ ගාස්තු ආදේශ කිරීමෙන් 2020 වර්ෂයට අදළව නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට යෝජනා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

කේ . ඒ. රණවීර,
සභාපති,
සීතාවකපුර නගර සභාව.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
සීතාවකපුර නගර සභා කාර්යාලයේ දී ය,

උපලේඛනය

දැන්වීම් පිළිබඳ විස්තර	*අවසරපත්‍ර සඳහා ගාස්තු* *මසකට හෝ ඉන් කොටසකට* *රු. ශත*	 *වර්ෂයකට* *රු. ශත*
1. බිත්තියක හෝ තාප්පයක දැන්වීම් ප්‍රදර්ශනය කරනු ලබන ඉදිකිරීමකට (චලන චිත්‍ර විනෝදයට අදාළ දැන්වීමකින් බාහිර වූ) ඕනෑම දැන්වීමකට එක් එක් වර්ග අඩියක් සඳහා	15 0	60 0
2. යම්කිසි තැනැත්තෙක් විසින් උසුලාගෙන යනු ලබන ලෑල්ලක් හෝ ආධාරකයක ප්‍රදර්ශනය කරනු ලබන හෝ ගමනාගමනයෙහි යෙදෙන වාහනයකට සවිකරන ලද (චලන චිත්‍ර විනෝදයට අදාළ දැන්වීමකින් බාහිර වූ) දැන්වීමකට		
(අ) එම දැන්වීම වර්ග අඩි හයකට වැඩි නොවන්නේ නම් එක් එක් වර්ග අඩිය සඳහා	25 0	90 0
(ආ) එම දැන්වීම වර්ග අඩි හයකට වැඩි වන්නේ නම් එක් එක් වර්ග අඩිය සඳහා	30 0	120 0
3. චලන චිත්‍ර විනෝදයට ඕනෑම දැන්වීමකට එක් එක් වර්ග අඩිය සඳහා	10 0	75 0

12 - 571/6

සීතාවකපුර නගර සභාව

සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම - 2020 වර්ෂය

255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 165 (ඇ) වැනි වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර 2019 ඔක්තෝබර් මස 28 වැනි දින පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීමේ දී තීරණ අංක 07 යටතේ සීතාවකපුර නගර සභා බල ප්‍රදේශය සඳහා 2020 වර්ෂයට අදළව සංවර්ධනය නොකළ ඉඩම් මත බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට යෝජනා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

කේ . ඒ. රණවීර,
සභාපති,
සීතාවකපුර නගර සභාව.

2020 ඔක්තෝබර් මස 28 වැනි දින,
සීතාවකපුර නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

සීතාවකපුර නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි යම් ඉඩමක්, ගොඩනැගිලි ඉදිකිරීම සඳහා සුදුසුවන විටක හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු වන විටක හෝ යුක්ති සහගත වියදමකින් ඒ ඉඩම එකී යම් කාර්යයක් සඳහා සංවර්ධනය කළ හැකි විටක,

(අ) කිසිඳු ඉදිකිරීමක්, වගාවක් හෝ යම් කාර්යයක් සඳහා පරිවර්තනය නොකරන භූමියක ප්‍රාග්ධන අගයෙන් සියයට එකයි දශම පහක (1.5%) බද්දක්,

(ආ) යම් ඉඩමක ඉදිකිරීමක්, වගාවක් හෝ යම් සංවර්ධන කාර්යයක් ඇති විට එම ඉදිකිරීම, වගාව හෝ සංවර්ධන කාර්යයට සත්‍ය වශයෙන්ම යටවී ඇති බිම් ප්‍රමාණය සම්පූර්ණ ප්‍රමාණයෙන් භාගයක් (1/2) වන විට ප්‍රාග්ධන අගයෙන් සියයට දශම හතරක (0.4%) බද්දක්,

(ඇ) යම් ඉඩමක ඉදිකිරීමක්, වගාවක් හෝ යම් සංවර්ධන කාර්යයක් ඇති විට එම ඉදිකිරීම, වගාව හෝ සංවර්ධන කාර්යයට සත්‍ය වශයෙන් ම යටවී ඇති බිම් ප්‍රමාණය සම්පූර්ණ ප්‍රමාණයෙන් හතරෙන් එකක් (1/4) වන විට ප්‍රාග්ධන අගයෙන් සියයට දශම හයක (0.6%) බද්දක්,

2020 වර්ෂය සඳහා ගෙවිය යුතු ය.

12 - 571/7

සීතාවකපුර නගර සභාව

මෝටර් වාහන ගාස්තු පැනවීම - 2020 වර්ෂය

255 වන අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 153 සහ 157 වැනි වගන්තිය යටතේ සීතාවකපුර නගර සභාව විසින් සම්පාදිත මෝටර් වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර 2019 ඔක්තෝබර් මස 28 වැනි දින පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීමේ දී තීරණ අංක 08 යටතේ සීතාවකපුර නගර සභා බල ප්‍රදේශය සඳහා 2020 වර්ෂයට අදළව මෝටර් වාහන ගාස්තු පැනවීම පහත උපලේඛන I වන තීරුවේ නිරූපිත කිසියම් වාහනයක් හෝ වෙනුවෙන් එකී උපලේඛනයේ II වන තීරුවේ නිරූපිත නවතා තැබීමේ ගාස්තු ආකාරයට විය යුතු බවට යෝජනා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

කේ . ඒ. රණවීර,
සභාපති,
සීතාවකපුර නගර සභාව.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
සීතාවකපුර නගර සභා කාර්යාලයේ දී ය,

උපලේඛනය

අනු. අංකය	*විස්තරය*	*I වැනි තීරුව*	*II වැනි තීරුව*
		වෙන්කර ඇති ගාලේ නවතා තැබීම සඳහා ගාස්තුව දිනකට (රුපියල්)	*ඉන්පිටත නවතා තැබීම සඳහා ගාස්තුව පැයකට (රුපියල්)*
01.	බස් රථයක් සඳහා	5 0	5 0
02.	ලොරියක් සඳහා	5 0	5 0
03.	මෝටර් කෝඩ් (වෑන්) රථයක් සඳහා	3 0	3 0
04.	ට්‍රැක්ටරයක් සඳහා	4 0	4 0
05.	මෝටර් රථයක් සඳහා	2 0	2 0

12 - 571/8

සීතාවකපුර නගර සභාව

පොදු උපයෝගී සේවා, සුභ සාධන සේවා සහ වෙනත් බලතල ක්‍රියාවට නැංවීමේ දී අයකර ගත යුතු ගාස්තු පැනවීම - 2020 වර්ෂය

255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ ලැබී ඇති බලතල ප්‍රකාරව සීතාවකපුර නගර සභාවට පැවරී ඇති බලතල කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී ඉටුකරනු ලබන පහත සඳහන් පොදු උපයෝගී සේවා, සුභසාධන සේවා සහ වෙනත් බලතල ක්‍රියාවට නැංවීමේදී අවශ්‍ය කරන අනුෂාංගික කාර්යයන් ඉටුකිරීමේදී නගර සභා අරමුදලට අයකරගත යුතු ගාස්තු මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවත් මෙම සේවා ගාස්තු අයකිරීම 2020 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බවත් 2019 ඔක්තෝබර් මස 28 වැනි දින පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීමේ දී තීරණ අංක 09 යටතේ යෝජනා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

කේ . ඒ. රණවීර,
සභාපති,
සීතාවකපුර නගර සභාව.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
සීතාවකපුර නගර සභා කාර්යාලයේ දී ය,

උපලේඛනය

	සේවාව	*රු. ශත*
(01)	උකස්කරයක් ලියාපදිංචි කිරීමේ ගාස්තු	2000 0
(02)	වෙනත් ඕනෑම සහතිකයක හෝ ලිපියක සහතික කරන ලද පිටපතක්	300 0
(03)	ඉඩම් අනුබෙදුම් අයදුම්පතක් හෝ ගොඩනැගිලි සැලසුම් අයදුම්පත්‍රයක්	200 0
(04)	අනුකූලතා සහතික ගාස්තුව	
(i)	ඉඩම් කට්ටි සඳහා : (අ) පළමු බිම් කොටස	1,000 0
	(ආ) වැඩිවෙන සෑම බිම් කට්ටියකට	500 0 බැගින්
(ii)	නේවාසික ගොඩනැගිලි සඳහා :	
	(අ) වර්ග මීටර් 300 ට අඩු නම්	3,000 0
	(ආ) ඊට වැඩිවෙන සෑම වර්ග මීටර් එකකට	10 0 බැගින්

සේවාව	රු. ශත
(iii) වාණිජ ගොඩනැගිලි හා වෙනත් ඉදිකිරීම් :	
(ඇ) වර්ග මීටර් 100ට අඩු නම්	3,000 0
(ඈ) ඊට වැඩිවන සෑම වර්ග මීටර් එකකට	10 0 බැගින්
(05) රාජ්‍ය ආයතනයක හෝ ව්‍යාපාරික ස්ථානයක කසළ බැහැර කිරීම : (ට්‍රැක්ටර් ලෝඩ් 01 සඳහා)	
(i) අපද්‍රව්‍ය වෙන් කිරීමක් නොමැතිව භාරදෙන විට	3,000 0
(ii) අපද්‍රව්‍ය වෙන්කර භාරදෙන විට	1,000 0
(06) මළ නාලිකා සම්බන්ධතා වාර්ෂික නඩත්තු ගාස්තු :	
(i) නේවාසික	1,250 0
(ii) හෝටල් සඳහා (සේවක සංඛ්‍යාව අනුව) :	
5ට අඩු නම්	3,000 0
5 -10 ත් අතර	3,500 0
10ට වැඩි නම්	4,500 0
(iii) ව්‍යාපාර සඳහා (සේවක සංඛ්‍යාව අනුව) :	
100ට අඩු නම්	2,500 0
100ත් 500ත් අතර	3,500 0
500ට වැඩි නම්	4,500 0
(iv) නේවාසිකාගාර :	
පුද්ගලයින් 1-50	2,500 0
පුද්ගලයින් 51-100	3,500 0
පුද්ගලයින් 100ට වැඩි	4,500 0
(07) සුසාන භූමි සහ ආදාහනාගාර ගාස්තු	
I. සුසාන භූමිය තුළ භූමදන කිරීමේ ගාස්තු :	
(අ) භූමදන ගාස්තුව (ළදරු/ළමා)	100 0
(ආ) භූමදන ගාස්තුව (වැඩිහිටි)	500 0
II. සුසාන භූමිය වටා ඇති තාප්පයේ භෂ්මාවශේෂ තැන්පත් කිරීම සඳහා 1' x 1' ප්‍රමාණයේ සිහිවටන ඵලකයක් ඉදිකිරීම :	
(අ) නගර සභා සීමාවෙහි පදිංචි වී සිටි අයෙකු සීතාවකපුර නගර සභා ආදාහනාගාරයේ දී ආදාහනය කර ඇත්නම් භෂ්මාවශේෂ තැන්පත් කිරීම	3,000 0
(ආ) නගර සභා සීමාවෙහි පදිංචි අයෙකු නගර සභා සීමාවෙන් පිට ආදාහනය කර භෂ්මාවශේෂ තැන්පත් කිරීම	4,000 0
(ඇ) නගර සභා සීමාවෙන් පිට පදිංචි වී සිටි අයෙකු සීතාවකපුර නගර සභා ආදාහනාගාරයේ දී ආදාහනය කර ඇත්නම් එම භෂ්මාවශේෂ තැන්පත් කිරීම	4,000 0
(ඈ) නගර සභා සීමාවෙන් පිට පදිංචි අයෙකු නගර සභා සීමාවෙන් පිට	

	සේවාව	රු. ශත
	ආදහනය කර භෂ්මාවශේෂ තැන්පත් කිරීම	5,000 0
(08)	නගර සභා පොදු වැසිකිලි පාවිච්චි කිරීමේ ගාස්තු (එක් වරකට)	20 0
(09)	ජල සම්බන්ධතා සඳහා මාර්ග අලාභහානි කිරීමේ ගාස්තු :	
	(i) තාර පාර (වර්ග අඩි එකකට)	400 0
	(ii) බොරළු පාර (වර්ග අඩි එකකට)	100 0
	(iii) කොන්ක්‍රීට් පාර (වර්ග අඩි එකකට)	750 0
	(iv) කුට්ටි ගල් ඇතුරූ පාර (වර්ග අඩි එකකට)	500 0
	(v) කාපට් පාර (වර්ග අඩි එකකට)	9,500 0
	(වර්ග මීටරයක් සඳහා රු. 8,500.00 ක අත්තිකාරම් මුදලක් අය කෙරේ)	
(10)	නගර ශාලාව වෙන්කිරීම - සාමාන්‍ය ගාස්තු :	
	(අ) පැය 6 ක් සඳහා	7,000 0
	(ආ) පැය 8 ක් සඳහා	7,500 0
	(ඇ) පැය 12 ක් සඳහා	8,500 0
	(ඈ) පැය 12 ට වඩා වැඩිවන සෑම පැය 01 ක් සඳහා	1,000 0
(11)	නගර ශාලාව වෙන්කිරීම - වාණිජ ගාස්තු :	
	(අ) පැය 10ක් සඳහා (පෙ. ව. 7.00 - ප. ව. 5.00)	12,000 0
	(ආ) පැය 10 ට වැඩි	14,000 0
	(ඇ) අඛණ්ඩව දින තුනකට වැඩි දින ගණනක් සඳහා (දිනකට)	12,000 0
(12)	නගර ශාලාවේ තුන්වන මහල ලබාදීම (එක් දිනක් සඳහා කුළියට ලබාදීම)	3,000 0
(13)	කොරිඩෝව ලබාදීම (එක් දිනක් සඳහා කුළියට ලබාදීම)	2,300 0
(14)	පුස්තකාල ශ්‍රවනාගාරය ලබාදීම (එක් දිනක් සඳහා කුළියට ලබාදීම)	1,250 0
(15)	හිස් තාර බැරල් එකක් සඳහා	300 0
(16)	කුළියට දීම	
	I. පෞද්ගලික බස් නැවතුම්පල කොන්ක්‍රීට් ලෑල්ල සඳහා	1,750 0 සිට ඉහළට
	II. ලංගම බස් නැවතුම්පල කොන්ක්‍රීට් ලෑල්ල සඳහා	1,500 0 සිට ඉහළට
	III. නගර සභා ක්‍රීඩාපිටිය හා අවිස්සාවේල්ල පෞද්ගලික බස් නැවතුම්පල ඉදිරිපිට භූමි තුළ මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා	500 0
(17)	ප්‍රජා ශාලා දිනකට	
	(i) වාණිජ කටයුතු සඳහා	1,000 0
	(ii) දේශපාලන කටයුතු සඳහා	500 0
(18)	පරිසර බලපත්‍ර ඉල්ලුම්පත්	
	(අ) නිකුත් කිරීම සඳහා ඉල්ලුම්පත් ගාස්තු (නව ඉල්ලුම්පත් සඳහා)	100 0
	(ආ) අළුත් කිරීමේ ගාස්තු	50 0
(19)	ප්‍රමාද ගාස්තු එක් පොතකට (දින 01 කට)	1 0
(20)	අධ්‍යයන ශාලාව ලබා දීම (පැය 01 ට)	2 0
(21)	අන්තර්ජාල පහසුකම් ලබා දීම (පැය 01 ට)	60 0
(22)	ඡායා පිටපත් ගැනීම	
	(i) ඡායා පිටපත් A4 (තනිපිට)	4 0
	(ii) ඡායා පිටපත් A4 (දෙපිට)	5 0

	සේවාව	රු. ශත
(iii)	ඡායා පිටපත් A3 (තනිපිට)	10 0
(23)	ලැමිනේටින්	
(i)	ලීගල් ප්‍රමාණය	35 0
(ii)	4 R	15 0
(24)	ටයිප් සෙටින්	
(i)	A4	50 0
(ii)	A3	55 0
(25)	කලර් ප්‍රින්ටින් A4	60 0
(26)	බයින්ඩින්	
(i)	8 mm ප්‍රමාණය	85 0
(ii)	12 mm ප්‍රමාණය	85 0
(iii)	22 mm ප්‍රමාණය	185 0
(27)	ලීටර් 3500 ගලිබවුසරයේ සේවාව සැපයීම	
(i)	ගලි බවුසර සේවා ගාස්තු බල ප්‍රදේශය ඇතුළත (එක් ගමන් වාරයකට)	
	නේවාසික	2,000 0
	වාණිජ	3,000 0
(ii)	බල ප්‍රදේශයෙන් පිටත (එක් ගමන් වාරයකට)	
	නේවාසික	3,000 0
	වාණිජ	3,200 0
(i)	ගලි බවුසරය - නගර සීමාව තුළ හා පිටත කිලෝමීටරයක් සඳහා	100 0
(ii)	ගලි බවුසරයේ බහාලුම් ගාස්තු	1,500 0
(iii)	ගලි බවුසරයේ කම්කරු ගාස්තු	200 0
(28)	ලී පුටු එකක් සඳහා දිනකට	6 0
(29)	යකඩ පුටු එකක් සඳහා දිනකට	5 0
(30)	ප්ලාස්ටික් පුටු එකක් සඳහා දිනකට	6 50
(31)	ජාතික කොඩි එකක් සඳහා දිනකට	50 0
(32)	බෞද්ධ කොඩි එකක් සඳහා දිනකට	50 0
(33)	කොඩි කණු (කුඩා එකක් සඳහා) දිනකට	50 0
(34)	කොඩි කණු (ලොකු එකක් සඳහා) දිනකට	60 0
(35)	10' x 10' වේදිකාවක් සඳහා දිනකට	1,500 0
(36)	10' x 20' යකඩ මඩුව දික් අඩි 01 ක් සඳහා දිනකට	15 0
(37)	ජල බවුසරය කුලියට දීම - එක ගමන් වාරයක් සඳහා	
(i)	3000 L	1,000 0
(ii)	6000 L	2,500 0
	ප්‍රවාහන ගාස්තු -කිලෝමීටරයකට	100 බැගින්
(38)	ජල ටැංකි කුලියට ලබා දීම - එක් දිනකට	500 0

	සේවාව	රු. ශත
	ප්‍රවාහන ගාස්තු කිලෝමීටර් 1 කට	200 0
(39)	JCB යන්ත්‍රය කුලියට දීම මීටර් පැයකට ගාස්තුව	2,000 0
	ප්‍රවාහන ගාස්තු කි.මී. 1 ක් සඳහා	200 0
(40)	මාර්ග තලනය කුලියට දීම :	
	(i) මාර්ග තලනය I (ටොන් 08) දිනකට	5,000 0
	(ii) මාර්ග තලනය III (ටොන් 10) දිනකට (UTON)	10,000 0
	ප්‍රවාහන ගාස්තු කි.මී. 1 ක් සඳහා	200 0
(41)	ගිලන් රථය ලබාදීම :	
	(i) නගර සීමාව තුළ (ධාවනය වන කිලෝමීටරයකට)	65 0 බැගින්
	(ii) නගර සීමාවෙන් පිටත (ධාවනය වන කිලෝමීටරයකට)	75 0 බැගින්
	(iii) ගිලන් රථය තබාගන්නා පළමු පැය හැර අනෙකුත් සෑම පැයට හෝ ඉන් කොටසකට	40 0 බැගින්
	(iv) ගිලන් රථය ලබාදීම අවම ගාස්තුව	300 0
(42)	පුස්තකාල ළමා සාමාජික ගාස්තු (වයස අවු 6-12 අතර)	30 0
(43)	පුස්තකාල වැඩිහිටි සාමාජික ගාස්තු (නගර සීමාව තුළ)	10 0
(44)	පුස්තකාල වැඩිහිටි සාමාජික ගාස්තු (නගර සීමාවෙන් පිටත) (1 km ඇතුළත)	200 0
(45)	පුස්තකාල ළමා සාමාජිකත්වය අළුත්කිරීම	10 0
(46)	පුස්තකාල වැඩිහිටි සාමාජිකත්වය අළුත්කිරීම	50 0
(47)	මහජන සෞඛ්‍ය පරීක්ෂක වාර්තා ලබාදීම	
	(i) කර්මාන්ත ශාලා සඳහා	5,000 0
	(ii) ආපන ශාලා සඳහා	3,000 0
	(iii) වෙනත්	2,500 0
(48)	කොම්පෝස්ට් පොහොර විකිණීම	
	(i) කිලෝග්‍රෑම් 50ට අඩු	13 0
	(ii) කිලෝග්‍රෑම් 50ත් 2000ත් අතර	10 0
	(ii) කිලෝග්‍රෑම් 2000ත් 5000ත් අතර	8 0
	(ii) කිලෝග්‍රෑම් 5000 ට වැඩි	7 0
(49)	ආයුර්වේද සහතික	50 0
(50)	වැවේ කැලේ නැරඹීමේ ගාස්තු	
	(i) වැඩිහිටි	20 0
	(i) ළමා	10 0

ඉහත ගාස්තු සඳහා රජයේ අනුමත බදු මුදල් ඇතුළත් විය යුතු ය.

සීතාවකපුර නගර සභාව

මෘත ශරීර ආදහනය කිරීම සඳහා ගාස්තු පැනවීම -2020 වර්ෂය

255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 ඔක්තෝබර් මස 28 වැනි දින පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීමේ දී තීරණ අංක 10 යටතේ සීතාවකපුර නගර සභා බල ප්‍රදේශය සඳහා 2020 වර්ෂයට අදළව මෘත ශරීර ආදහන ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට යෝජනා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

කේ . ඒ. රණවීර,
සභාපති,
සීතාවකපුර නගර සභාව.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
සීතාවකපුර නගර සභා කාර්යාලයේ දී ය,

යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සම්පාදිත හා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ තුන්වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව බස්නාහිර පළාත් සභාව විසින් අනුමත කළ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, අංක 1947/7 හා 2015 දෙසැම්බර් මස 28 වැනි දින *අති විශේෂ ගැසට් පත්‍රය*, 2016.11.29 වැනි දින, තීරණ අංක 1176 මගින් සීතාවකපුර නගර සභාව විසින් වැළඳගත් හා ඒ බව අංක 2000 හා 2016.12.30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ නිවේදනය කර ඇති, අතුරු ව්‍යවස්ථා මාලාවේ ආදහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 16 වන වගන්තිය අනුව පහත උපලේඛනයේ සඳහන් අවසර පත්‍ර ගාස්තුවක්, 1988 අංක 255 අධිකාරිය වන නගර සභා ආඥාපනතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පනවා අය කිරීමට යෝජනා කරමි.

උපලේඛනය

නගර සභා බලප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවකුගේ	රු. 6,000 0
නගර සභා බලප්‍රදේශයෙන් පිටත පදිංචිකරුවකුගේ	රු. 8,500 0

12 - 571/10

සීතාවකපුර නගර සභාව

සංචාරක වෙළෙඳාමට අදළ අවසර පත්‍ර ගාස්තු පැනවීම - 2020

255 අධිකාරය වූ නගර සභා ආඥාපනතේ පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 ඔක්තෝබර් මස 28 වැනි දින පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීමේ දී තීරණ අංක 11 යටතේ සීතාවකපුර නගර සභා බල ප්‍රදේශය සඳහා 2020 වර්ෂයට අදළව සංචාරක වෙළෙඳාමට අදාළ අවසර පත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට යෝජනා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

කේ . ඒ. රණවීර,
සභාපති,
සීතාවකපුර නගර සභාව.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
සීතාවකපුර නගර සභා කාර්යාලයේ දී ය,

යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සම්පාදිත හා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 3 වෙනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව බස්නාහිර පළාත් සභාව විසින් අනුමත කළ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, අංක 1947/7 හා 2015.12.28 වැනි දින *අති විශේෂ ගැසට් පත්‍රය* හා, 2016.11.29 වැනි දින, තීරණ අංක 1176 මගින් සීතාවකපුර නගර සභාව විසින් වැළඳගත් හා ඒ බව අංක 2000 හා 2016.12.30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ නිවේදනය කර ඇති, අතුරු ව්‍යවස්ථා මාලාවේ සංචාරක වෙළෙඳාම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාවේ 05 වන වගන්තිය අනුව පහත උපලේඛනයේ සඳහන් අවසර පත්‍ර ගාස්තුවක්, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පනවා අය කිරීමට යෝජනා කරමි.

උපලේඛනය

සංචාරක වෙළෙඳාම සම්බන්ධව වාර්ෂිකව ගෙවිය යුතු ගාස්තුව.

I	වාහන නොවන	රු. 1,800 0
II	වාහන තුළ සංචාරක වෙළෙඳාම	රු. 2,500 0

12 - 571/11

සීතාවකපුර නගර සභාව

සැරසිලි විධිමත් කිරීමේ ගාස්තු පැනවීම - 2020

255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 ඔක්තෝබර් මස 28 වැනි දින පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීමේ දී තීරණ අංක 12 යටතේ සීතාවකපුර නගර සභා බල ප්‍රදේශය සඳහා 2020 වර්ෂයට අදළව සැරසිලි විධිමත් කිරීමේ ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට යෝජනා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

කේ . ඒ. රණවීර,
සභාපති,
සීතාවකපුර නගර සභාව.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
සීතාවකපුර නගර සභා කාර්යාලයේ දී ය,

යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සම්පාදිත හා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 3 වෙනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව බස්නාහිර පළාත් සභාව විසින් අනුමත කළ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, අංක 1947/7 හා 2015.12.28 වැනි දින *අති විශේෂ ගැසට් පත්‍රය* හා, 2016.11.29 වැනි දින, තීරණ අංක 1176 මගින් සීතාවකපුර නගර සභාව විසින් වැළඳගත් හා ඒ බව අංක 2000 හා 2016.12.30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ නිවේදනය කර ඇති, අතුරු ව්‍යවස්ථා මාලාවේ සැරසිලි විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 08 වන වගන්තිය අනුව පහත උපලේඛනයේ සඳහන් අවසර පත්‍ර ගාස්තුවක්, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පනවා අය කිරීමට යෝජනා කරමි.

උපලේඛනය

සැරසිලි සඳහා	50 m ට අඩු		50 m ට වැඩි	
	ගාස්තු	තැන්පත්	ගාස්තු	තැන්පත්
කණු	5.00	1,000 0	15.00	2,000.00
වැල්	15.00	1,000 0	25.00	2.000.00
වෙනත්	15.00	1,000 0	25.00	2,000.00

12 - 571/12

සීතාවකපුර නගර සභාව

ත්‍රීරෝද රථ අවසර පත්‍ර ගාස්තු පැනවීම - 2020

නිවේදනය

255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 ඔක්තෝබර් මස 28 වැනි දින පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීමේ දී තීරණ අංක 13 යටතේ සීතාවකපුර නගර සභා බල ප්‍රදේශය සඳහා 2020 වර්ෂයට අදළව ත්‍රීරෝද රථ බලපත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට යෝජනා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

කේ . ඒ. රණවීර,
සභාපති,
සීතාවකපුර නගර සභාව.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
සීතාවකපුර නගර සභා කාර්යාලයේ දී ය,

යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සම්පාදිත හා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 3 වෙනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව බස්නාහිර පළාත් සභාව විසින් අනුමත කළ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, අංක 1947/7 හා 2015.12.28 වැනි දින *අති විශේෂ ගැසට් පත්‍රය* හා, 2016.11.29 වැනි දින, තීරණ අංක 1176 මගින් සීතාවකපුර නගර සභාව විසින් වැළඳගත් හා ඒ බව අංක 2000 හා 2016.12.30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ නිවේදනය කර ඇති, අතුරු ව්‍යවස්ථා මාලාවේ ත්‍රී රෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 04 වන වගන්තිය අනුව පහත උපලේඛනයේ සඳහන් අවසර පත්‍ර ගාස්තුවක්, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පනවා අය කිරීමට යෝජනා කරමි.

උපලේඛනය

අවසර පත්‍ර කාලය	*අවසර පත්‍ර ගාස්තුව*
	රු. ශත
මාසික	250 00
ත්‍රෛමාසික	650 00
වාර්ෂික	2,000 00

12 - 571/13

සීතාවකපුර නගර සභාව

සේවා සඳහා ඉල්ලුම් පත්‍ර ගාස්තු පැනවීම - 2020

නිවේදනය

255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 ඔක්තෝබර් මස 28 වැනි දින පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීමේ දී තීරණ අංක 14 යටතේ සීතාවකපුර නගර සභා බල ප්‍රදේශය සඳහා 2020 වර්ෂයට අදළව සේවා සඳහා ඉල්ලුම් පත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට යෝජනා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

කේ . ඒ. රණවීර,
සභාපති,
සීතාවකපුර නගර සභාව.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
සීතාවකපුර නගර සභා කාර්යාලයේ දී ය,

යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සම්පාදිත හා 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 3 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව බස්නාහිර පළාත් සභාව විසින් අනුමත කළ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, අංක 1947/7 හා 2015.12.28 වැනි දින *අති විශේෂ ගැසට් පත්‍රය* හා, 2016.11.29 වැනි දින, තීරණ අංක 1176 මගින් සීතාවකපුර නගර සභාව විසින් වැළඳගත් හා ඒ බව අංක 2000 හා 2016.12.30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ නිවේදනය කර ඇති, අතුරු ව්‍යවස්ථා මාලාවේ සේවා සඳහා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 04 වන වගන්තිය අනුව පහත උපලේඛනයේ සඳහන් අවසර පත්‍ර ගාස්තුවක්, 1988 අංක 255 අධිකාරිය වන නගර සභා ආඥාපනතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පනවා අය කිරීමට යෝජනා කරමි.

උපලේඛනය

	සේවාව	*ගාස්තුව* *රු. ශත*
(01)	වරිපනම් ලේඛනයෙහි උධෘත ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත්‍ර	100 00
(02)	සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ඉල්ලුම් පත්‍ර	100 00
(03)	වීථි රේඛා සහතිකයක් ලබා ගැනීමේ ඉල්ලුම් පත්‍ර	100 00
(04)	නොපවරා ගැනීමේ සහතිකයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍ර	100 00
(05)	වීථි රේඛා සහතික	250 00
(06)	නොපවරා ගැනීමේ සහතික	100 00
(07)	වරිපනම් ලේඛන ආශ්‍රයෙන් හිමිකම් පිළිබඳ සහතික	100 00
(08)	වරිපනම් ලේඛනවල උධෘත සනාථ කරන සහතික (එක් වර්ෂයකට)	100 00
(09)	නිකුත් කරන ලද තක්සේරු නිවේදන සනාථ කරන සහතික	50 00

ඉහත ගාස්තු සඳහා රජයේ අනුමත බදු මුදල් ඇතුළත් විය යුතු ය.

සීතාවකපුර නගර සභාව

ක්‍රීඩා භූමි පරිහරණය සඳහා ගාස්තු පැනවීම - 2020

255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 ඔක්තෝබර් මස 28 වැනි දින පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීමේ දී තීරණ අංක 15 යටතේ සීතාවකපුර නගර සභා බල ප්‍රදේශය සඳහා 2020 වර්ෂයට අදළව ක්‍රීඩා භූමි පරිහරණය සඳහා ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට යෝජනා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

කේ . ඒ. රණවීර,
සභාපති,
සීතාවකපුර නගර සභාව.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
සීතාවකපුර නගර සභා කාර්යාලයේ දී ය,

යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සම්පාදිත හා 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 3 වෙනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව බස්නාහිර පළාත් සභාව විසින් අනුමත කළ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, අංක 1947/7 හා 2015.12.28 වැනි දින *අති විශේෂ ගැසට් පත්‍රය* හා 2016.11.29 වැනි දින, තීරණ අංක 1176 මගින් සීතාවකපුර නගර සභාව විසින් වැළඳගත් හා ඒ බව අංක 2000 හා 2016.12.30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ නිවේදනය කර ඇති, අතුරු ව්‍යවස්ථා මාලාවේ ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 03 වන වගන්තියෙහි 02 වන උපවගන්තිය ප්‍රකාරව හා 04 වන වගන්තියෙහි 02 වන උපවගන්තිය අනුව පහත උපලේඛනයේ සඳහන් අවසර පත්‍ර ගාස්තුවක්, 1988 අංක 255 අධිකාරිය වන නගර සභා ආඥාපනතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පනවා අය කිරීමට යෝජනා කරමි.

උපලේඛනය

භූමි පරිහරණය ඉල්ලුම් පත්‍රය 100 0

ක්‍රීඩා භූමියක් පරිහරණය කිරීමට අයකරන ගාස්තු වර්ගය :

	ක්‍රීඩා භූමියේ නම	*ගාස්තුව*	*තැන්පත් මුදල*	*අතිරේක පැයකට ගාස්තුව*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01	පිලිප් ගුණවර්ධන ක්‍රීඩා භූමිය	8,500 00	2,000 00	200 00
02	යාහැල්ල ක්‍රීඩා භූමිය	1,000 00	500 00	100 00
03	ප්‍රගති පුර ක්‍රීඩා භූමිය	1,000 00	500 00	100 00
04	නගර සභාව ඉදිරිපිට ක්‍රීඩා භූමිය	3,000 00	1,000 00	100 00
05	පුවක්පිටිය ක්‍රීඩා භූමිය	1,000 00	500 00	100 00
06	හොනිටන් ප්‍රජා ශාලා ක්‍රීඩා භූමිය	1,000 00	500 00	100 00
07	සීතාගම ක්‍රීඩා භූමිය	1,000 00	500 00	100 00
08	වෙරළුපිටිය ක්‍රීඩා භූමිය	1,000 00	500 00	100 00
09	ගලපිටමඩම ක්‍රීඩා භූමිය	1,000 00	500 00	100 00

වැලිගම නගර සභාව

ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමේ ගාස්තු අයකිරීම - 2020 වර්ෂය

වැලිගම නගර සභාවේ 2019.09.10 වැනි දින පැවති මාසික මහා සභා රැස්වීමේ දී තීරණ අංක (04)V යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි :

යෝජනාව

255 වන අධිකාරිය නගර සභා ආඥාපනතේ 153, 154 හා 157 (7) (උ) වගන්තියෙන් වැලිගම නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නගර සභාව විසින් පිළිගෙන ඇති අතුරු ව්‍යවස්ථා යටතේ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමේ ගාස්තු මෙහි උපලේඛනය පරිදි 2020 වර්ෂය සඳහා පනවා අය කිරීමට යෝජනා කරමි.

රෙහාන් ඩී. ඩබ්. ජයවික්‍රම,
සභාපති,
වැලිගම නගර සභාව.

2019 ක් වූ සැප්තැම්බර් මස 10 වැනි දින,
වැලිගම නගර සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

	විස්තරය	*මසකට ගාස්තුව (රු. ශත.)*	*වර්ෂයකට ගාස්තුව (රු. ශත.)*
01.	බිත්තියක හෝ දැන්වීම් පුවරුවක ප්‍රදර්ශනය කරන (චිත්‍රපට පෙන්වීමට සම්බන්ධ ප්‍රචාරක දැන්වීමක් නොවන ප්‍රචාරක දැන්වීමක් සඳහා) එක් වර්ග අඩියකට	50.00	100.00
02.	යම් තැනැත්තෙකු විසින් උසුලාගෙන යනු ලබන හෝ ගමන් කරනු ලබන වාහනයකට සවිකොට ඇති පුවරුවක් මත ප්‍රදර්ශනය කෙරෙන (චිත්‍රපට පෙන්වීමට සම්බන්ධ ප්‍රචාරක දැන්වීමක් නොවන ප්‍රචාරක දැන්වීමක් සඳහා)	30.00	100.00
03.	චිත්‍රපට පෙන්වීම සම්බන්ධව ප්‍රචාරක දැන්වීමක් සඳහා එක් වර්ග අඩියකට	30.00	30.00
04.	වෙළෙඳ දැන්වීම් සඳහා බැනර් පාවිච්චි කිරීම :		
	(අ) රෙදිවල අඳින ලද බැනරයක් හෝ දැන්වීමක් සඳහා වර්ග අඩියකට	50.00	
	(ආ) ඉටිරෙදි රාමුවක අඳින ලද බැනරයක් සඳහා වර්ග අඩියකට	20.00	
	(ඇ) රෙදි හෝ ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් රාමුවක අඳින ලද වර්ග අඩි දහයකට වැඩි රූප රාමුවක් සඳහා	30.00	

වැලිගම නගර සභාව

සුසාන භූමි හා මිනීපිටි ආඥාපනත යටතේ ගාස්තු අයකිරීම - 2020 වර්ෂය

වැලිගම නගර සභාවේ 2019.09.10 වැනි දින පැවති මාසික මහා සභා රැස්වීමේ දී තීරණ අංක (04) VII යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

යෝජනාව

සුසාන භූමි හා මිනීපිටි ආඥාපනතේ 17 හා 22 වැනි වගන්තිය යටතේ වැලිගම නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2020.01.01 වැනි දින සිට පහත උපලේඛනය පරිදි ගාස්තු අයකිරීමට යෝජනා කරමි :

රෙහාන් ඩී. ඩබ්. ජයවික්‍රම,
සභාපති,
වැලිගම නගර සභාව.

2019 ක් වූ සැප්තැම්බර් මස 10 වැනි දින,
වැලිගම නගර සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

	විස්තරය		*රු. ශත*
01.	විශාල ප්‍රමාණයේ සොහොන් වලක් කැපීම සඳහා :		
	I. නගර සභා සේවකයන් සොහොන්වල කැපීම සඳහා		1,000 00
	II. අදාළ අය විසින් සොහොන් වල කැපීම සඳහා		500 00
02.	අඩි 8×4 එහෙත් 8'×8' නොඉක්මවන ස්ථිර සොහොන් ගැබක් ඉදිකිරීම සඳහා		5,000.00
03.	ආදාහනය කිරීමේ ගාස්තු :		
	(අ) නගර සීමාව ඇතුළත	ගෑස් මිල සංශෝධනය වූ සෑම අවස්ථාවකදී ම මෙම ගාස්තු වෙනස් විය හැකිය.	5,500.00
	(ආ) නගර සීමාවෙන් පිටත		7,000.00
04.	2'×2' භෂ්මාවශේෂ තැන්පත් කිරීමේ ස්ථිර සොහොන් ගැබක් ඉදිකිරීම සඳහා		4,000.00

12-756/2

වැලිගම නගර සභාව

විනෝද බදු ආඥාපනත

(267 වන අධිකාරය වූ) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තිය (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර වැලිගම නගර සභාව විසින් සම්මත කරන ලද පහත සඳහන් යෝජනාව, එකී වගන්තියේ (2) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර දකුණු පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් අනුමත කර ඇති බව එකී උපවගන්තිය අනුව මෙයින් පළකරනු ලැබේ.

යෝජනාව

(267 වන අධිකාරය වූ) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තිය (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර වැලිගම නගර සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන, එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට ඇතුළු වීම පිණිස කරනු ලබන ගෙවීමකින් (විනෝද බදු හැර) සියයට හතයි දශම පහක (7.5%) සමාන බද්දක් පනවා අයකළ යුතු යැයිද, මෙම යෝජනා සම්මතය ගැසට් පත්‍රයේ පළකරන ලද මාසයට ඉක්බිතිවම එළඹෙන මාසයේ පළමුවන දින සිට ක්‍රියාත්මක විය යුතු යැයි ද යෝජනා කරමි. එසේ වුව ද මෙම යෝජනා සම්මතය ක්‍රියාත්මක වන පළමු දෙවසර ඇතුළත චිත්‍රපටියක් නැරඹීමට ගෙවනු ලබන ගාස්තුවක් මත අයකල යුතු බදු මුදල එසේ ගෙවන ලද ගාස්තුවෙන් සියයට හතයි දශම පහක් (7.5%) විය යුතු ය.

සමන් දර්ශන පාඩිකෝරාල,
ලේකම්,
දකුණු පළාත් පළාත් පාලන අමාත්‍යාංශය,
දකුණු පළාත.

2018 ක් වූ සැප්තැම්බර් මස 11 වැනි දින,
දකුණු පළාත් පළාත් පාලන අමාත්‍යාංශයේ දී ය.

12-756/3

වැලිගම නගර සභාව

2020 වර්ෂයට අදාළව කර්මාන්ත බදු පැනවීම

වැලිගම නගර සභාවේ 2019.09.10 වැනි දින පැවති මාසික මහා සභා රැස්වීමේ දී තීරණ අංක (04) III යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

යෝජනාව

255 වන අධිකාරය නගර සභා ආඥාපනතේ 165 අ (I) වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර වැලිගම නගර සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ II තීරුවේ ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූපී තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත් එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු දැනටමත් පවත්නා කර්මාන්තයක් 2020 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙරද අළුතින් ආරම්භ කළ කර්මාන්තයක් දින 30 ක් තුළත් වැලිගම නගර සභාවට එකී කර්මාන්ත බදු ගෙවිය යුතු යැයි යෝජනා කරමි.

රෙහාන් ඩී. ඩබ්. ජයවික්‍රම,
සභාපති.

2019 ක් වූ සැප්තැම්බර් මස 10 වැනි දින,
වැලිගම නගර සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

අනු. අංකය	කර්මාන්තයේ ස්වභාවය	*I වැනි තීරුව*	*II වැනි තීරුව*	
		වාර්ෂික වටිනාකම රු. 750.00 ට වැඩි නොවන විට	*වාර්ෂික වටිනාකම රු. 750.00 ඉක්මවන නමුත් රු 1,500.00 නොඉක්මවන විට*	*වාර්ෂික වටිනාකම රු 1,500.00 ඉක්මවන විට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1	ලී ඉරණ ස්ථානයක් පවත්වාගෙන යාම (යාන්ත්‍රික ලී මෝලක්)	500.00	750.00	1,000.00
2	ලී අලෙවි කිරීමේ හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
3	වී කොටා සහල් නිෂ්පාදනය (යාන්ත්‍රික වී මෝලක්)	500.00	750.00	1,000.00
4	මුද්‍රණාලයක් පවත්වාගෙන යාම (ඕෆ්සෙට් හෝ ඩිජිටල්)	500.00	750.00	1,000.00
5	පෑස්සුම් වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
6	ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
7	කම්මලක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
8	විදුලි යන්ත්‍රානුසාරයෙන් කුළුබඩු ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
9	පොහොර වර්ග සෑදීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
10	ටයර් ටියුබ් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
11	මෝටර් රථ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
12	වාහන සේවා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
13	බෙලෙක් වැඩපොළක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
14	පරණ යකඩ බඩු ගබඩා කිරීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
15	ඇළුමිනියම් වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (ඇළුමිනියම් කබඩ්, ෂෝරූම්)	500.00	750.00	1,000.00
16	වඩු මඩුවක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
17	පාපැදි අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
18	ගෘහ භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
19	පොල්තෙල් මෝලක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
20	යතුරු පැදි අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
21	විදුලි උපකරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
22	ඇන්ටනා නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
23	ගිනිපෙට්ටි, හඳුන්කුරු නිෂ්පාදනය කිරීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
24	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති ගඩොල් කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
25	ත්‍රිරෝද රථ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
26	ප්ලාස්ටික් කාර්මික (රබර් මුද්‍රා, වාහන අංක තහඩු) සැකසීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
27	කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන සැකසීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*වාර්ෂික වටිනාකම රු. 750.00 ට වැඩි නොවන විට*	*වාර්ෂික වටිනාකම රු. 750.00 ඉක්මවන නමුත් රු 1,500.00 නොඉක්මවන විට*	*වාර්ෂික වටිනාකම රු 1,500.00 ඉක්මවන විට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
28	කොහු ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (කොසු ඉදල් බුරුසු)	500.00	750.00	1,000.00
29	කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
30	ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන සිදු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
31	බිම් මල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
32	ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
33	කුකුළන් ඇති කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
34	සුරතල් සතුන් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
35	පොල් ලී මඩුවක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00

12-756/4

වැලිගම නගර සභාව

සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම - 2020 වර්ෂය

වැලිගම නගර සභාවේ 2019.09.10 වැනි දින පැවති මාසික සභා රැස්වීමේ දී තීරණ අංක (04) VIII යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

යෝජනාව

255 වැනි අධිකාරය නගර සභා ආඥාපනතේ 165 ඇ (I) වගන්තිය යටතේ නගර සභාවට ලැබී ඇති බලතල මත වැලිගම නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ නිතිපතා හෝ ස්ථාවර ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති වූ විට, හෝ

(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විට, හෝ

(ඇ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට අත්‍යවශයෙන් ම යට වී ඇති බිම් ප්‍රමාණය හෝ වගා කිරීමට යටත් බිම් ප්‍රමාණය සහ එම ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 60% වඩා අඩු වන්නේ නම් එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැළකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩම් මත 2020 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන බිම් අගයෙන් 2% ක වාර්ෂික බද්දක් පැනවීමටත් එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2020 ජූනි 30 වැනි දිනට පෙර වැලිගම නගර සභාවට ගෙවිය යුතු බවට යෝජනා කරමි.

රෙහාන් ඩී. ඩබ්. ජයවික්‍රම,
සභාපති,
වැලිගම නගර සභාව.

2019 ක් වූ සැප්තැම්බර් මස 10 වැනි දින,
වැලිගම නගර සභා කාර්යාලයේ දී ය.

12-756/5

වැලිගම නගර සභාව

ප්‍රසිද්ධ රඟදැක්වීම් ආඥාපනත

බලපත්‍ර ගාස්තු අයකිරීම - 2020 වර්ෂය

වැලිගම නගර සභාවේ 2019.09.10 වැනි දින පැවති මාසික සභා රැස්වීමේ දී තීරණ අංක (04) VI යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

යෝජනාව

170 වන අධිකාරියේ ප්‍රසිද්ධ රඟදැක්වීම් ආඥාපනතේ 3 වැනි වගන්තිය අනුව වැලිගම නගර සභා සීමාව තුළ ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රසිද්ධ රැගුම් හා සංදර්ශනය සඳහා අය කරනු ලබන ප්‍රසිද්ධ රැගුම් හා සංදර්ශන බලපත්‍ර ගාස්තුව 2020 වර්ෂය සඳහා පහත සඳහන් උපලේඛනය අනුව ගෙවිය යුතු බවට යෝජනා කරමි.

රෙහාන් ඩී. ඩබ්. ජයවික්‍රම,
සභාපති,
වැලිගම නගර සභාව.

2019 ක් වූ සැප්තැම්බර් මස 10 වැනි දින,
වැලිගම නගර සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

		රු. ශත
01.	තාවකාලික චිත්‍රපට/මැජික්/සර්කස්/සංදර්ශන සඳහා එක් දිනකට	100.00
	වැඩිවන සෑම දිනකටම රු. 50.00 බැගින් උපරිමය	1,000.00
02.	සංගීත සංදර්ශන/නාට්‍ය සංදර්ශන පැවැත්වීම සඳහා එක් දිනකට බලපත්‍ර ගාස්තු	500.00

12-756/6

වැලිගම නගර සභාව

සේවා සඳහා ගාස්තු අයකිරීම - 2020 වර්ෂය

වැලිගම නගර සභාවේ 2019.09.10 වැනි දින පැවති මාසික සභා රැස්වීමේ දී තීරණ අංක (04) IX යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි :

යෝජනාව

255 වන අධිකාරය නගර සභා ආඥාපනතේ 158 (2) (ඉ) හා (ඒ) යටතේ වැලිගම නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත උපලේඛනයේ සඳහන් සේවාවන් සඳහා එහි සඳහන් ගාස්තු අය කිරීම සුදුසු බවට යෝජනා කරමි.

රෙහාන් ඩී. ඩබ්. ජයවික්‍රම,
සභාපති,
වැලිගම නගර සභාව.

2019 ක් වූ සැප්තැම්බර් මස 10 වැනි දින,
වැලිගම නගර සභා කාර්යාලයේ දී ය.

සැ. යු.-

* ඉන්ධන මිල වැඩිවීම මත සේවාවන්වල ගාස්තු වැඩි විය හැක.
* පහත සඳහන් ගාස්තුවලට අමතරව රජය විසින් පනවා ඇති බදු හෝ පැනවිය හැකි බදුවලට යටත් විය යුතුය.

උපලේඛනය

		රු. ශත
01.	හිමිකම් වෙනස් කිරීමේ අයදුම් පත්‍ර ගාස්තුව	500.00
02.	තක්සේරු දැන්වීමක් නැවත නිකුත් කිරීම	100.00
03.	ගෙවල් කුළී අයදුම්පත්‍ර ගාස්තු	500.00
04.	I. බැකෝ යන්ත්‍රය කුළියට දීම එක් පැයකට	2,500.00
	II. නගර සීමාවෙන් බැහැරව සෑම දුර කිලෝමීටරයක් සඳහා ප්‍රවාහන ගාස්තුව	100.00
05.	වයිබ්‍රේටර් යන්ත්‍රය කුළියට දීම දිනකට (පැය 08) (ඉන්ධන සපයා ගත යුතු ය)	2,500.00
06.	I. තණකොළ කපන යන්ත්‍රය කුළියට දීම, දිනකට (පැය 08) (ඉන්ධන සපයා ගත යුතු ය)	2,000.00
	II. තණකොළ කපන යන්ත්‍රය කුළියට දීම, වරුවකට (පැය 04) (ඉන්ධන සපයා ගත යුතු ය)	1,000.00
	III. වැඩිවන සෑම පැයකටම	225.00
07.	මාර්ග තලනය (පැය 08 කට ගාස්තුව) (ඉන්ධන සපයා ගත යුතුය)	4,500.00
08.	නගර සභා ට්‍රැක්ටර් කුලියට දීම (රියැදුරු සමග)	
	I. දිනකට අයකරනු ලබන ගාස්තුව (පැය 08) (නගර සීමාව ඇතුළත)	3,500.00
	II. දිනකට අයකරනු ලබන ගාස්තුව (පැය 08) (නගර සීමාවෙන් පිටත)	4,000.00
	III. වැඩිවන සෑම පැයකටම ගාස්තුව	500.00
09.	ගලිබවුසරය :	
	I. එක් වරකට අයකරනු ලබන ගාස්තුව (නගර සීමාව ඇතුළත)	6,000.00
	II. එක් වරකට අයකරනු ලබන ගාස්තුව (නගර සීමාවෙන් බැහැරව)	7,500.00
	නගර සීමාවෙන් බැහැරව ප්‍රවාහන ගාස්තුව කි. මී. 1 කට 1. යාමට රු. 100.00 හා ඒමට රු. 100.00	200.00
10.	ජල මෝටරය :	
	I. දිනකට ගාස්තුව (පැය 08)	2,500.00
	II. වරුවකට (පැය 04)	1,000.00
	III. එක් ළිඳක් හිස් කිරීමට	500.00
11.	වීථි රේඛා සහතිකයක් නිකුත් කිරීමට	500.00
12.	අනුබෙදුම් ඉල්ලුම් පත්‍රයක් නිකුත් කිරීමට	750.00
13.	ගොඩනැගිලි අයදුම් පත්‍රයක් නිකුත් කිරීමට	1,500.00
14.	වන්දි රහිත අයදුම් පත්‍රයක් නිකුත් කිරීමට	750.00
15.	අනතුරුදායක ගස් කපා ඉවත් කිරීම අයදුම්පත් ගාස්තුව :	
	I. එක් කොස් ගසක් සඳහා	1,000.00

		රු. ශත
16.	නගර සීමාව ඇතුළත අවශ්‍ය පුද්ගලයාගේ ඉල්ලීම මත සභාව සතු ට්‍රැක්ටරයෙන් කුණු ඉවත් කිරීමට	1,500.00
17.	පරිසර ආරක්ෂණ බලපත්‍ර ඉල්ලුම්පත්‍ර ගාස්තු	500.00
18.	පරිසර ආරක්ෂණ බලපත්‍ර අළුත් කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තු	250.00
19.	පාරිසරික බලපෑම් හඳුනා ගැනීමේ ප්‍රශ්නාවලිය සහිත ඉල්ලුම්පත්‍ර ගාස්තු	150.00
20.	ජල බවුසරය :	
	I. එක් දිනකට අයකරනු ලබන ගාස්තුව (නගර සීමාව ඇතුළත)	3,000.00
	II. එක් දිනකට අයකරනු ලබන ගාස්තුව (නගර සීමාවෙන් බැහැරව)	4,000.00
21.	නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක වැඩසටහනක් සඳහා අවසර ලබා ගැනීමේ ගාස්තු :	
	I. දිනකට ගාස්තුව	4,000.00
22.	නගර සභා දේපළ තාවකාලික වෙළෙඳසැල් සඳහා බදු දීමේ ගාස්තු දින 30ක කාලසීමාවක් සඳහා	
	1. දිග අඩි 0 සිට 05 දක්වා	2,500.00
	2. දිග අඩි 6 සිට 10 දක්වා	3,000.00
	3. වැඩි වන දික් අඩියක් සඳහා	600.00
	4. වෙළෙඳාම් කටයුතු කරන වෑන් රථ සඳහා	500.00
	5. වෙළෙඳාම් කටයුතු කරන බයිසිකල්	300.00

12-756/7

වැලිගම නගර සභාව

2020 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු පැනවීම

වැලිගම නගර සභාවේ 2019.09.10 වැනි දින පැවති මාසික සභා රැස්වීමේ දී තීරණ අංක (04) IV යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි :

යෝජනාව

255 වන අධිකාරය නගර සභා ආඥාපනතේ 165 (ආ) වන වගන්තියෙන් නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර මෙහි II උපලේඛනයේ සඳහන් කිසියම් ව්‍යාපාරයක් වැලිගම නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2020 වර්ෂයේ කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන් ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ආදායම මෙහි පහත I උපලේඛනයේ පළමු තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන්හි පවත්නා අවස්ථාවක එහි දෙවැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණ අනුව ව්‍යාපාර බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් බද්දට යටත් සෑම තැනැත්තෙකුම එකී ව්‍යාපාර බදු 2020 වර්ෂයේ ජූනි මස 30 වැනි දිනට පෙර වැලිගම නගර සභාවට ගෙවිය යුතු බවට යෝජනා කරමි.

රෙහාන් ඩී. ඩබ්. ජයවික්‍රම,
සභාපති,
වැලිගම නගර සභාව.

2019 ක් වූ සැප්තැම්බර් මස 10 වැනි දින,
වැලිගම නගර සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය අංක I

	I වැනි තීරුව *ව්‍යාපාරයෙන් වර්ෂයක ලැබීම්* *රු. ශත*	*II වැනි තීරුව* *ගෙවිය යුතු බද්ද* *රු. ශත*
I.	රු. 6,000.00 ඉක්මවන නමුත් රු. 12,000.00 නොඉක්මවන විට	90.00
II.	රු. 12,000.00 ඉක්මවන නමුත් රු. 18,750.00 නොඉක්මවන විට	180.00
III.	රු. 18,750.00 ඉක්මවන නමුත් රු. 50,000.00 නොඉක්මවන විට	600.00
IV.	රු. 50,000.00 ඉක්මවන නමුත් රු. 75,000.00 නොඉක්මවන විට	1,200.00
V.	රු. 75,000.00 ඉක්මවන නමුත් රු. 1,00,000.00 නොඉක්මවන විට	1,500.00
VI.	රු. 1,00,000.00 ඉක්මවන නමුත් රු. 1,50,000.00 නොඉක්මවන විට	2,000.00
VII.	රු. 1,50,000.00 ඉක්මවන විට	3,000.00

උපලේඛනය II

1 ග්‍රොසරියක් පවත්වාගෙන යාම
2 රෙදිපිළි හෝ නිමි ඇඳුම් අලෙවි ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
3 ගෘහ විදුලි උපකරණ අලෙවි ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
4 උකස් බඩු ගැනීමේ ආයතනයක් පවත්වාගෙන යාම
5 පුද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම
6 විගණක සේවා ලබා දීමේ ආයතනයක් පවත්වාගෙන යාම
7 ගණකාධිකාරී සේවා සැපයීමේ ආයතනයක් පවත්වාගෙන යාම
8 රක්ෂණ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
9 පෞද්ගලික ප්‍රවාහන සේවා සැපයීමේ ආයතනයක් පවත්වාගෙන යාම
10 රියැදුරු පුහුණු ආයතනයක් පවත්වාගෙන යාම
11 රේස් ඔට්ටු තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
12 බැංකුවක් පවත්වාගෙන යාම
13 පෞද්ගලික දේපළ වෙළෙඳ සමාගමක් පවත්වාගෙන යාම
14 රටබීම වෙළෙඳ සැලක් පවත්වාගෙන යාම
15 ෆුඩ්සිටි වෙළෙඳ ආයතනයක් පවත්වාගෙන යාම
16 වාහනවල දුම් පරීක්ෂා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
17 ලොතරැයි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
18 කිමිදුම්කරුවන් පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
19 ස්වර්ණාභරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
20 සාප්පු බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
21 ඇඟළුම් අපනයන ආයතනයක් පවත්වාගෙන යාම
22 මැටි භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
23 ගිනිකෙළි ද්‍රව්‍ය අලෙවි කිරීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
24 කාය වර්ධන පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
25 ලිහිසිතෙල් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
26 ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම
27 ඇඹරුම් හල්, වංගෙඩි, පිහි, කැති, හිරමන ආදී මුළුතැන්ගෙයි උපකරණ වෙළෙඳාම
28 රථ වාහන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
29 ඇලුමිනියම් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
30 විදුලි උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (වයරින් කිරීමේ)
31 පොත් පත් හා ලිපි ද්‍රව්‍ය හා පත්තර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
32 ඔරලෝසු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
33 පා පැදි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
34 විසිතුරු පැල හෝ මල් පැල විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
35 ප්‍රචාරක සේවා කිරීමේ හෝ ප්‍රචාරක දැන්වීම් සැකසීමේ ආයතනයක් පවත්වාගෙන යාම
(පෝස්ටර්, දැන්වීම් පුවරු, බැනර්, කටවුට්)

36 සුභපැතුම්පත්, ආරාධනාපත් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
37 දන්ත වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
38 ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (හාඩ්වෙයාර්)
39 ශබ්ද විකාශන යන්ත්‍ර බදු දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
40 පින්තූර රාමු කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
41 මැණික් මිලදී ගැනීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
42 ගීත පටිගත කරන ස්ථානයක් පවත්වාගෙන යාම
43 ධීවර උපකරණ හෝ මෙවලම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
44 ප්ලාස්ටික් හෝ පිඟන් බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
45 ඇස් කණ්නාඩි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
46 ඇස් පරීක්ෂා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
47 ඡායා පිටපත් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
48 රේස් ඔට්ටු තබන ස්ථානයක් පවත්වාගෙන යාම
49 පාපැදි නවතා තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
50 මෝටර් වාහන ප්‍රදර්ශනාගාරයක් පවත්වාගෙන යාම
51 මෝටර් සයිකල් අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
52 මෝටර් සයිකල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
53 පා පැදි අමතර කොටස් විකිණීමේ වෙළෙඳ ස්ථානයක් පවත්වාගෙන යාම
54 සන්නිවේදන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම (කොමියුනිකේෂන්)
55 වීඩියෝ කිරීම, වීඩියෝ පටි, කැසට් පටි බදු දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
56 ඉදිකිරීමේ යන්ත්‍ර උපකරණ බද්දට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
57 පූජා භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
58 නාන කාමර උපකරණ හා ටයිල් වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
59 ජංගම දුරකථන අලෙවි කිරීමේ හා අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
60 උත්සව ශාලාවක් පවත්වාගෙන යාම
61 ගොඩනැගිලි සැලසුම් නිර්මාණය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
62 සර්ෆ්බෝඩ්, පිහිණුම් උපකරණ, කිමිදුම් උපකරණ කුලියට දීමේ අලුත් වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
63 පරිගණක අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
64 අන්තර්ජාල පහසුකම් ලබාදීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
65 එක්ස් - රේ ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
66 ජාත්‍යන්තර පාසලක් පවත්වාගෙන යාම
67 ඉදිකිරීමේ යන්ත්‍ර කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
68 ප්‍රසිද්ධ සමාගමක භාණ්ඩ තොග අලෙවි කිරීමේ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
69 වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම
70 විදේශ මුදල්, චෙක්පත් මාරු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
71 පරිගණක පුහුණු ආයතනයක් පවත්වාගෙන යාම
72 රථවාහන කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (කැබ් සර්විස්)
73 පෞද්ගලික වෛද්‍යසේවා සැපයීමේ ස්ථානයක් (චැනල් සෙන්ටර්) පවත්වාගෙන යාම
74 ඉදිකිරීම් කොන්ත්‍රාත් ආයතනයක් පවත්වාගෙන යාම
75 ෆිනෑන්ස් හෝ ලීසිං සමාගමක් පවත්වාගෙන යාම
76 සංචාරකයින්ට ජලක්‍රීඩා පහසුකම් සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
77 සංචාරකයින්ට බෝට්ටු සේවා ලබා දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (තල්මසුන් හා ඩොල්ෆින් නැරඹීම)
78 ගෘහස්ථ ආරක්ෂිත උපකරණ සවිකිරීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
79 පානීය ජල බෝතල් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
80 සංචාරකයින්ට මාර්ග උපදේශන තොරතුරු ලබාදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
81 ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම
82 ළදරු උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
83 ටයර් හෝ ටියුබ් ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
84 කෘෂි රසායන ද්‍රව්‍ය ගබඩා කිරීම සහ අලෙවි කිරීම
85 පිත්තල භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
86 උත්සව භාණ්ඩ කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

87 තීන්ත ගබඩා කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
88 බැටරි අලෙවි කිරීමේ හා බැටරි චාජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
89 සිනමාහලක් පවත්වාගෙන යාම
90 සිමෙන්ති තොග ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
91 වැලි/ ගඩොල්/ කලුගල්/ යකඩ කම්බි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
92 ගෑස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
93 පාවහන් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
94 කෘෂිකාර්මික භෝග මිලදී ගැනීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (වී, කරුංකා, ගම්මිරිස්, කුරුඳු)
95 පශු වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
96 ගමන් මළු/ පාසල් බෑග් නිෂ්පාදනය කිරීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
97 සත්ත්ව ආහාර විකිණීම හෝ ගබඩාකර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
98 ඉංග්‍රීසි බෙහෙත් තොග අලෙවි කිරීමේ හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
99 සිංහල බෙහෙත් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
100 පැතලි වීදුරු ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
101 ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
102 බටහිර වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
103 පාවහන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
104 ත්‍රිරෝද රථ අමතර කොටස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
105 බුලත් පුවක් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
106 පැන්සි බඩු විකිණීමේ (ලවර්ස්) ස්ථානයක් පවත්වාගෙන යාම
107 සේවකයින් සැපයීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
108 ලියාපදිංචි ත්‍රිරෝද රථ සංගමයක් පවත්වාගෙන යාම
109 තරාදි අලෙවි කිරීමේ හා අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
110 ගෘහ භාණ්ඩ අලෙවි ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
111 නීතිඥ හෝ නොතාරිස් සේවා සපයන සමාගමක් පවත්වාගෙන යාම
112 පච්චා කෙටීමේ (ටැටු) ස්ථානයක් පවත්වාගෙන යාම

12-756/8

වැලිගම නගර සභාව

2020 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු පැනවීම

වැලිගම නගර සභාවේ 2019.09.10 වැනි දින පැවති මාසික සභා රැස්වීමේ දී තීරණ අංක (04) II යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

යෝජනාව

255 වන අධිකාරිය නගර සභා ආඥා පනතේ 162 (1)(ආ) සහ 164 (1) වන වගන්තිවලින් නගර සභාවට පැවරී ඇති බලය මත වැලිගම නගර සභා විසින් පිළිගෙන ඇති යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ පාලනය වන ව්‍යාපාරයක් 2020 වර්ෂය තුළ මෙම නගර සභා බලප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන්නේ නම් පහත උපලේඛනයේ 1 වන තීරුවේ සඳහන් එක් එක් ව්‍යාපාරය සඳහා එම උපලේඛනයේ 11 වන තීරුවේ සඳහන් පරිදි බලපත්‍ර ගාස්තුවක් එම ස්ථානයේ වාර්ෂික වටිනාකම මත හෝ පෙර වර්ෂයේ ආදායම මත පනවා අය කිරීම සුදුසු යැයි යෝජනා කරමි. එකී බලපත්‍ර ගාස්තු පවත්නා ව්‍යාපාර සම්බන්ධයෙන් 2020 මාර්තු 31 වැනි දිනට ප්‍රථම ද නව ව්‍යාපාරයක් ආරම්භ කර දින 30ක් ඇතුළත ද ලබා ගත යුතුය.

රෙහාන් ඩී. ඩබ්. ජයවික්‍රම,
සභාපති,
වැලිගම නගර සභාව.

2019 ක් වූ සැප්තැම්බර් මස 10 වැනි දින,
වැලිගම නගර සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

අනු. අංකය	*I තීරුව* *ව්‍යාපාරයේ ස්වභාවය*	*II තීරුව* *වාර්ෂික වටිනාකම රු. 750.00 ට වැඩි නොවන විට* රු. ශත	*වාර්ෂික වටිනාකම රු. 750.00 ඉක්මවන නමුත් රු 1,500.00 නොඉක්මවන විට* රු. ශත	*වාර්ෂික වටිනාකම රු 1,500.00 ඉක්මවන විට* රු. ශත
1.	බේකරියක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
2.	තේ කඩයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
3.	හෝටලයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
4	එළවළු පළතුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
5.	මාළු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
6	කරවල වියළීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
7.	නවාතැන් පොළක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
8.	සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි නවාතැන් පොළක් හෝ හෝටලයක් පවත්වාගෙන යාම	පෙර වර්ෂයේ ආදායමෙන් 1% ක්		
9.	බාබර් සැප්පුවක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
10.	මස් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
11.	ලොන්ඩ්‍රියක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
12.	රස කැවිලි නිපදවීම හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
13.	අයිස් නිපදවීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
14.	පපඩම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
15.	සිසිල් බීම තොග ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
16.	කිරි ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
17.	කිරි හෝ පැණි ගබඩා කිරීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
18.	ආහාර ද්‍රව්‍ය ඇසුරුම් කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
19.	අයිස්ක්‍රීම් කෝන් නිෂ්පාදනය කිරීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
20.	උත්සව සඳහා කේක්, රසකැවිලි වර්ග නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
21.	අවමංගල සේවා සැපයීමේ ආයතනයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00

12-756/9

වැලිගම නගර සභාව

2020 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

වැලිගම නගර සභාවේ 2019.09.10 වැනි දින පැවති මාසික සභා රැස්වීමේ දී තීරණ අංක (04) I යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

යෝජනාව

255 වන අධිකාරිය නගර සභා ආඥාපනතේ 166 වැනි වගන්තිය සමග කියවිය යුතු 252 වන අධිකාරිය වන මහ නගර සභා ආඥාපනතේ 238 වන වගන්තියේ (1) උප වගන්තියෙන් නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වැලිගම නගර සභා බල ප්‍රදේශය ඇතුළත සියලුම නිවාසවල ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2019 වර්ෂයේ වාර්ෂික වටිනාකම, 2020 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමටත්,

(*ආ*) එකී නගර සභා ආඥාපනතේ 160 වන වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකමෙන් නේවාසික ස්ථාන මත සියයට අටක (8%) වරිපනම් බද්දක් සහ වෙළඳ හෝ වාණිජ කාර්ය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථාන මත සියයට දහයක (10%) වරිපනම් බද්දක් ද 2020 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්,

(*ඇ*) එම වරිපනම් බදු එකී නගර සභා ආඥාපනතේ 170 වන වගන්තිය සමග කියවිය යුතු ඉහත කී මහ නගර සභා ආඥාපනතේ 230 වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන යටතේ එකී වරිපනම් බද්ද 2020 වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් වැලිගම නගර සභාවට ගෙවීමට විධාන කිරීමටත්,

(*ඈ*) 2019 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් බදු 2020 වර්ෂයේ ජනවාරි 31 වැනි දිනට පෙර නගර සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද එක් එක් කාර්තුවට අදාළ වරිපනම් බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනට මත්තෙන් නගර සභාව වෙත ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ; සහ

ඉහත කී ගෙවිය යුතු වරිපනම් බදු මුදල් නොගෙවන අයගෙන් සෑම ව්‍යාපාරික දේපලක් වෙනුවෙන් සියයට විස්සක් (20%) හා අනෙකුත් සෑම ස්ථානයකින්ම සියයට පහලොවක (15%) වරෙන්තු ගාස්තුවක් අයකිරීමට සුදුසු බවට යෝජනා කරමි.

රෙහාන් ඩී. ඩබ්. ජයවික්‍රම,
සභාපති,
වැලිගම නගර සභාව.

2019 ක් වූ සැප්තැම්බර් මස 10 වැනි දින,
වැලිගම නගර සභා කාර්යාලයේ දී ය.

12-756/10

හම්බන්තොට මහා නගර සභාව

2020 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2020 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. ජී. ගාමිණී ශ්‍රී ආනන්ද,
නගරාධිපති (*වැ.බ.*),
හම්බන්තොට මහා නගර සභාව.

2019 සැප්තැම්බර් මස 10 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥපනතේ 238 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් මහා නගර සභා වෙත කරන ලද නියමය ප්‍රකාර හම්බන්තොට මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත හම්බන්තොට නැගෙනහිර හා බටහිර යන ග්‍රාම නිලධාරී කොට්ඨාසවල පවතින සියළුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා කවර වූ හෝ ගෙපත්වල වාර්ෂික තක්සේරු වටිනාකම් වශයෙන් 2019 වර්ෂය සඳහා පිළිගෙන තිබූ වාර්ෂික තක්සේරු වටිනාකම්, 2020 වර්ෂය සඳහා තක්සේරු වටිනාකම් වශයෙන් පිළිගැනීමටත්,

එකී මහා නගර සභා ආඥාපනතේ 230 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් හම්බන්තොට මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත වාර්ෂික වටිනාකමෙන් සියයට දෙළහ (12%) ක වරිපනම් මුදලක් 2020 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්,

252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 238 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් මහා නගර සභා වෙත කරන ලද නියම ප්‍රකාර හම්බන්තොට මහා නගර සභා නව බල ප්‍රදේශය ඇතුළත හම්බන්තොට සිරිබෝපුර, කොහොලංකල, කැලියපුර, මිරිජ්ජවිල හා සාමෝදාගම යන ග්‍රාම නිලධාරී කොට්ඨාශවල පවතික සියළුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා කවර වූ හෝ ගෙපත්වල වාර්ෂික තක්සේරු වටිනාකම් වශයෙන් රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් ලබා දී ඇති වාර්ෂික තක්සේරු වටිනාකම්, 2020 වර්ෂය සඳහා තක්සේරු වටිනාකම් වශයෙන් පිළිගැනීමටත්,

එකී මහා නගර සභා ආඥාපනතේ 230 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් හම්බන්තොට මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත වාර්ෂික වටිනාකමෙන්,

වාණිජ දේපළ සඳහා - සියයට හත (7%)
රජයේ දේපළ සඳහා - සියයට හත (7%)
නේවාසික දේපළ සඳහා - සියයට හත (5%)

අනුව වරිපනම් මුදලක් 2020 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්,

2020 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2020 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දින හෝ එදිනට පෙර හම්බන්තොට මහා නගර සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් මුදල් ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද, එක් එක් කාර්තුවට අදළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දින හෝ එදිනට මත්තෙන් හම්බන්තොට මහා නගර සභාවට ගෙවනු ලැබුවහොත් ඒ එක් එක් කාර්තුවේ වරිපනම් ප්‍රමාණයෙන් සියයට පහ (5%) ක වට්ටමක් ද, ලබාදීමටත් සහ

